# හංස සන්දේශය.

විද්‍යාලඞ්කාර පරිවෙණාධිපති

පූජ්‍යචාර්ය්‍ය

රත්මලානේ

ධර්මකීර්ත්ති ශ්‍රීධර්මාරාමාභිධාන

කොළඹ හැලාවත දෙදියාවේ

ප්‍රධාන නායකස්වාමිපාදයන්වහන්සේ

විසින් ලියනලද

අභිනවපදාර්ථ සන්නයෙන්

උපලක්ෂිතයි.

ඉ. ඩී. ඇස්. ගුණරත්න මුහන්දිරම්

වන මා විසින්

කොල්ලුපිටියේ යන්ත්‍රාලයෙහි

අච්චුගස්වනලදී.

1902.

# හංස සන්දේශය.

විද්‍යාලඞ්කාර පරිවෙණාධිපති

පූජ්‍යාචාර්ය්‍ය

රත්මලානේ

## ධර්මකීර්ත්ති ශ්‍රීධර්මාරාමාභිධාන

කොළඹ හලාවත දෙදිසාවේ

**ප්‍රධාන නායකස්වාමිපාදයන්වහන්සේ**

විසින් ලියනලද

**අභිනවපදාර්ථ සන්නයෙන්**

උපලක්ෂිතයි.

**ඉ. ඩී. ඇස් ගුණරත්න මුහන්දිරම්**

වන මා විසින්

කොල්ලුපිටියේ යන්ත්‍රාලයෙහි

අච්චුගස්වනලදී.

1902.

# සංඥාපනය.

හංසසන්දේශ* නම්ලද මේ ස්වභාෂාදූතකාව්‍යය මධුරකොමල සුලලිතපදවලින්යුක්ත සන්ධිශුද්ධියෙන් හා අර්ධභ්‍රමගොමූත්‍රිකාදි චිත්‍රබන්ධනයෙන්ද සැදුම්ලද කවිවර සම්භාවනීය මහාර්ඝරචනාවකි, මීට සන්නයක්හෝ ගැටපදවිවරණයක්හෝ නොපැවතිහෙයින්ද පෙළපොත පවා දුර්ලභහෙයින්ද ලැබෙනතාක් පොත් බොහෝසේ ලිපිදෙසින් දූෂිතහෙයින්ද සමහර පොත්හි අවසානපද්‍යපවා නොපැනෙනහෙයින්ද මෙකල අභාවිතප්‍රාය බවට පැමිණියේය. මේකාව්‍යයෙන් ලැබියහැකි විපුල ප්‍රයෝජනය අධුනිකයන්ට අත්පත්කරදෙනු කැමති නෙක භාෂාන්තරප්‍රවීණ ලඞ්කාආණ්ඩුවේ ප්‍රධාන භාෂාපරිවර්ත්තකධුරන්ධර සයිමන් ද සිල්වා වාසල මුදලි මන්ත්‍රීශ්වරයාණන් විසින් ආරාධිතවූ අපි මේ පදපීව්‍යාඛ්‍යානය ලීමු.

මේ කාව්‍යනිර්මාණය ශ්‍රී බුද්ධවර්ෂ 1958 වන්නෙහි (ක්‍රි. ව. 1415 දී) සිරිලක රජපැමිණි ජයවර්ධනපුර වරාධිවාසි ශ්‍රීසඞ්ඝබොධි ශ්‍රීපරාක්‍රමබාහු. මහරජාණන්ගේ රාජ්‍යකාලයවූ දෙපනස්හවුරුද්දතුළ පූර්වභාගයෙහි වියයි සලකමු.

කර්තෘනාමය මෙහි අනිර්දිෂ්ටයි. මුඛපරම්පරා වශයෙන් මෙහි කර්තෘහු වීදාගම මෛත්‍රෙය මහාස්ථවිරයෝයයි ශ්‍රූයමාණ වේ.

---

* තිසරසන්දේශ නාමයද මීට ව්‍යවහාර නමුත් එනමින් අනිත් සන්දේශයකුදු ඇතිහෙයින් මෙහි අව්‍යවහෘතයි.

මේ කාව්‍යයට සම්ප්‍රදානවූ වනරතන මහාස්වාමි පාදයෝ නම් මේ දක්වාත් ශාසනික ප්‍රකරණයන්හි ප්‍රතිබිම්බිත යශෝමූර්ති ඇති ලඞ්කාශාසනශ්‍රීභාර ධාරී පුරාතන සඞ්ඝරාජෝත්තම කෙනෙකි. මූන් වහන්සේගේ ගුණකීර්ත්තනය මේ කාව්‍යයෙහිම විශෙෂයෙන් ප්‍රකාශිතහෙයින් මෙහි අපවිසින් කට ශ්‍රුතනොවේ. ශ්‍රී බුද්ධවර්ෂ 1894 පටන් 1968 දක්වා අතර දීර්ඝකාලයෙක්හි මූන්වහන්සේගේ ප්‍රමුඛත්‍ව යෙන් ශාසනාභිවෘද්ධි සිදුවූසේ පුරාවෘත්ත ලිපිවලින් සැලකියහැකිවේ. විශෙෂ වශයෙන් නිකාය සඞ්ග්‍රහයෙන් හා කෑරගල විහාරයෙහි පවත්නා ශිලාලෙඛනයෙන්ද මේ ප්‍රතීයමාන වේ. රහත්කාල යෙන් පසු බෞද්ධ මහරජුන්විසින් පවරනුලබන ශාසනික මහොත්තම පදවිය නම් 'මහාස්වාමි' (මාහිමි) පදවියයි හෙවත් සඞ්ඝරාජධුරයයි. මේ උතුම් ධුරය තොටගමුවේ ශ්‍රීරාහුල ස්වාමිපාදයන්ට පත්වූයේ වනරතන මහාස්වාමීන්ගේ ඇවෑමෙනි. මෙසේහෙයින් මේ සන්දෙශය සැළලිහිණිසන්දෙශා දියටත් පළමුව විරචිතයයි හැඟේ.

ශ්‍රීරාජගුරු වනරතන මහාස්වාමීන් වැඩවිසූ කෑර ගල පදුමවතිපිරිවෙන නම්වූ රජමහවිහාරය ප්‍රති කාල් ආණ්ඩුකාලයෙහි අනාවාසත්වයට පැමිණි තැන් පටන් මේ සමීපකාලය වනතුරු අවුරුදු සිය ගණනක් මුළුල්ලෙහි නටබුන්ව පැවැත්තේ අප ආචාර්‍යෝත්තමවූ විද්‍යාලඞ්කාරපරිවෙණාධිපති පණ්ඩිතාචාර්‍ය රත්මලානේ ශ්‍රීධර්මාලොකාභිධාන මහාස්ථවිර ස්වාමිපාදයන්වහන්සේගේ අනුශාස නත්වය ලත් කෑරගල පේරුවේ ගම්අටෙහි සහ අසල්ගම්හිද වසන බොහෝ බෞද්ධ සමූහයා විසින් ශ්‍රී බුද්ධවර්ෂයෙන් 2422 වන්නෙහිදී ප්‍රකෘතිභාවයට පමුණුවන්ට පටන්ගන්නාලදින් මෙකල්හි විහා

රඞ්ගයෙන් අනූනව ශොභමානවූ විහාරස්ථානයක්ව පවත්නේය. ඒ මේ විහාරයාගේ ප්‍රතිසංස්කාරණයටද මෙම සන්දේශකාව්‍යය පිටුවහල් විය. එහි පෙර පැවති තොරතුරු මේ සන්දේශ කාව්‍යයෙන් දුටුඇසූ බෞද්ධ සත්පුරුෂජනයෝ මෙම සඞ්ඝරාජවාස පදුමවතීපරිවෙණමහාවිහාරය අත්‍යන්තාදරයෙන් සලකා යථා ශක්තීන් වර්ධනයකරත්වා වන්න.

ශ්‍රීරාජගුරු වනරතන සඞ්ඝරාජෝත්තමයන්වහන්සේගේ වංශකීත්තනය පිණිස යොදනලද 183 වන දසපද සැහැලි කාවෙහි ලිපිදෙසින් දූෂිතව තුබූ අභිධානයන්ගේ ශුද්ධිය පෙරකී ශිලාලෙඛනයටද අනුව සංලක්ෂිතයි.

**Dhamakirti Sri Dhamarama.**

*High Priest*

Vidyalankara College

*Kelaniya*

*29th October 1902.*

# ශුද්ධි පත්‍රය.

| පිට. | පෙළ. | අශුද්ධ | ශුද්ධ. |
|---|---|---|---|
| 3 | 25 | මිණි | මිණි |
| 4 | 19 | රැකියව | රැකියාව |
| ,, | 24 | වැදී | වැදි |
| 6 | 11 | සංවඪීතවූ; | සංවඝීතවූ; |
| 7 | 7 | පෘවජනය | ප්‍රවජනය |
| ,, | 9 | සමුල | සමූල |
| ,, | 13 | නිර්මිත | නිර්මිත |
| ,, | 32 | ද්‍රැමයක් | ද්‍රැමයක් |
| 8 | 5 | මිතුරුතුම | 11 මිතුරුතුම |
| ,, | 9 | මිතුරුතුම, | 11 මිතුරුතුම, |
| ,, | 21 | 11 | 12 |
| ,, | 25 | 11 | 12 |
| ,, | ,, | ශ්‍රීබුඩය; | ශ්‍රීබුධය |
| 9 | 3 | 12 | 13 |
| ,, | 7 | 12 | 13 |
| ,, | 12 | සප්ටික | ස්ඵටික |
| ,, | 13 | සීත | සීත |
| ,, | 19 | බිගු | බිඟු |
| 10 | 29 | සැඩ | සැඩ |
| 15 | 23 | ලම්බා | ලම්බා |
| ,, | 29 | විජෘම්භමාන | විජෘම්භමාණ |
| 19 | 24 | බඩගය | බඩගය |
| 20 | 5 | වදිනට | විදිනට |
| ,, | 18 | වෙන් | මෙන් |
| ,, | 23 | යන්ගේමයෑ | යන්තෝමයෑ |
| 21 | 10 | බඩගය | බඩගය |
| 22 | 14 | බඩග | බඩග |
| ,, | 19 | බුජ | රජ |

| පිට. | පෙළ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 24 | 14 | පෙරදිගට | උදයගට |
| 25 | 28 | නිඃශඞ්කතාවූ; | නිඃශඞ්කිතාවූ; |
| 27 | •10 | නොවන්නාවූ; | නොවන්නාවූ; බලැති, |
| 28 | 28 | වරුත් | වරත් [බලවත්වූ; |
| 29 | 4 | වරෑත් | වරත් |
| ,, | 12 | මිත්‍රය; | මිත්‍රය; |
| ,, | 13 | ප්‍රවිෂ්ටවූ; | ප්‍රවිෂ්ටවූ; |
| 37 | 19 | කුණින්, | කුණෙන්, |
| 38 | 30 | උජ්ව | උජ්ජ්ව |
| 39 | 13 | වණිග් | වණිය් |
| 43 | 8 | රුලි | රුළි |
| ,, | 15 | ජලාභ්‍යන්තර | ජලාභ්‍යන්තර |
| ,, | 28 | තත්යි | තත්ති |
| 45 | 1 | මූණි | මුනි |
| 47 | 24 සහ 25 | මඤ්ජිරයෙහි | මඤ්ජීරයෙහි |
| 48 | 9 | නෙත්‍රයෙන් | නෙත්‍රයෙන් |
| ,, | 19 | සොමිරුස්, | සොම්රුස්, |
| 49 | 8 | සඞ්ඝටිත | සඞ්ඝට්ටිත |
| ,, | 10 | පඞ්ක්ති | පඞ්ක්ති |
| :, | 27 | කිපි | කිපි |
| 50 | 6 | යෂ්ටින් | යෂ්ටීන් |
| ,, | 20 | වතුර, | වතුර |
| 51 | 18 | සෞත්‍රමාණයාවූ; | සෞත්‍රායමාණවූ; |
| 52 | 2 | ශ්‍රීලඞ්කා | ශ්‍රීලඞ්කා |
| 53 | 11 | වෙන්, වෙන් | වෙන්වෙන් |
| 54 | 8 | ගනකුලෙහි, | ගනකුලෙහි, |
| 55 | 28 | මෙසිරිලක | මෙමසිරිලක |
| ,, | ,, | සතින් | සතිනි |
| 56 | 8 | මෙසියල් | මෙමසියල් |
| ,, | ,, | මේ | මෙම |
| 57 | 6 | සිරීන් | සිරින් |
| ,, | 14 | කානනාවන් | කානනාවන් |

| පිට. | පෙළ. | අශුධි. | ශුධි. |
|---|---|---|---|
| 57 | 20 | හා සම්ඟ; | හා සමඟ; |
| 58 | 22 | ත්‍රිලක්‍ෂණය; | ත්‍රිලක්‍ෂණය; |
| ,, | 29 | වඩබාගනිශෙන්; | වඩබාගනියෙන්; |
| 59 | 9 | ගිරී | ගිරි |
| ,, | 28 | (ෙවතානඛාණ) | (වෛතානඛාණ) |
| 60 | 3 | කලාන පූර්ණරශෙන්; | කලානණිපූරයෙන්; |
| ,, | 23 | ලයාජීත ගිතිකා | ලයාජීත ගීතිකා |
| ,, | 25 | විතතායෙන්; | වීතතයන්; |
| 69 | 27 | රජිතවූ; | රජිතවූ; |
| 73 | 8 | චේ. | වේ. |
| 76 | 4 | ප්‍රතිඥීත | ප්‍රතිඥිත |
| ,, | 11 | පූජ | පූජ |
| ,, | 17 | විට | වීට |
| 78 | 26 | හිතාධානශයෙන්; | හිතාධානශයෙන්; |
| 79 | 6 | දපමිණ, | දපමින, |
| ,, | 29 | නිතිශෙනි | නිතියෙනි |
| 81 | 5 | ගුරුන්, | ගුරුන්, |
| ,, | 19 | නිඃශබ්ධකී | නිඃශබ්ධකී |
| 83 | 16 | පෙළදම් | පෙළදම් |
| ,, | 19 | වන්නාවූ; | වන්නාවූ; |
| 85 | 4 | විචිත්‍රවූ; | විචිත්‍රවූ; |
| 91 | 2 | බැවින්; | බැවින්; |
| ,, | ,, | (අනිකකෑ) | (අනිකතු) |
| 92 | 15 | නීමාව | නිමාව |
| 94 | 12 | පැමිණී, | පැමිණී, |
| 96 | 5 | විහිෂණ | විභීෂණ |

තවද 70 පිටේ 145 වෙනි කවිය නිමවූ තැන "ගොමූත්‍රිකා" යනුද යොදගතයුතු.

# හංස සන්දේශය.

1 සැරද හසරදසඳ—පුන්සඳපහන්පිරිසුදු
පියකරු පියන් පිරි—පියවුරුලෙසින් හොබනා.

1 ශ්‍රීලඞ්කාධිපති ජයවර්ධනපුරප්‍රවරනිවාසීවූ ශ්‍රීසඞ්ඝබොධි ශ්‍රීපරාක්‍රමබාහු මහාරාජෝත්තමයාණන්ගේ නිරුපද්‍රවරාජ්‍ය පරිපාලනය චිරස්ථායිවනු සඳහා ස්වකීය සමයානුකූල සෙත් පිරිත් සලසාවදළ මැනවැයි සකලලඞ්කාශාසනශ්‍රීභාරධාරීවූ කැරගල පද්මාවතීපරිවෙණාධිපති ශ්‍රීරාජගුරුවනරතන [සඞ්ඝරාජ]මාහිමියන්වහන්සේට අයදුම්කරවීම කථාශරීර කොටගෙන රාජහංසපක්ෂියකු දූතක්‍රියායෙහි යොදලන ලෙසින් සාරස්වතාලඞ්කාරයුක්ත දූතකාව්‍යලක්‍ෂණයෙන් යුක්ත ස්වභාෂා කාව්‍යසන්දේශයක් ප්‍රාරිප්සිතවූ ආචාර්යපාදයෝ "ආශීර්නමස්ක්‍රියා වස්තුනිර්දේශො වාපි තන්මුඛම්" යන අලඞ්කාරශාස්ත්‍රානීය පරිද්දෙන් ආශිස්, නමස්ක්‍රියා, වස්තුනිර්දේශ, සඞ්ඛ්‍යාත ත්‍රිවිධ කාව්‍යමුඛයන් අතුරෙන් ආශීර්වාද පුරස්සර කොට කාව්‍යාරම්භය කරන්නෝ "සැරදහසරදසඳ" යනාදි මේ ප්‍රාරම්භපද්‍ය මුක්තකකාව්‍යාත්මක කොට රචනා කළහ. මෙයින්-

"රූපං හාරි මනොහරා සහචරී පානාය පාථ්‍යං මධු
ක්‍රීඩා වාප්‍යු සරෝරුහෙෂු වසතිශ්ශෝනාශාං රජෝ මණ්ඩනම්
වෘත්තිඃ ස්වාදුමතා බිසෙන සුහෘදස්චාරුස්වනාඃ ෂට්පදාඃ
සෙවා දෛන්‍යවිමානතාවිරහිතො හංසඃ සුඛං ජීවති"

, යනාදීන් කවිජනවර්ණනීය ප්‍රාකෘතගුණවිශෙෂ ඇති රාජහංසොත්තමයාගේ මනහරවූ රූපසෞන්දර්යයයිය වර්ණ සංස්ථානවිසින් උපමානුප්‍රාණිත ස්වාභාවිකාලඞ්කාරයෙන් කීර්තනය කළහ. යනු මෙහි සමුදායාර්ථයි.

ඉක්බිති පදාර්ථනිරූපණය කරනු ලැබේ.

"හසරදසඳ සැරද" යනු මෙහි ක්‍රියාකාරක පදසම්බන්ධයි. හසරදසඳ, හංසරාජෝත්තමය; (ඥුණවත්තෙම;) සැරද, චිර කාලයක් ජීවත් ව; කෙබඳු හංසරාජෝත්තමයෙක්ද යත්?

පුන්සඳපහන්පිරිසුදු—පුන්සඳ, පූර්ණ චන්ද්‍රයාගේ; පහන්, ප්‍රභාව මෙන්; පිරිසුදු, පරිශුද්ධවූ (ප්‍රභා ඇති;) පියකරු පියන්—පියකරු, ප්‍රියකරවූ; පියන්, ප්‍රියාවන්ගේ; පියවුරු ලෙසින්, පයොධරාකාරයෙන්; සොබනා, ශොභමානවූ; හස රදසඳ, හංසරාජෝත්තමය; සැරද, චිරකාලයක් ජීවත් ව; හෙවත් දීර්ඝායුෂශ්‍රියක් විඳිනය කර. ,

මෙසේ යහගිවිඃතායෙන් රාජහංසපක්ෂීහුගේ මනොඥ රූපසෞන්දර්යය වර්ණනාකොට දූතව්‍යාපාරෝද්‍යමානවූ ඔහට ආශීර්වාදාවරණයද සලස්වා යළිත් දූතගුණසම්පත්තියම වෙසෙසින් කිත්තනය කරන්නාහු "සැප සැපයෙයි" යනාදි උප ජාති දසපද සැහැල්ල කීහු.

2 සැප සැපයෙයි ලොවට—තොප තෙපලකින් හසරද *
තොප තුඩ තුළට කිරිරස දිය හැර ව දි ය
තොප පිට පිහිට කැරු බඹතෙදිය ඇවි දි ය
තොප රුව ලත් හසයන්—සත සැපත රුකා සැප දේ
තොප උන් මැඹට පිටදී විදි සැර ස තා ර
තොප ගෙන එති යෙති දිව බිමගෙන අ තා ර
තොප නම ඉදිරිකළ නමටත් උතුම යෙ ති
තොප තුල රුගෙන මහසත්හුද හිරුදීන ති
තොප සැටි රුගෙන සිත්තැනටත් කොරෙතිරු ති
තොප වෙත මිතුර ඉන් අප සිත වැඩෙයි බැ ති

2 හසරද, හංසරාජය; තොප, ගුණවත්හුගේ; තෙපලකින්, වචනයෙකින්; ලොවට, ලොකයාහට; සැප, සෞඛ්‍යය; සැප යෙයි, † සම්පාදිත වෙයි; තොප, ගුණවත්හුගේ; තුඩ තුළට, තුණ්ඩාභ්‍යන්තරයට; කිරිරස, ක්ෂීරරසය තෙම; දිය හැර, ජලය

* "රදහස" ඇතම් පොත්හි.
† 'සැප සැපවෙයි'යන පාඨයෙහි "මහත් සෞඛ්‍යයෙක් වෙයි" කියා අර්ථ ගතයුතු.

වර්ජිතකොට හෙවත් දියෙන් තොරවූ; වදිය, ප්‍රවේශවෙයි; තොප, ගුණවත්හුගේ; පිට, පෘෂ්ඨය; පිහිට කැරැ, ප්‍රතිෂ්ඨා (ආධාර) කොටගෙන, බඹ, බ්‍රහ්ම තෙම; තෙදිය, ජනත්‍රයෙහි; ඇවිදිය, සංචාරය කෙරෙයි; තොප, ගුණවත්හුගේ; රුව, රූපය; ලත්, ලද්දවූ; හසත්, ලාංඡනයත්; හෙවත් රාජකීය හංසමුද්‍රාවත්; සත, සත්වයන්ගේ; සැපත රැක, සම්පත් රක්ෂණය කොට; සැප දේ, සෞඛ්‍ය දානය කෙරෙයි; තොප, ගුණමත්හු; උත්, උපවිෂ්ටවූ; වැඹට, ස්තම්භයට; පිටදී, පෘෂ්ඨ දානයකොට; විදි, විධවූ (සතරදිශාවට විදුනාලද්දවූ); සැර සතර, ශරචතුෂ්ටය; බිම්හෙන අතර, භූමියෙහි පතිතවන අන්තරයෙහි; හෙවත් බිම වැටෙන කල්හිම; තොප, ගුණවත් හුගේ; (බන්ධුහු); දිව, ධාවනයකොට; ගෙන එති, ග්‍රහණය කොට එත්යයි; යෙති, කථනය කෙරෙති—

තොප නම, ගුණවත්හුගේ නාමය (හංස ශබ්දය); ඉදිරි කල, අභිමුඛකලකල්හි; හෙවත් පරකොට යොදනලද කල්හි; නමවත්, (ඒ පූර්වපදවූ) නාමයටත්; උතුම යෙති, උත්තමයයි කියති; තොප කුල, ගුණමත්හුගේ වංශය; රැගෙන, ග්‍රහණය කොට; හෙවත් ජවනහංසයොනියෙහි ඉපිද; මහ සත්හුද, මහා බොධිසත්වයෝද; හිරු දිනති, (ගමනවේගයෙන්) සූර්යයා පරදවති; තොප සැටි, ගුණවත්හුගේ ආකාරය; රැගෙන සිටි, ග්‍රහණය කොට සිටියාවූ; තැනටත්, ස්ථානයටත්, රුති කෙරෙති, රුචිය කෙරෙත්; මිතුර, මිත්‍රය; දුන්, එහෙයින්; තොප වෙත, ගුණවත්හු කෙරෙහි; අප සිත, අසමතුන්ගේ සිත්හි; බැති, භක්තියොවේ; වැඩෙයි, වර්ධනවේ.

3 ව න ක ල ගොදුරු මරකතමිණි මියුරු ලෙ ස
බොනකල පොකුරු මී ඉද පිපි පියුම් හි ස
ය න ක ල ගමන් ඊවිසඳ පසුකර අහ ස
ම න ක ල මිතුර තොප යස පවසමි කොලෙ ස

3 මනකල මිතුර, මනඃකලාවූ මිත්‍රය; මරකතමිණි, මරකත මාණික්‍යයන්; මියුරු ලෙස, මධුරාකාරයෙන්; හෙවත් මධුරාහාරයක් පරිද්දෙන්; ගොදුරුවනකල, (ගුණවත්හට) ගොචරවනකල්හි; පිපි, පුෂ්පිතවූ; පියුම් හිස, පද්මයන්ගේ

මසතකයෙහි; ඉඳ, උපවිෂ්ටව; පොකුරු මී, පුෂ්කර මධුව; බොනකල, (යුෂ්මත්හු) පානය කරන කල්හි; පිවිසඳ, රවි සඳු දෙදෙනා; පසුකර, පරාභූතකොට; අහස, ආකාශයෙහි; ගමන් යනකල, (යුෂ්මත්හු) ගමනයකරනකල්හි; තොප යස, යුෂ්මත්හුගේ යශස; කෙලෙස, කවර ආකාරයෙකින්; පවසම්, ප්‍රකාශ කෙරෙම්ද ?

4 මෙ ති න් නොගෙන උන්ගෙන් වන අයාප තා
ග ති න් ගෙන දිදී රන්වන් පි යාප තා
නි ති න් සියන් රැකියව සිට ද යාප තා
සි ති න් සිතන්ටත් බැරි මෙතොප යාප තා

4 උන්ගෙන්, (සුවර්ණ හංස ජාතකයෙහි ප්‍රකාශවූ භාගසිරා දුහිතෘ සඞ්ඛ්‍යාත) ඔවුන්ගෙන්; වන, වන්නාවූ; අයාපත, අසාධූර්‍යය හෙවත් පීඩාව; මෙතින්, මෛත්‍රිය කරණකොටගෙන; නොගෙන, ග්‍රහණය නොකොට හෙවත් නොසලකා; ගතින්, ගාත්‍රයෙන් (ස්වකීය ශරීරයෙන්); රන්වන්, සුවර්ණ වර්ණවූ හෝ සුවර්ණමයවූ; පියාපත, පක්ෂපත්‍රයන්; ගෙන, ග්‍රහණය කොට (ගලවාගෙන); දිදී; දානය කොට කොට; දයාපත, දයාපාත්‍ර (වූ); සිට, ස්ථිතවූ; නිතින්, නිරන්තරයෙන්; සියන්, ස්වකීයයන් (බන්ධූන්); රැකියව, රක්ෂා කෙළෙහිය; (එහෙයින්;) මෙතොප, මේ යුෂ්මතුන්ගේ; යාපත, සාධුගුණය; සිතින්, චිත්තයෙන්; සිතන්ටත්, චින්තනය කරන්ටත්; බැරි, භාරයි; චින්තාවිෂයාතික්‍රාන්තයෑ සිතේසි.

5 බැඳි මලෙසි උන් රජු වෙතම පෙම් බැ ඳි
මි දී නොගිය හස දැක වැදී මලෙන් මි දී
ලැදී එගුණ බඹදත් රජ රජෙන් පි දී
නු දී දහම් තොප වෙත වැ තිර පුදල දී

5 මලෙසි, පාශයෙහි; බැඳි, බඳ වූ; උන්, උපවිෂ්ටවූ; රජු වෙතම, [ධෘතරාෂ්ට්‍රහංස]රජයා කෙරෙහිම; පෙම්බැඳි, ප්‍රෙමයෙන් බඳවූ; මිදී නොගිය, මුක්තව ප්‍රයාණය නොකළාවූ; හස, [සුමුඛනම් සෙනාපති] හංසයා; දැක, දර්ශනය කොට; වැදී, (ඛෙමනම්) වෘධතෙම; මලෙන්, පාශයෙන්; මිදී, (හංසයා

ජයා) මුඛ්‍යත්‍යකාලේය; එගුණ, ඒ (සත්පුරුෂ) ගුණයට: ලැදී, පාක්ෂිකවූ [ප්‍රමුදිතවූ]; බඹදත් රජ, බ්‍රහ්මදත්ත නරේන්ද්‍ර තෙම; රජෙන්, රාජ්‍යයෙන්; පිදී, පූජනීය කෙළේය; තොප වෙත, ශුෂ්මතුන් කෙරෙහි; වැතිර, වන්දනාවූ; හුදීදහම්, හුසීධර්මය (සත්පුරුෂධර්මය) තෙම: පුදලදී; පූජා ලද්දේය—මේ වනාහි මහාහංසජාතකාගත පූර්වවෘත්තනිදර්ශනයි.

6 මෙලෙසින් දියතා පරසිදු ඉටු මිතුරු ස ද
අ හ සි න් පැමිණි විසිතුරු සිතුමිණක් ලෙ ද
වි ල සි න් මෙතොප ලදුයෙමි පිනකින් මෙස ද
එ බැ වි න් තොපට පවසන අස්නෙක සබ ද

6 මෙලෙසින්, මේ (උක්ත) ප්‍රකාරයෙන්; දියත, ජගත්හි පරසිඳු, ප්‍රසිද්ධවූ; ඉටු මිතුරු සඳ, ඉෂ්ටමිත්‍රොත්තමය; අහසින් පැමිණි, ආකාශයෙන් ප්‍රාප්තවූ; විසිතුරු, විචිත්‍රවූ; සිතුමිණක් ලෙද, චින්තාමාණික්‍යයක් මෙන්; විලසින්, (දෘශ්‍යමාන) විලාසයෙන් යුක්තවූ; මෙතොප, මේ ශුෂ්මත්හු; පිනකින්, පුණ්‍යයක් හෙතුකොටගෙන; මෙසඳ, මේ කාලයෙහි: ලදු යෙමි, ලද්දෙමි; සබඳ, මිත්‍රය; එබැවින්, තද්භාවයෙන්; තොපට, ශුෂ්මත්හට; පවසන, (අප විසින්) ප්‍රකාශ කරනු ලබන්නාවූ: අස්නෙක, සන්දේශයෙක් (ඇති).

7 අ ද රවැ අසාගෙන ලෝවැඩ අදහ සි නි
හ් ද තුළ තබා රැක ලද නිදනක් ලෙ සි නි
ම ද ලස නොවී මෙපුරෙන් ගොස් අප බ සි නි
එ ද තොප විසින් පැවසිය යුතුවෙයි තො සි නි

7 ලෝවැඩ අදහසිනි, ලොකාර්ථ චින්තායෙන්; අදරවැ, ආදරයුක්තවූ; අසාගෙන, [එය] ශ්‍රවණය කොටගෙන; හිද තුළ, හෘදයාභ්‍යන්තරයෙහි; තබා, ස්ථාපනය කොට; ලද, ප්‍රතිලබ්ධවූ; නිදනක් ලෙසිනි, නිධානයක් පරිද්දෙන්; රැක, රක්ෂාකොට; මදලසනොවී, ක්‍රියාමාන්ද්‍යයෙන් හා ආලස්‍යයෙන් යුක්තනොවූ; මෙපුරෙන්, මේ පුරයෙන්; ගොස්, ගමනය කොට; අප බසිනි, අපගේ වචනයෙන්; එද, ඒ සන්දේශයද; තොප විසිනි, ශුෂ්මත්හු විසින්; තොසිනි, සන්තොෂයෙන් (යුක්තවූ); පැවසියයුතු වෙයි, ප්‍රකාශකටයුතු වේ.

8 දි නූ බිම මහිම ඇති මුනි මා ර බ ල
වැ නූ තැනක්වැනි සත පින් සා ර ප ල
තැනූ නොයෙක් කෙත්වත් සරු සා ර ප ල
ද නූ පසිදු වෙහෙරෙක සැදි කෑ ර ග ල

8 මුනි, (අප) ශාක්‍යමුනීන්ද්‍රයන්වහන්සේ විසින්; මාරබල, මාරසේනාව; දිනූ, පැරදවූ [ජයග්‍රහණය කළාවූ]; බිම, භූමියෙහි; මහිම, විභූතිමහත්ත්වය; ඇති, විද්‍යමානවූ; හෙවත් ජයමහාබෝධිභූමියෙහිමෙන් පිහිටි ශ්‍රීවිභූතිමහිමය ඇත්තාවූ; සත, සත්ත්වයන්ගේ, පින්, පුණ්‍යයන් සම්බන්ධිවූ; සාරපල, සාරවූ විපාකඵලය; වැනූ තැනක් වැනි, විස්තීර්ණකළ ස්ථානයක් බඳුවූ; සාරපල, සාරවූ ඵලඇති; තැනූ, සංවර්ධිතවූ; නොයෙක් කෙත්වත්, අනේක ක්ෂේත්‍රවාස්තූන්ගෙන්; සරු සාරවූ; කෑරගල, එනම් පර්වතාභිධානයෙන් ව්‍යවහෘතවූ ග්‍රාමයෙහි; සැදි, (සකල විහාරාඞ්ගයෙන්) සජ්ජිතවූ; පසිදු, (පඨමවතී පිරුවන් නමින්) ප්‍රසිද්ධවූ; වෙහෙරෙක, විහාරයෙක් (ඇත්තේය); දනූ, (එය) ජනනය කර.

9 පුල් සැදි කමල් විල්—මල්වතු දිමුතු එවෙහෙ ර
දැක දැක දෙලෝ වැඩ පවසනා අ මා ලෙසි න්
ලක එක මගුල් ගෙයසේ කළ තා මා බසි න්
පෙරළුරුවර නුදුටු—ගැඹුරු තැන් දුටු සතාරෙ ගි
ඈ සූ සගන සළිටිකා කරන ලෙ ස
දෙ සූ අසන තැන් සැක තැන් මුලින් පි ස
නිතිවන රත්න රුවන් සගුරුවන් ඇ ති
නිතිවන රත්න දිදුලෙන් මොක් මගන තැ ති
නිතිවන රත්න දෙව් රජ කුල රුක පැව ති
නිතිවන රත්න මානිමි ගිම්සඳ පව ති

9 පුල්, ඵුල්ලව; සැදි, සජ්ජිතවූ; කමල්විල්, පද්මතඩාගයෙන් හා; මල්වතු, පුෂ්පාරාමයන්ගෙන්; දිමුතු, දීප්තිමත්වූ; එවෙහෙර, ඒ විහාරයෙහි; දෙලෝ වැඩ, උභයලෝකාර්ථ වෘද්ධි කාරණයන්; දැක දැක, දර්ශනය කොට කොට; අමා

ලෙසින්, අමෘතයන් මෙන්; පවසන, ප්‍රකාශ කරන්නාවූ; තමා බසින්, තමන්වහන්සේගේ වචනයන්; ලක, ලංකාද්වීපය; එක මඟුල් ගෙයසේ කළ, එකම මංගලගෘහයක් වැනි කළාවූ; සතරෙහි, ශාස්ත්‍රයෙහි; පෙරදුරුවර, පූර්වාචාර්යවරයන් විසින්, නුදුටු, දර්ශනය නොකරනලද්දාවූ; ගැඹුරුතැන්, ගම්භීර ස්ථානයන්; දුටු, (ප්‍රඥාචක්ෂුසින්) දර්ශනය කළාවූ; ඇසූසතන, ප්‍රතිභාවර්ජනය කළාවූ යතිසමූහයන්ගේ; සැකතැන්, සංශය ස්ථානයන්; මුලින් පිස, සමූලඝාතය කොට; අසනතැන්, ප්‍රශ්න ස්ථානයන්; යළි ටිකා කරනලෙස, අනුටිකා කරන්නාක්මෙන්; දෙසූ, (විස්තරකොට) කථනය කළාවූ; නිති, අවිච්ඡින්න ප්‍රවෘත්තවූ; වනරත්න, විනය ශික්ෂා නමැති රත්නයෙන් (නිර්මිතවූ); රුවන්, රූපයන් වැනි; සඟුරුවන් ඇති, ශ්‍රේෂ්ඨ යති සමූහයා ඇත්තාවූ; වනරත්න දිදුලෙන්, [සංවරාදි] විනය නමැති මාණික්‍ය දීප්තියෙන්; නිති, නිත්‍යයෙන්; මොක්, මෝක්ෂ සුඛය; මගන තැති, මාර්ගණය (සෙවීම) කරන උත්සාහ ඇත්තාවූ: නිති, නිරන්තරයෙන්; වනරත්න දෙව් රජකුල, වනරතන නම් ක්ෂත්‍රිය රාජකුලය; නොහොත් ශ්‍රේෂ්ඨවූ රාජකුලය; රැක, (අර්ථධර්මානුශාසනයෙන්) සංරක්ෂණය කොට; පැවති, ප්‍රවෘත්තවූ; වනරත්න මාහිමි හිමිසඳ, [ශ්‍රීරාජගුරු] වනරතන සංඝරාජ ස්වාමීන්ද්‍ර තෙම; නිති, අනවරතයෙන්; පවති, ප්‍රවෘත්තවේ; හෙවත් වැඩවාසය කෙරේ.

10 ලොවැති නොමින් සිරිසැපති න් පිරිසාල
කැමැති ලෙසින් දෙනතිලිනෙන් සුරසාල
නොමැති දෙසින් දිසිසසි න් සුවිසාල
එය තිරදුන් දැක මෙඅසු න් පවසාල

10 ලොවැති, ලෝකයෙහි විද්‍යමානවූ; නොමින්, අප්‍රමාණවූ; සිරිසැපතින්, ශ්‍රීසම්පත්තීන්, පිරිසාල, පූර්ණ ගෘහයක් බඳුවූ; කැමැති ලෙසින්, (අර්ථීන්ගේ) අභිලාෂය පරිද්දෙන්; දෙන, දානය කරන්නාවූ; තිලිනෙන්, ත්‍යාගගුණය කරණකොටගෙන; සුරසාල, සුරද්‍රැමයක් බඳුවූ; නොමැති දෙසින්, දෝෂයෙන් විනිර්මුක්තවූ හෙවත් නිර්දෝෂවූ; සුවිසාල, අති

විඛ්‍යාතවූ; යසසින්, කීර්තියෙන් [ප්‍රකටව]; දිසි, දෘශ්‍යමානවූ; යතිරදුන්, ඒ [ශ්‍රීරාජගුරු වනරතනාභිධාන[ යතිරාජයන් වහන්සේ; දුක, දර්ශනය කොට; මෙඅයුන්, මේ සන්දේශය; පවසාල, ප්‍රකාශකර.

මිතුරුතුම හස්න මුනිසැස්න එහිමිහට කියන
සුබහස්නා මතු කියමි පියදස්නා තොප මග පිළි
විස්නා දන විස්මවනලෙසට මෙපුරෙහි පිරි ඉසුරුසර
වනන මාතෙපුල් මිණිකොඩොල් තා සවන් සද.

මිතුරුතුම, මිත්‍රෝත්තමවූ; හස්න, හංසරාජය; එමුනි සස්න හිමිහට, ඒ ජිනශාසනාභ්‍යාවිවූ සංඝරාජයන්වහන්සේට; කියන, ආරොචනය කරනු ලබන්නාවූ; සුබහස්න, ශොභනවූ සන්දේශය; මතු, භවිෂ්‍යත්කාලයෙහි; කියමි, නිවේදනය කෙරෙමි; පියදස්න, ප්‍රියදර්ශනවූ මිත්‍රය; තොප, යුෂ්මත් හුගේ; මග, [ආගමන] මාර්ගය; පිළිවිස්න, ප්‍රතිපෘච්ඡනය කරන්නාවූ; දන, ජනයා; විස්ම වනලෙසට, විස්මිතවන පරිද්දෙන්; මෙපුරෙහි, මේ නගරයෙහි; පිරි, පූර්ණවූ; ඉසුරුසර, ඓශ්වර්ය සාරය; වනන, වර්ණනා කරන්නාවූ; මා තෙපුල්, මාගේ වචන නමැති; මිණිකොඩොල්, මණිකුණ්ඩලයෙන්; තා සවන්, තාගේ කර්ණ යුගලය; සද, සජ්ජිතකර.

## ජයවර්ධනපුර වර්ණනා.

11 සිරිවද්දන සැපතින් දිනූ අල කපුර
රුපුමද්දන කර ජයලත් නොයෙ කවර
බලවද්දන රඳනා සතුරු සැ කහැර
ජයවද්දන පුරනම් මෙය මෙල කතුර

11 සිරිවත්, ශ්‍රීවෘද්ධ:; (ශ්‍රීවෘද්ධිය); දන සැපතින්, ධන සම්පත්තිය කරණකොටගෙන; අලකපුර, (ධනපතීහුගේ) අලකා නම් නගරිය; දිනූ, පරාජිතකළාවූ, නොයෙකවර, අනෙක වාරයෙහි; රුපුමද්දනකර, ශත්‍රුමර්දනය කොට; ජයලත්, ජයග්‍රහණය කළාවූ; බලවත් දන, බලපරාක්‍රමාන්විත ජනයන්; සතුරු සැකහැර, ශත්‍රුශංකා වර්ජිතකොට; රඳනා, රඤ්ජනයකරන්නාවූ [සිත් අලවා වාසයකරන්නාවූ];

මෙය, මේ නගරයතෙම; මෙලකතුර, මේ ශ්‍රීලඞ්කාභ්‍යන්තර යෙහි; ජයවද්දනපුරනම්, ජයවර්ධනපුරය නම්වේ.

12 මෙ ර ම ත ගෙන අලළන සඳ කිරිසයුරු
වෙ ර ළ ත වැද සිටි තුඟු දියකඳ අයුරු
පි රි ය ත සිට බබළයි පිළිමිණි පවුරු
සි රි ව ත මේපුර සරිපුරයෙක් කවරු

12 මෙරමත ගෙන, (විෂ්ණුහු) මෙරුපර්වතය මන්දණ්ඩය කොටගෙන; කිරිසයුර, ක්ෂීරසාගරය; අලළනසඳ, ආලොඩනය කරනකල්හි (කලඹනකල්හි); වෙරළත වැද, වෙලාන්තයෙහි හැපිනාවූ; සිටි, (ප්‍රතිනිවෘත්ත නොව) සිටිනාවූ; තුඟු, උස්වූ; දියකඳ අයුරු, ජලස්කන්ධයාගේ ආකාරයෙන්; පිළිමිණිපවුරු, සප්තරත්නමය ප්‍රාකාරය තෙම; පිරියත සිට, පර්යන්තයෙහි (නගරයාගේ හාත්පස කෙළවරෙහි) සිටිනාවූ; බබළයි, භ්‍රාජමාන වෙයි. සිරිවත, ශ්‍රීවක්ත්‍රය; හෙවත් ශොභාවත් මුඛ ඇත්තාවූ; මේපුර සරි, මේ ජයවර්ධන පුරය හා සමානවූ; පුරයෙක්, අන්‍ය නගරයෙක්; කවරු, කවරේද ?

14 සි රි ස ඳ මෙපුර වඩනා මඟුලට අතු ළු
ම න න ඳ සොඳුරු පියවිලි ලෙසිනි නිකස ළු
පිය න ඳ තිසරවැළ බිඟුරළ කෙළිවත ළු
ඇම ස ඳ දිලෙසී පිපි පඬෙරින් සැදි අග ළු

14 සිරිසඳ, ශ්‍රීකාන්තාවි; මෙපුර, මේ නගරයට; වඩනා, ආගමනය කරන්නාවූ; මඟුලට, මඞ්ගලය පිණිස; අතුළු, ආස්තරණය කරනලද; මනනඳ, මනොනන්දනවූ; සොඳුරු, සුන්දරවූ; පියවිලි ලෙසිනි, පාදපට්ටයක් පරිද්දෙන්; නිකසළු, පවිත්‍රවූ; පියනඳ, ප්‍රියනාද ඇති; තිසරවැළ, හංසාවලියගේද; බිඟුරළ, භෘඞ්ගසමූහයාගේද; කෙළි, ක්‍රීඩාවෙන්; වතළු, විස්තීර්ණවූ; පිපිපඬෙරින්, පුෂ්පිත පුණ්ඩරීකයෙන්; සැදි, සජ්ජිතවූ; අගළු, පරිඛාතොමේ; ඇම සඳ, සියලු කාලයෙහි; දිලෙසී, දීප්තිමත් වේ.

15 අ නැ ත පිරි ඉසුරු සැපතින් වෙම්න් බ ර
අ නැ ත පෙණ මඩුලු පෙළ මැඩෙන එකව ර
ම හ ත ගජන් කන්තල පවනින් පැහැ ර
වි ය ත වැනෙන දදතින් හැම්මෙයි මෙපු ර

15 මෙපුර, මේපුරය තෙම; අනැත, අනන්තවූ; පිරි, පූර්ණවූ; ඉසුරුසැපතින්, ඓශ්වර්‍ය්‍යසම්පත්තියෙන්; බරවෙම්න්, භරිතවෙම්න්; අනැත, අනන්ත නම් නාරජහුගේ; පෙණ මඩුලු පෙළ, ඵණමණ්ඩල පඞ්ක්තිය; එකවර, එක ක්‍ෂණයෙහි; මැඩෙන, මර්දිතවනකල්හි; මහතගජන්, මහා හස්තින්ගේ; කන්තලපවනින්, කර්ණතාලමාරුතයෙන්; පැහැර, ප්‍රහෘත වැ; වියත, ආකාශයෙහි; වැනෙන, චලවන්නාවූ; දදතින්, ධ්වජ නමැති හස්තාග්‍රන් කරණකොටගෙන; හැම්මෙයි, ආලම්බිතවෙයි; යථාස්ථානයෙහි පිහිටා සිටියි සේයි.

16 බි ද ගනඳුරු එළිකරනත් රන් තො ර ණ
ල ද බිසරුව බිය දුරලයි මිණි තො ර ණ
බි ද ගියතැන් හයකුර පහරින් දෙ ර ණ
ම ද පොද ඉස සමතලකොට යෙති ව ර ණ

16 රන්තොරණ, (මේ පුරයෙහි) ස්වර්ණතොරණයන්; ගනඳුරු බිඳ, ඝනාන්ධකාර විධ්වංසනය කොට; එළිකරනත්, (රාත්‍රියෙහි) ආලෝක කරන නමුත්; මිණිතොරණ, (ඉන්ද්‍රනීල) මාණික්‍ය තොරණයතෙම; ලද බිසරුව, තරුණ අභිසාරිකාවන්ගේ; බිය, (ආලෝක) භීතිය; දුරලයි, දූරීභූත කෙරෙයි; වරණ හස්තිහු; හයකුර පහරින්, අශ්වයන්ගේ ක්‍ෂුර ප්‍රහාරයෙන්; දෙරණ, පෘථිවීතලයෙහි; බිඳගිය තැන්, භින්නව ගියාවූ ස්ථානයන්; මදපොද ඉස, මද බින්දුසේචනය කොට; සමතලකොට, සමභූමිකොට, (තැනිතලාකොට); යෙති, ගමනය කෙරෙත්.

17 වු හු වු හයසෙනග කුරරෙන් වැද තිද ස
නි ලු වු වෙතීද්‍යෙ සැඩකාර කර පහ ස
දැ මි වු සතාට නොවදින ලෙසටද්‍යෙ බැ ස
නොපටු වලාකුළු ගිඳුවයි පුර අහ ස

17 භයසෙනග, අශුචසෙනාඛ්‍යය විසින්; වූහුවූ, හරනලද හෙවත් විහිදුවනලද; කුරරෙන්, ක්‍ෂුරධූලින්; වැද, ප්‍රවිෂ්ටව; හෙවත් ප්‍රවෙශය හෙතුකොටගෙන; තිදස, දෙව්ලෝ; කිලුටු වෙතීදෝ, කැලඹුම වෙතැයි කියාදෝ හෝ; සැඩකර, චණ්ඩකි රණයාගේ*(සූර්ය්‍යයාගේ); කරපහස, කෲර ස්පර්ශ ඇති රශ්මිය; බැස, අවතීර්ණවැ; දැම්වූසතාව, බහිෂ්කෘතවූ (නාගරික) ජනයා හට; නොවදිනලෙසට දෝ, ස්පර්ශ නොවන අකාරයට දෝ හෝ; පුර, (මෙ ජයවර්ධන) පුරයෙහි; අහස, ආකාශයෙහිම; නොපටු, සාන්ද්‍රවූ; වලාකුළු, වලාහක කූටයන්; හිඳුවයි, වා සය කරවයි.

18 මි ණි බ ද සඳලූවල පිළිබිඹුව දිසි ස ද
ව ත ය ද සිරින් තම දිනුවයි මෙපුර ල ද
නු බ මැ ද ගී සරහැර තුරුයෙන් ගෙනහොමද
යු ද අ ද හසින් සිටිනාවැනි මෙපුර වැ ද

18 මිණිබඳ, (ස්ඵටික) මාණික්‍යයෙන් බඳවූ; හෙවත් පළිඟු මිණෙන් කරනලද්දවූ; සඳලූවල, චන්ද්‍රශාලාවන්හි; පිළිබිඹුව දිසි, ප්‍රතිබිම්බිතව දෘශ්‍යමානවූ; සඳ, චන්ද්‍රමණ්ඩලය; (කෙවැනිද යතහොත්?) මෙපුර ලද, මේ ජයවර්ධන පුර යෙහි කාන්තාවෝ; වතඳසිරින්, මුඛචන්ද්‍රශොභායෙන්; තම, [චන්ද්‍රයා] තමා; දිනුවයි, පැරදවූහයි [කුපිතවැ]; නුබ මැදහි, නභොමධ්‍යයෙහි; සර, සචාරය; හැර, විසර්ජනය කොට; නො මද, අමන්දවූ; තුරුයෙන්, තාරකාසෙනාව; ගෙන, ග්‍රහණය කොට; යුදඅදහසින්, (පුරස්ත්‍රීන් හා සමග) යුඬකරනු කැමැත්තෙන්; මෙපුර, මේ පුරයට; වැද, ප්‍රවිෂ්ටවැ; සිටිනා වැනි; ස්ථිතිය කරන්නාක් වැන්න.

19 රු ව න් පහ කවුළුවෙන් පෙනෙනා පුරග න
වු ව න් සඳද සඳමඬලද දිසි ගුව න
නු ව න් පුර අකිමින් දෙකම එක තැ න
ලෙවන් සිත සතුටු වෙයි උවමට කිය න

19 රුවන්පහ, රත්නප්‍රාසාදයන් සම්බන්ධවූ; කවුළුවෙන්, කවාටයෙන්; පුරගන, පුරස්ත්‍රීන්; පෙනේන, දෘශ්‍යමානවනකල් හි; වුවන්සඳද; මුඛචන්ද්‍රයාද; සඳමඬලද, (ප්‍රකෘති) චන්ද්‍රමණ්ඩල යද (යනදෙක); ගුවන, ආකාශයෙහි; දිසි, (එකවිට) දෘශ්‍ය මාන විය; දෙකම, (ඒමේ උපචරිතානුපචරිත චන්ද්‍රමණ්ඩල)

ස්ඵුටයව්; **එකතැන**, (ආකාශ සඞ්ඛ්‍යාත) **එකස්ථානයෙහි**; දකිමින්, දර්ශනය කෙරෙමින්; හෙවත් දර්ශනය කිරීම හේතු කොටගෙන; ලෙවන්, ලෝවැස්සන්ගේ; සිත, චිත්තයතෙම; කියන, (කවින් විසින්) කියනු ලබන්නාවූ; උවමට, (මුඛය උපමේයකොට ඇති) වක්ත්‍රෝපමාවට; සතුටුවෙයි, සන්තුෂ්ට වෙයි; උපමාවද උපමේයයාමෙන් ප්‍රත්‍යක්ෂගම්‍ය වෙයිසේයි.

20 මිණි නිල් කැ රැ ල් ලෙ න් නැ ඟි රැස් ථුබ වැ සිය
ලෙළ රන් කොහොල් ලෙ න් පැහැවිදුලි ගැ වැ සිය
ග ජ ගා ත් පි ඹිල් ලෙ න් ගෙනදියහැලි වැ සිය
නිති මේ සි ය ල් ලෙ න් තුටුවන පුර වැ සිය

20 මිණිනිල්කැරැල්ලෙන්, ඉන්ද්‍රනීලමාණික්‍යමයවූ ශෘඞ්ගයෙන්; නැඟි, උද්ගතවූ; රැස්, රශ්මීන්ගෙන්; ථුබ, (පුර)ස්තාලය; වැසිය, ඡාදිතකළාය; ලෙළ, ලීලෝපෙතවූ; රන් කොහොල්ලෙන්, ස්වර්ණකේතුයෙන්; පැහැවිදුලි, ප්‍රභානමැති විදුල්ලතාව; ගැවැසිය, ආකීර්ණ විය; ගජන්, හස්තීන්ගේ; අත්පිඹිල්ලෙන්, ශුණ්ඩා නමැති ප්‍රණාලියෙන්; ගෙන, පතිත වන්නාවූ; දියහැලි, ජලනිර්ඣර නමැති; වැසිය, වෘෂ්ටි ඇත්තීය; නිති, අනවරතයෙන්; මේ සියල්ලෙන්; මේ (උක්ත ප්‍රකාර) සියලුදෙයින්; තුටුවන, තුෂ්ටවන්නාවූ; පුරවැසිය, පෞරජනතාවය.

21 අ ප ස ර ගත් වළලුත් ලා තමන් ද ගා
අ ප ස ර ගෙන සරමින් නිතොර පුරම ගා
අ ප ස ර ගත් තැනටත් බැඳ දෙති නි ගා
අ ප ස ර වෙති හසගන පුරගනන් ම ගා

21 අපසරගත්, අපගේ රූපය ග්‍රහණය කළාවූ; වළලුත්, වලයයුග්මද; තමන් දගා, ස්වකීය ජඞ්ඝාවන්හි; ලා, නික්ෂිප්ත කොට; හෙවත් බහාගෙන; නිතොර, නිරන්තරයෙන්; අප සර ගෙන, අපගේ සමාරය ග්‍රහණය කොට; පුරමගා, පුර වීථියෙහි; සරමින්, හැසිරෙමින්; අප සරගත්, අපගේ ස්වරූපය ග්‍රහණයකළාවූ; තැනටත්, ස්ථානයටත්; බැඳ, බන්ධනය කොට; නිගාදෙති, නිග්‍රහදනය කෙරෙතැයි කියා; හසගන, හංසාඞ්ගනාවෝ; පුරගනන්, පුරස්ත්‍රීන්; මගා, නිරීක්ෂණය කොට; අපසර වෙති, අපචාර ඇත්තාහු වෙත්, අභිචාරණ ඇතිවෙතැයි සේයි.

22 නෙත් තිඳු වර වතිතිඳු සිරි දුරුකෙරෙ ති
ගත් තිඳු පුර සුරගන රුව පරදව ති
සසි තිඳු තුනු පහසින් සත ගැතිකෙරෙ ති
පර සිඳු පුර ගන රුව කවුරු පවස ති

22 නෙතින්, නෙත්‍රයෙන්; ඉඳුවර, ඉන්දීවර (නීලොත්පල) යන්ගේද; වතින්, වක්ත්‍රයෙන්; ඉඳු, පූර්ණ චන්ද්‍රයාගේද, සිරි, ශොභාව; දුරුකෙරෙති, දූරීභූතකෙරෙත්; ගතින්, ශරීරයෙන්; ඉඳුපුර, ශක්‍රපුරයෙහි; සුරගන, දිව්‍යාඞ්ගනාවන්ගේ; රුව, රූපශ්‍රීය; පරදවති, පරාජිතකෙරෙත්; සසිනිඳු, සුස්නිග්ධවූ; තුනුපහසින්, ශරීරස්පර්ශයෙන්; සත, (කාමුක) ජනයා; ගැතිකෙරෙති, දාසකෙරෙත්; පරසිඳු, (මෙසයින්) ප්‍රසිද්ධවූ; පුරගන, (මේ) නගරයෙහි අඞ්ගනාවන්ගේ; රුව, රූපලාවණ්‍යය; කවුරු, කවර (කවිජන) කෙනෙක්, පවසති, ප්‍රකාශ කලහෙද්ද?

23 මනහර සුවඳ විහිදෙන නිති දසතු දෙ ස
හැමවර සුසැදි විසිතුරු සල්පිල් සහ ස
පියකර ලියන් උන් විද ගී නැටුම් ර ස
බිහිදෙර සියෙන් සිය සැදී පුර වේ දෙප ස

23 නිති, නිරන්තරයෙන්; දසතුදෙස, දිශානුදිශාවන්හි; මනහර, මනොහරවූ; සුවඳ, සුගන්ධය; විහිදෙන, විශීර්ණවන්නාවූ; හැමවර, සියලුකාලයෙහි; සුසැදි, සුසජ්ජිතවූ; විසිතුරු, විචිත්‍රවූ; සල්පිල්සහස, අපණසහස්‍රයන්ගෙන්ද; පියකර, (දුටුවන්) ප්‍රියකරන්නාවූ; ලියන්, කාන්තාවන් විසින්; ගීනැටුම්රස, ගීතනෘත්‍යරසය; විද, විඳිනාලකොට හෙවත් විඳිනය කෙරෙමින්; උන්, උපවිෂ්ටවූ; බිහිදෙරසියෙන්සිය, අනෙක ශත බහිර්වාරයෙන්ද; පුරවේදෙපස, පුරවීථින් සම්බන්ධ උභය පාර්ශ්වය; සැදි, සජ්ජිත වී.

24 පිළින් පිළ සැදුණු මිණිකිරණ දිදු ලිය
පළින් පළ අඹර පවනාබළ කෙහෙ ලිය
තුළින් තුළ රුවන් රශ්මිදි නැරු ලිය
පෙළින් පෙළ උදුල පන අඳුරු දුර ලිය

24 පළින්පළ, වෛදූර්‍යකාචක්පාෂා; සැදුණු, සජ්ජිතවූ; මිණි, මාණික්‍යයන්ගේ; කිරණ, රශ්මියෙන්; දිදුලිය, උජ්ජ්වලිතවූ; පළින්පළ, ඡදනයක් ඡදනයක් පාසා; අඹර, ආකාශයෙහි; පවනබල, මාරුතයෙන් කම්පිතවූ; කොඩහලිය, කොඩිත් ඇත්තාවූ; කුළින්කුළ, මුදුනක් මුදුනක් පාසා; රුවන්රැස්, රත්න රශ්මීන්; විහිදී, විකසිතවූ; කැරලිය, ශෘඞ්ග ඇත්තාවූ; පෙළින් පෙළ, පඞ්ක්තියක් පඞ්ක්තියක් පාසා; උදුල, උජ්ජ්වලිතවූ; පහ, ප්‍රාසාද (සමූහය) තෙම; අඳුර, (මෙපුරයෙහි) අන්ධකාරය; දුරලිය, විධ්වංසනය කොළේය.

25 දෙරින් දෙර පසඟ තුරු සිඳු ගොසර ගය
ස රින් ස ර නගන ලිය ගී මනර ගය
ක රින් ක ර ලෙලවි රැස් විදෙන තර ගය
උ රින් උ ර පැහැර නිති සරන සෙන ගය

25 දෙරින් දෙර, වාරයක් පාසා; හෙවත්, ගෙදොරෙහි ගෙදොරෙහි; පසඟතුරු, පංචාංගික තූර්‍ය (ඝෝෂය); සිඳුගොසරඟය, සමුද්‍රඝෝෂය වැන්න; සරින් සර, (ෂඩ්ජඍෂභගාන්ධාරාදි සප්තස්වරයන් අතුරෙන්) ස්වරයෙන් ස්වරය; නඟන, ආරෝපනය කරන්නාවූ; ලියගී, ලයාන්විතගීතයෙන්; මනරඟය, මනොඥය; කරින් කර, හස්තයක් හස්තයක් පාසා; ලෙල, ලීලොපෙතවූ; අවි, ආයුධයෙන්; රැස්විදෙන, රශ්මිවිකීර්ණවන්නාවූ; තරඟය, ක්‍රීඩාප්‍රබන්ධ ඇති; උරින් උර, අංගයෙන් අංගය; පැහැර, ඝට්ටනයකොට; නිති සරන, අනවරතයෙන් සංචාරය කරන්නාවූ; සෙනඟය, සේනාංගය හෙවත් පාබලසේනාවය.

26 උ ය න් වනු කමල් විල් අවට උදු ලි ය
රු වි න් බැබළි සුරඟනා අයුරු පිය ලි ය
ලෙව න් සතුටු වන යව්සිරිනි* කුසි ලි ය
මෙ සි න් මෙපුර පුරඳුරු පුර සිරිසි ලි ය

26 අවට, සාමන්තයෙහි; උදුලිය, උජ්ජ්වලිතවූ; උයන්වනු, උද්‍යානවනයන් හා; කමල්විල්, පද්මතඩාගයෝද; රුවින්, රූපශ්‍රීන්; බැබළි, භ්‍රාජිතවූ; සුරඟන අයුරු, දිව්‍යාඞ්ගනාවන්

* 'යව්සිරිනි'

බඳුළු; පිළිය, ප්‍රියවූ කාන්තාවෝය(යන); ලෙවන් සතුටුවන, ලෝවැස්සන් සතුටුකරවන්නාවූ; සව්සිරි ඇ, සකලශ්‍රීයෙව; දුසිරිය, උපහාසය කෙළේය; මෙසින්, මෙකී ගුණසමූහයන් කාරණකොට වනෙහි; මෙපුර, මේ (ජයවර්ධන) පුරයෙහිම; පුරඳුරපුර, පුරන්දරපුරයාගේ (ශක්‍රපුරයාගේ); සිරි, ශෝභාව; දුසිලිය, උපහාසය කෙළේයි.

පුරවර්ණනානන්තරවැ නරේන්ද්‍රවර්ණනාව කරන්නාහු "මුළුලොව් සිරිසැපත්" යනාදි කීහු.

## ශ්‍රීපරාක්‍රමබාහු නරේන්ද්‍ර වර්ණනා.

27 මුළුලොව සිරිසැපත්—සැපත් තැන්මෙන් තෙව්නා
මනාහදනා මහදනා—රදනා රදසිරි* මෙපුරේ.

27 මුළුලොව, සකලලෝකයෙහි (පවත්නාවූ); සිරිසැපත්, ශ්‍රීසම්පත්තීන්; සැපත්තැන්මෙන්, සම්ප්‍රාප්තවූ ස්ථානයක්මෙන්; තෙව්නා, භ්‍රාජමානවූ; මහදනා, මහාජනයාගේ: මන, චිත්තයන්; හදනා, ආකර්ෂණය කරන්නාවූ; රදසිරි, රාජශ්‍රීය; රදනා රාජමානවූ; හෙවත් ලඞ්කාග්‍රරාජධානිවූ; මෙපුරේ, මේ (ජයවර්ධන) පුරයෙහි—

28 ස ත ර දිගත යසහර ල ම් බා පුරු දු
ළ ත ර රුපුන් ජය ගෙන පු ම් බා විරු දු
නොනැර වෙතම කර දෙර ණ ම් බා සි රි දු
නි තො ර වැජඹි සිරි පැරකු ම් බා නිරි දු

28 සතරදිගත, චතුර්දිග්භාගයෙහි; පුරුදු, පරිචිතවූ; යසහර, කීර්තිහාරය; ලම්බා, අවලම්බනය කරවා; ළතර, ස්නිග්ධහෘදය ඇති; රුපුන්, සතුරන්; ජයගෙන, [පරදවා] ජයග්‍රහණයකොට; විරුදු, විරෝධීන්; පුම්බා, පහකරවා; දෙරණම්බා, ධරණීකාන්තාව හා; සිරිදු, ශ්‍රීකාන්තාව; නොහැර, වර්ජිත නොකොට; වෙතමකර, සමීපස්ථව කොට; සිරිපැරකුම්බා නිරිඳු, ශ්‍රීසඞ්ඝබෝධි ශ්‍රීපරාක්‍රමබාහු නරේන්ද්‍රයාම; නිතොර, අනවරතයෙන්; වැජඹි, විජෘම්භමාන වේ.

* රදනසිරි—පොත්හි.

තවද ආඛණ්ඩලාඛණ්ඩගුණශෝභමණ්ඩිත පණ්ඩිතජනපුණ්ඩරීකමාර්තණ්ඩ මාර්තණ්ඩකුලෝද්භූත භූමණ්ඩලේශ්වර පරාක්‍රමබාහු නරේශ්වරයාගේ මෙද එක් වර්ණනාභූෂණයෙක. එද තා කර්ණභූෂණය කර.

[තවද සක්දෙව්රජහු මෙන් නොකඩවූ ගුණසමූහයෙන් සැරසුණාවූ; පණ්ඩිතජනනමැති නෙළුම්පදමයන්ට සූර්යයා බඳුවූ; සූර්ය වංශාභිජාතවූ; පෘථිවීමණ්ඩලයට අධිපතිවූ; පැරකුම්බා මහරජාණන්ගේ මේ කියනලබන්නේත් එක් ගුණකීර්තනයෙක; හෙද තාගේ කර්ණයන්ට ආභරණ කර: හෙවත් ශ්‍රවණය කර.]

29 සි ත් නිති යෙන් මුනිපුදයට න මා ලි ය
සි ත් ගුණයෙන් සව්සත සිත අ මා ලි ය
ග ත් වික්‍ර මෙ න් රුපු නිරිඳුන් ද මා ලි ය
මෙත් සි ලි ලෙ න් මුළු තෙළියත තෙමා ලි ය

29 (ඒමේ පරාක්‍රමබාහු නරේන්ද්‍රතෙම;) සිත්, චිත්තය; නිතියෙන්, අනවරතයෙන්; මුනිපුදයට, සම්බුඩපූජනයට; නමාලිය, අවනතකෙළේය; සත්ගුණයෙන්; සාධුගුණයෙන්; සව්සත, සකලජනයාගේ; සිත, චිත්තයන්හි; අමාලිය, අමෘතය ප්‍රක්ෂේප කෙළේය; ගත්වික්‍රමෙන්, ශෞර්යවික්‍රමයෙන්; රුපු නිරිඳුන්, ශත්‍රුනරේන්ද්‍රයන්; දමාලිය, දමනය කෙළේය; මෙත්සිලිලෙන්, මෛත්‍රීනමැති ජලයෙන්; මුළුතෙළියත, සකල ජගත්‍රය; තෙමාලිය, පරිෂික්තකෙළේය.

30 ම ධුර ද සිරි න් සත සිතා සිත ඇද ලී ය
මනනද රුසිරදන ලිය ඇස ඇස ලී ය
පි රි සි ද නැ ණි න් සත්වග දුක් දුර ලී ය
ඇ ම සද මෙරද බෝයන් සිරි ඉසු ලී ය

30 මධුරදසිරින්, මධුරජහු විසින් සමවනවූ චරිත්‍රයන්; හෙවත් මානවධර්මයෙහි කියනලද සච්චරිත්‍රයන්; සත, සත්වයන්ගේ; සිත සිත, චිත්තයක් පාසා; ඇදලීය, ආකර්ෂණය කෙළේය; මනනද, මනොනන්දනීයවූ; රුසිරදන, (සව්කිය)

රූශ්‍රීනමැති රසාර්ණවය; ලිය, යුවතීන්ගේ; ඇස ඇස, චක්ෂුසක් පානා; ලීය, ප්‍රකාශපකෙළේය; නැණින්, ඥානයෙන්; පිරිසිදු පර්‍යවජීතනකොට (නිශ්චයකොට) සත්වයන් සුවිශුද්ධියෙහි ... දුක්, දුඃඛයන්; දුරලීය, දුරීභූතකෙළේය; මෙරද, (මේරු) මෙ සාගරතුනම; ඇමසඳ, හැමසැල්හි; බෝසත්සිරි, බෝධිසත්ව ශ්‍රිය; ඉසිලීය, උපගතය කෙළේය.

31 රුපු සයුරට කග මෙරවුනා කොට නා   සි ය
තද යුද යට වැද මඳ නුත් නොවැළැ   කි ය
නාම විකුමට සරි නිරිඳකු නොසැල   කි ය
නිති මුළුරට සත සිය සක් ලෙස රැ   කි ය

31 රුපුසයුරට, ශත්‍රුනමැති සාගරයට; කග, (ඛඩ්ගය) ඛඩ්ගය; මෙර වත කොට, මෙරුපර්වතය කොට; නැසිය, නාශනා කෙළේය; තදයුදයට, ඝනබද්ධවූ යුද්ධයට; වැද, ප්‍රවිෂ්ටවැ; මඳ නුත්, ස්වල්පයකුත්; නොවැළැකිය, පසුබටනොවූයේය; නම විකුමට, ආත්මීයවික්‍රමයට; සම නිරිඳකු, සමානවූ [වික්‍රමැති] නරේන්ද්‍රයකු; නොසැලකිය, සංලක්ෂණය නොකළේය; නිති, නිරන්තරයෙන්; මුළුරට, සකලවිජිතයෙහි; සත, [ස්වාධීනවූ] ජනයා; සියසක්ලෙස, ස්වකීය චක්ෂුස මෙන්; රැකිය, රක්ෂාකෙළේය.

32 නොපමණ සිරින් ඔදසුන් තැනකට සැලෙ   කා
එ දෙ ර ණ තොමා සපැමිණි මෙන් මේකුළ   කා
සු රූ ප ණ රජුන් පෙර රජකළ මෙසිරිල   කා
ස පැ මි ණ ගුණෙණන් වැජඹෙන මේ බෝසතෙ   කා

32 නොපමණ සිරින්, ප්‍රමාණාතික්‍රාන්ත ශ්‍රීමයෙන්; ඔදසුන්, ශුභනාමජසවූ; තැනකට, ස්ථානයකට; එදෙරණ තොමා, ඒ පෘථිවිය තොත්කොට; සපැමිණි, සම්ප්‍රාප්තවූ; මේකුළක මෙන්, මේඝකූටයක් මෙන්; පෙර, පූර්වයෙහි; සුරූපණ රජුන්, [මාඝරජාදි] කෘපාණ නරේන්ද්‍රයන්; රජකළ, රාජ්‍යය කළාවූ; මෙසිරිලක, මේ ශ්‍රීලංකාද්වීපයට; සපැමිණ, (අනුරාජත්ව යෙන්) සම්ප්‍රාප්තවැ; වැජඹෙන, විජෘම්භමාණවූ; මේ, (ක්ෂත්‍රියවංශයෙන් අභිජාතවූ) මේ (පරාක්‍රමබාහු මහාරජ) තෙම; බෝසතෙක, (දශපාරමිතාදි විශිෂ්ට ගුණාන්විත) බෝධිසත්ව කෙනෙක.

33 පු න් සඳ වන් වත සිරි පෙන්වා ලොව ට
ර න් කඳ මෙන් බබළන මෙනිරිඳුන් දු ට
ම න් මද වෙයි දුන් මද රජුගේ සිත ට
ම න් මද යයි යතු යුතු වෙයි ඉන් ඔහු ට

33 පුන්සඳවන්, පූර්ණචන්ද්‍රමණ්ඩලාකාරවූ; වත, වක්ත්‍රයාගේ; සිරි, ශොභාව; ලොවට, ලොකයාහට; පෙන්වා, දර්ශනය කරවා; රන්කඳමෙන්, සුවර්ණස්කන්ධයක්මෙන්; බබලන, භ්‍රාජමානවූ; මෙනිරිඳුන්, මේ (පරාක්‍රමබාහු) නරෙන්ද්‍රයන්; දුට, දර්ශනය කළහොත්, දුන්, මේ කාලයෙහි; මදරජුගේ, මන්මථයාගේ; සිතට, චිත්තයට; මන්මදවෙයි, මානමාත්සර්‍ය වෙයි, හෙවත් අභිමානහානිය වෙයි; ඉන්, එහෙයින්; ඔහුට, ඒ මන්මථයාහට; මන්මදයයි යතු, මන්මදයයි කථනය කිරීම; යුතුවෙයි, යුක්තවේ—දර්පයෙන් ලබනවූ අභිමානයාහට 'මන්මද' යන නාමය පෙර අන්වර්ථ වශයෙන් යොග්‍යනොවූ නමුත් දුන් පරාක්‍රමබාහුනරෙන්ද්‍රයාගේ රූපදර්ශනයෙන් දර්පරහිතවන හෙයින් ඒ අන්වර්ථයෙන්ම යොග්‍යයැ සිතේසි.

34 ද න් දෙ න සැවි අපගෙන් දනගෙන මෙබ දු
ද න් දෙ න රඟ කරවයි යන මෙන් පුරු දු
ද න් දෙ නු දැක මොහු සුරම්ණී සුරතුරු දු
ද න් නොල බන සුරපුර ගිය වැනි පසි දු

34 දන්දෙනසැවි, දානවස්තු පරිත්‍යාගකරන විධිය; මෙබදු, මෙසේයයි, අපගෙන්, අසමත්හුගෙන්; දනගෙන, ජනනය කොට; දන්දෙනරඟ, දන්දෙන්නාවූ ආකාරය; පුරුදු කරවයි, (දෙව්ලොවෙහිද) පරිචිතකරවයි; යනමෙන්, කථනය කරන්නාක් මෙන්; මොහු, මේ නරෙන්ද්‍රයා, දන්දෙනු දැක, දානවස්තු පරිත්‍යාග කරන්නා දර්ශනය කොට; සුරම්ණී, දිව්‍යචින්තාමාණික්‍යයෝද, සුරතුරුදු, (මන්දාර පාරිජාතාදී) දෙවද්‍රැමයෝද; දන් නොලබන, දානයක් නොලබන්නාවූ; සුරපුර, දෙව්පුරයට; ගියවැනි, ගමනය කළාහු මෙනි.

35 ය ස ගේ පවතිනාමෙන් මුළු දියත මෙ තු න්
වි ල ගේ දක්වමින් පෙර පසිදු බෝග තු න්
සොඳගේ සැපවිඳිනා ලෙස පරපුරෙකා දෙ තු න්
සි ත ගේ දෙවයි යදිනට තිමංගල ඈ තු න්

35 මෙ මුළු තුන්දියත, මේ සියලු ජගත්ත්‍රයෙහි; යසගේ, (දානමය) කීර්තිශබ්දය; පවතිනාමෙන්, ප්‍රවෘත්තවනපරිද්දෙන්; පෙර, පූර්වයෙහි; පසිදු; ප්‍රසිද්ධවූ; බෝගතුන්, (විශ්වන්තර මහාරාජාදි) බෝධිසත්වයන්ගේ; විලගේ, (සෞජන්‍ය) විලාසය; දක්වමින්, දර්ශනය කරවමින්; දෙතුන් පරපුරෙක, විත්‍රි පරම්පරායෙක්හි; සොඳගේ, සුන්දරාකාරයෙන්; සැපවිඳින ලෙස, සුඛවින්දනය කරන පරිද්දෙන්; යදිනට, අර්ථීන්ට; සිතගේ, (ඔවුන්ගේ) මනොරථය වූ පරිද්දෙන්, තිමඟුල ඈතුන්, ත්‍රිමඞ්ගලිතහස්තීන්; දෙවයි, දාන කරවයි

36 දි ය ර ම් බල විකුම් පෙන්වූ මුළු දෙර ණ
ම නර ම් මෙනරනිඳුගේ දියහියකර ණ
වි හිගු ම් බුජග දිලි යම දිව සෙ කුරුප ණ
කගනම් රුදු විරිදු රද මුදුනැ හෙන සෙ ණ

36 මුළුදෙරණ, සකලධරණීතලයෙහි; දියරම්, ජයග්‍රහණයෙන් ප්‍රසිද්ධවූ ශ්‍රීරාමයාගේ; බලවිකුම්, බලවික්‍රමය; පෙන්වූ, දර්ශනය කැරවූ; මනරම්, මනොරම්‍යවූ; මෙනරනිඳුගේ, මේ පරාක්‍රමබාහු නරශ්‍රෙෂ්ඨයාගේ; දියහියකරණ, ජගද්හිතයට කරණවූ [සාධනවූ]; විහිගුම්, උත්තුඞ්ගවූ; බුජග, භුජඞ්ගයෙහි; දිලි, ප්‍රජ්වලිතවූ; යමදිවසෙ, යමයාගේ ජිහ්වාව මෙන්; කුරුපණ, ක්‍රූරවූ; කගනම්, ඛඞ්ගය නම්; රුදු, රෞද්‍රවූ; විරිදුරද, ශත්‍රු-රාජයන්ගේ; මුදුනැ, මස්තකයෙහි; හෙන, පතිතවන්නාවූ; සෙණ, අශනියක්.

37 සයුරට දිවන මහගං නැවති නැ ත් නැ ත
අඳුරට බියව රිවිසඳ සිටපු නැ ත් නැ ත
විඳිනට බැරිව විඳුරව් පැකිළි නැ ත් නැ ත
යුදයට පැමිණ මෙනිරිඳු පැරද නැ ත් නැ ත

37 සයුරට, සාගරයට; දිවන, ධාවනය කරන්නාවූ; මහගං, මහාගඞ්ගාව; නැවති තැන්, නිවෘත්තවූ තැනෙක්; නැත, නැත්තේය; අඳුරට, අන්ධකාරයට; බිඳව, භිතවූ; රවිසඳ, රවිචන්ද්‍රමණ්ඩලයන්; සිටපු තැන්, සිටියාවූ තැනෙක්; නැත, නැත්තේය; විඳිනට බැරිව, වේධනය කරන්නට නොහැකිව; විදුරවී, වජ්‍රායුධයා (ශක්‍රයා); පැකිළි තැන්, ප්‍රස්ඛලිතවූ ස්ථානයෙක්; නැත, නැත්තේය; යුදයට පැමිණ, සාංග්‍රාමයට ප්‍රාප්තවූ; මෙනිරිඳු, මේ (පරාක්‍රමබාහු) නරේන්ද්‍රයා; පැරදි තැන්, පරාජිතවූ ස්ථානයෙක්; නැත, නැත්තේයි.

38 නොනැවත ගැඹුරු සයුරට ගොදුරට පිවි ස
තු බ ප ත පැමිණ වැජඹෙන ගුරුළකු විල ස
ම ද ම ත ගිජිඳු බඳවත් මද නොවී ල ස
මො හු අ යා සිපතා ගොස් නොරදයි අහස මි ස

38 ගැඹුරු, ගම්භීරවූ; සයුරට, සාගර ජලාභ්‍යන්තරයට; ගොදුරට, ගොචර පිණිස; පිවිස, ප්‍රවිෂ්ටවූ; නො නැවත, නිවාසය නොකොට හෙවත් එහි නොවැස; තුබපත, නභෝමාර්ගයට; පැමිණ, ප්‍රාප්තවූ; වැජඹෙන, විජෘම්භමාණවූ; ගුරුළකු විලස, ගරුඩපක්ෂියකු මෙන්; මොහු අත, මේ නරේන්ද්‍රයාගේ හස්තයෙහිවූ; අසිපත, ඛඩ්ගපත්‍රය නම්; මද, ස්වල්පමාත්‍රවූ; අලස නොවී, ආලස්‍යයෙන් යුක්ත නොව; අහස මිස, ආකාශයෙහි මුත්; මදමත, මදයෙන් මත්තවූ; ගිජිඳු බඳවත්, ගජේන්ද්‍රයන්ගේ ශරීරයෙහි වුවත්; නොරදයි, රඳා නොසිටී—විනිවිදයන්නේමැයි සේයි.

39 ක ර වා පසඟ තුරු ගොස රණ බිමට බැ ස
ත ද වා සිපතා ගෙන සහ රුපුරදුන් ය ස
ලෙලවා ඔවුන් හදවත් සමගින් ප ලි ස
මොලවා උනාඹුවන් ළෙසි යෝනා ගිනි රු ස

39 පසඟතුරුගොස, පංචාඞ්ගිකතූර්යනාදය; කරවා, පවත්වවා; රුපුරදුන්, ශත්‍රුරාජයන්ගේ; යස සහ, කීර්තිය හා සමග; අසිපත, (තමන්ගේ) ඛඩ්ගපත්‍රය; තදවා ගෙන, ශක්තව ග්‍රහණය කොට; ඔවුන්, ඒ ශත්‍රුරාජයන්ගේ;

හදවත් සවිගින් හෘදයවස්තු හා සමග; පළිඟ, ඵලකය; ලෙලවා, කම්පිත කරවා; උන්, ඒ ශත්‍රූන් පිළිබඳවූ; අඹුවන්, භාර්‍යාවන්ගේ; ළෙයි, හෘදයෙහි; සෝකගිනිරැස, ශෝකාග්නිසන්තාපය; මොලවා, උද්දීපන කරවයි.

40 උඹු කර කඹුව පාහාමෙන් සගගි  ර ග
මුණ කර කිමට බිදිනා තැන් පාහා  ර ග
යට කර මපද වැදවැටෙවයි කියනා  ර ග
ඇම වර ලොවට පෙන්වයි අවිසරම  ර ග

40 සගගිරඟ, මෙරුපර්වතාග්‍රය; පාහාමෙන්, දක්වන්නාක් මෙන්; කඹුව, ඛඩ්ගය; උඹුකර, උඩුකුරු කොට; බිදිනා තැන්, (ශත්‍රූන්) භග්නකරන ස්ථානය; පාහරඟ, ප්‍රකාශකරන්නාක් මෙන්; බිමට, භූමිය දෙසාවට; මුණකර, කොණය කොට; හෙවත් කඩුමුණය බිමට හරවා; මපද, මාගේ පාදමූලයෙහි, වැදවැටෙවයි, ප්‍රණතව පතිත වයි; කියනරඟ, කථනය කරන්නාක් මෙන්; යටකර, (කඩුව) අධෝ ගතකොට; ඇම වර, සියලුකාලයෙහි; අවිසරමිරඟ, ආයුධ ශිල්පයාගේ අභිනයාකාරය; ලොවට, ලෝවැස්සාහට; පෙන්වයි, දර්ශනය කරවයි.

41 රණ වා පි ය ලෙහෙවතුරෙන් ගත්තර  ග
පුර වා පි ය සොන් සිවලුන් සිත් සම  ග
තර වා පි ය අඟනන් සිත් විරහග  ග
බඳ වා පි ය ජයදද අට දිගු යට  ග

41 තරඟ ගත්, තරඞ්ග ග්‍රහණය කළාවූ; ලෙහෙවතුරෙන්, (ශත්‍රූන්ගේ) රුධිර නමැති ප්‍රවාහයෙන්; රණවාපිය, යුද්ධභූමි නමැති සරසිය; සොන් සිවලුන් සිත් සමග, ශ්වාන සෘගාලයන්ගේ චිත්තයන් හා සමග; පුරවාපිය, පූර්ණය කරවිය; අඟනන්, (ශත්‍රු) වනිතාවන්ගේ; සිත්, චිත්තයෙහි; විරහරඟ, විරහ වේදනා නමැති ගඟාව; තරවාපිය, (ඒ සරසියෙන්) නිෂ්පාදනය කරවිය; අටදිගුයටග, අෂ්ටදිශා නමැති යෂ්ට්‍යග්‍රයෙහි; ජයදද, ජයධ්වජයන්; බඳවාපිය, බන්ධනය කරවී.

42 තැ වි යදල් බිඳ නැඟි ගිනි ක දේ සි දී
පෙ වි පණ සිපත මදූ තුන් බ දේ සි දී
ලැ වි ඔප කඟින් කගවත් යු දේ සි දී
නි වි රුපුන් වියොගින් සුර මැ දේ සි දී

42 අසිපත, (මේ නරේන්ද්‍ර තෙම තමන්ගේ) ඛඩ්ගපත්‍රය; යදල් බිඳ, ලෝහජාලයන් භග්නකොට; එහෙවත් ලෝහොදල් බිඳීමෙන්; නැඟි, උපන්නාවූ; ගිනිකදේසිදී, වහ්නිස්කන්ධයෙහිදී; තැවි, තපනකොළේය; මදූතුන්, (ශත්‍රුසේනාවට අයත්) මත්තහස්තීන්ගේ; බදේසිදී, දේහයෙහිදී; පණපෙවි, ප්‍රාණපායනය කොළේය; කඟින් කගවත්, ඛඩ්ගවෘෂ්ටිධාරායෙන් වූ; හෙවත් ඛඩ්ගයෙන් ඛඩ්ගය ප්‍රහරණය කිරීමෙන් වූ; යුදේසිදී, යුද්ධයෙහිදී; ඔප ලැවි, කාන්තිය ඇති කරවිය; රුපුන් වියොගින්, ශත්‍රූන්ගේ වියෝගයෙන් [ඉක්බිති;] සුරමැදේසිදී, ඛඩ්ගකොශමධ්‍යයෙහිදී; නිවි, නිර්වාපණය කොළේය.

43 දළ පැරකුම් රජ සුර තුරෙක රිවිගො ත
දුළ බුවනෙක බුජකප්තුර එසින් ප ත
යළ මෙනිරිඳු එහි කද සිරි ගත දිමු ත
පැළ ඉන් ඇතිව වැඩෙනුය මෙසිරි ලක් කෙ ත

43 රිවිගොත, සූර්‍ය්‍යවංශොද්භූතවූ; දළපැරකුම්බුජ, මහාපරාක්‍රමබාහුනරේන්ද්‍ර නමැති, සුරතුරෙක, දෙවදැමයෙක් (විය). එයින්, ඒ වංශයෙන්; දුළ, උජ්වලිතවූ; බුවනෙකබුජ, භුවනෛකබාහුනරේන්ද්‍ර නමැති; කප්තුර, කල්පවෘක්ෂය තෙම; පත, ප්‍රාප්තවිය; යළ, තදනන්තරව; මෙනිරිඳු, මේ (ශ්‍රීපරාක්‍රමබාහු) නරේන්ද්‍රතෙම; එහි, ඒ අන්වයෙහි; දිමුත, දීප්තිමත්වූ; කදසිරි, ස්කන්ධශ්‍රීය; ගත, ග්‍රහණය කොළේය; ඉන්, ඒ සුරදැමයෙන්; මෙසිරිලක්කෙත, මේ ශ්‍රීලංකාවීප නමැති ක්ෂෙත්‍රයෙහි, පැළ ඇතිව, අඞ්කුරයන් ප්‍රාදුර්භූතව; වැඩෙනුය, (ක්ෂත්‍රියවංශ නමැති සුරදැමපරම්පරාවගේ) වර්ධනය [වන්නේයි.]

මෙසේ නරේන්ද්‍රවර්ණනාව දක්වා ඉක්බිති ප්‍රාණයෙන් පලමුකොට වෛවාහකපසඞ්ගුවර්ණරාජසභාප්‍රවේශයන් දක්වන්නාහු "මෙනිරිඳු" යනාදිය කියත්.

44 මෙනිරිඳු ගුණ මහිම—හිම සඳනා සඳ තවරා
සිදුසරනා ලෙස අදහස—තොරනොකර අද අදරින්

44 මෙනිරිඳු, මේ (පරාක්‍රමබාහු) නරේන්ද්‍රයාගේ; ගුණ මහිම, ගුණමහිමාව නමැති; හිමසඳන, ශීතචන්දනාඛ්‍ය ලේපය; සඳ, විතානයෙහි; තවරා, අනුලිප්ත කොට; අදහස, අභිප්‍රායාශය; සිදුසරන ලෙස, සිඬසාරසපරිද්දෙන්; අද රින්, ආදරයෙන්; තොරනොකර, වර්ජනය නොකොට අද, අවුත්-

45 නිව ත් නොම නොවෙන පිරිදිව තෙදය සි නි
ලොවත් මෙපුර රඳුනුත් රැක සිටිවි සි නි
ප ව ත් වන පුදැනි නිනිනන් තුරු ගො සි නි
ස ව ත් සුරිඳු මැඳුරට වැද වැද ගො සි නි

45 නිවත්, (කොතෙක්) කර්තෘකාල නමුත්; නොනෙවෙන, නිශ්චිත නොවන්නාවූ; දිවතෙදයසිනි, දිව්‍යවූ යශෝතේජසින්; පිරි, පූර්ණවූ; ලොවත්, ලෝකයාද; මෙපුර, මේ (ජයවර්ධන) පුරයෙහි; රඳුනුත්, නරේන්ද්‍රයන්ද; රැක, රක්ෂණය කොට; සිටි විසිනි, ස්ථිතිකර්ම වශයෙන්; ගෙවත් උපද්‍රවනිවාරණය කෙරෙමින් වැඩසිටිනහෙයින්; නන්තුරුඝොසිනි, නානාවිධ තූර්‍ය්‍යනාදයෙන් (ශබ්ද කොට); පවත්වන, ප්‍රවර්තනය කරන්නා ලබන්නාවූ; පුදැනි, පූජාපරිහාර ඇත්තාවූ; සවත්සුරිඳු මැඳුරට, ෂණ්මුඛබ්‍රහ්මෙන්ද්‍රමන්දිරයට; වැද, ප්‍රවිෂ්ටව; වැදගොසිනි, වන්දනය කොට ගොස්-

46 මුනිඳු පින් පිඩුව පෙනුණ මෙන් ලොව ට
විනි ද රන් රුවන් රුස් දිගත එළි කො ට
ඇමද දිලි සතන් නෙත් සිත් සතුටු කො ට
දළ ද මැඳුර තට වැද නැමද පුදකො ට

46 මුනිඳු, මුනීන්ද්‍රයන්වහන්සේගේ; පින්, සමත්‍රිංශත්පාරමි සංඛ්‍යාත පුණ්‍යය; පිඩුව, පිණ්ඩිත වූ; ලොවට, ලෝකයාහට; පෙනුණමෙන්, දෘශ්‍යමානවූවාක්මෙන්; රන්රුවන්රුස්, සුවර්ණමණිමුක්තාදීන්ගේ රශ්මිය; විහිද, ව්‍යාප්ත කොට:

දිගත, දශදිගන්තය; එළිකොට, ආලෝකකොට; සතන්, සත්වයන්ගේ; නෙත් සිත්, නෙත්‍රචිත්තයන්; සතුටුකොට, සන්තුෂ්ටකොට; ඇමඳ, හැමකල්හි; දිලි, ජ්වලිතවූ; දළදවැඩුර ගව, ශ්‍රීදන්තධාතුචෛත්‍යගෘහාභ්‍යන්තරයට; වැද, ප්‍රවිෂ්ටව; නැමද, නමස්කාරකොට; පුදකොට, පූජනයකොට—

47 සතසිත ලෙසින් ගත—සනහා සුවඳ සිලිලෙන්
කඹාරුගත් රුපුරද යස දුහුල්බ ඳු
වඩා සිනිඳු මුදු සුදු සළු සුපිරිසි ඳු
කැටිකළ රිවිකිරණ—පැටිකළ පැලඳ අබර ණ
නිකුත් සුරිඳු මෙන් සුරගඟ තරඟ පි ටි න්
අවුත් උදුල පිවිතුරු පිය විළිය පි ටි න්
ලෙළ මුතුලැල් දළපුබුඹෙස්සතයිය ට
තු ළ සුදුපට තුඟු සිංහාසනේ පි ට
ක ළ ලොව එකෙළි රිවිනැගිමෙන් පෙරදිග ට
දු ළ පැරකුම් බුජහරනිඳු උන්කල ට

47 සත, සත්වයන්ගේ; සිතලෙසින්, චිත්තය (සන්සන) පරිද්දෙන්; ගත, ශරීරය; සුවඳ සිලිලෙන්, සුගන්ධ ජලයෙන්; සනහා, ස්නාපනය කොට; කඹාරුගත්, ආවර්ජනය කොට ගන්නාලද; රුපුරද, ශත්‍රුරාජයන්ගේ; යස දුහුල් බඳු, යශස් නමැති දුකූලයක් බඳුවූ; සිනිඳු, සනිග්ධවූ; මුදු, මෘදුවූ; සුපිරිසිදු, අතිපරිශුද්ධවූ; සුදුසළු, ශ්වෙතශාටකයන්; වඩා, නිවාසන ප්‍රාවරණවශයෙන් ශරීරගතකොට; කැටිකළ, රාශිකෘතවූ; රිවිකිරණ, සූර්‍ය්‍යරශ්මීන්ට; පැටිකළ, නිග්‍රහකළාවූ, අබරණ, ආභරණයන්; පැලඳ, ප්‍රසාධනයකොට; සුරගඟ, ස්වර්ගදියගේ; තරඟපිටින්, තරංගමස්තකයෙන්; නිකුත්, නිෂ්ක්‍රාන්තවූ; සුරිඳුමෙන්, [ශක්‍ර] දේවේන්ද්‍රයාමෙන්; උදුල, උජ්ජ්වලිතවූ; පිවිතුරු, පවිත්‍රවූ; පියවිළිය පිටින්, පාදපීඨ මස්තකයෙන්; අවුත්, ආගමනයකොට; ලෙළ, ලීලෝපෙතවූ; මුතුලැල්, මුක්තාලම්බනාවන් ඇති; දළපුබුඹෙස්සතසි, දන්තබිම්බප්‍රතිබිම්බයන් ඇති ශ්වේතච්ඡත්‍රයාගේ; යට, අධොභාගයෙහි; සුදුපට, ශ්වේතපටයෙන්; අතුළ, ආස්තෘතවූ; තුඟු, උත්තුඞ්ගවූ;

සිංහාසනයේ පිට, සිංහවිෂ්ටරයෙන් කළ රාජ්‍යසමවතානයෙහි; ලොව, ලෝකය; එකෙළිකළ, ඒකාලෝක කළාවූ; රිවි, සූර්යයා; උදයගට, උදයපර්වතාග්‍රයට; නැඟි මෙන්; අරුණුවූ වාක් මෙන්; දුළ, උජ්ජ්වලිතවූ; පැරකුම්බුජනරනිඳු, ශ්‍රීපරාක්‍රම බාහු නරේන්ද්‍රයා; උන්කලට, උපවිෂ්ටවූ කල්හි—

48 ස හ ස කිරණවන් දිලිමිණි බරණ රැ සින්
දි ගැ ස නුවන් තුටුකළ සොඳුරු රු රැ සින්
ති ද ස ඉසුරු සබ සුර කුමරුවන් ලෙ සින්
දෙ ප ස සිටිති සැදි රජ කුමරුවෝ ගො සින්

48 මිණිබරණ රැසින්, මාණික්‍යාභරණ රශ්මීන් කරණ කොටගෙන; සහසකිරණවන්, සහස්‍රකිරණයා මෙන්; දිලි, ජ්වලිතවූ; සොඳුරු, සුන්දරවූ; රුරැසින්, රූපශ්‍රීසංඛ්‍යාත දේහ කාන්තියෙන්; දිගැස, දීර්ඝාක්ෂීන්ගේ; නුවන්, නෙත්‍රයන්; තුටුකළ, තුෂ්ටකළාවූ; රජකුමරුවෝ, රාජකුමාරයෝතුමූ; ගොසින්, (රාජෝපස්ථානය පිණිස) ගමනය කොට; තිදස ඉසුරුසබ, ත්‍රිදශෛශ්වරයාගේ [ඉන්ද්‍රයාගේ] සභායෙහි; සුර කුමරුවන් ලෙසින්, දෙවකුමාරයන් පරිද්දෙන්; දෙපස, (සිංහාසනයාගේ) උභයපාර්ශ්වයෙහි; සැදී, සජ්ජිතවූ, සිටිති; ස්ථිතිය කෙරෙත්.

49 නො දැ න රුපුන් යස සඳසේ මස න්තේ
නොයෙ න තමා යස රැස පෑ දිස න්තේ
නි සැ ක ඒකනායක මැති මහ න්තේ
ප සෙ න සිටියි පිපිරුනමෙන් වස න්තේ

49 මසන්තේ, දර්ශමධ්‍යමාසාන්තයෙහි. හෙවත් අමාවක් දිනෙහි; සඳසේ, චන්ද්‍රයා මෙන්; රුපුන් යස, ශත්‍රූන්ගේ යශස; නොදැන, දර්ශනය නොකොට; නොයෙන දිසන්තේ, නෛකදිගන්තයෙහි; තමා යසරැස, තමාගේ යශෝරශ්මිය; පෑ, ප්‍රකාශකළාවූ; නිසැක, නිඃශඞ්කතවූ, ඒකනායක මහන්තේ මැති, ඒකනායකාභිධාන මහාමන්ත්‍රීතෙම; වසන්තේ, වසන්තසෘතුයෙහි; පිපිරුන මෙන්, පුෂ්පිත වෘක්ෂයක් මෙන්; පසෙන, පාර්ශ්වයෙක්හි; සිටියි, ස්ථිතිය කෙරේ.

50 මුනිඳුන් උපුල්වන්—සුරිඳුන් නරනිඳුන් වෙත

බැති සිත රකිනා නම පණ සතරවැනි කො ට
සතවෙත පතුරුවනා මෙත්කුලුණු හැමවි ට

සත්හස් ලියනා නිති—මැතිකුල තිරිවරංගමු

චණ්ඩා තපකිරණවන් තද-තෙදින් දැ ඩි
බණ්ඩාර නායක තානතුරු සිරින් හෙ ඩි

වි ක්‍ර ම වීර විරිඳුන් දැක නොපෑ පි ටි
ස ක්‍ර ම නිබොරු බස් මිස නොනෙපලනා සැ වී
අ ක්‍ර ම වංක ගුණ මදකුත් නොගෙනා සි ටි
වි ක්‍ර ම සිංහ අදිකාරග මැතිඳු සි ටි

50 මුනිඳුන්, මුනීන්ද්‍රයන්වහන්සේ කෙරෙහිද; උපුල්වන් සුරිඳුන්, උත්පලවර්ණ සුරේන්ද්‍රයන් කෙරෙහිද; නරනිඳුන් වෙත, (පරාක්‍රමබාහු) නරේන්ද්‍රයන් කෙරෙහිද; නමපණ, ස්වකීය ජීවිතය; සතරවැනි කොට, චතුර්ථ කොට; බැතිසිත, ආදරචිත්තය; රකින, රක්‍ෂාකරන්නාවූ; හැමවිට, සියලු වේලෙහි; සතවෙත, සත්ත්වයන් කෙරෙහි; මෙත්කුලුණු, මෛත්‍රීකරුණාවන්; පතුරුවන, ව්‍යාප්තකරන්නාවූ; නිති, අනවරතයෙන්, සත්හස් ලියන, රාජකීය ශාසනයන් ලිපි කරන්නාවූ; තිරිවරංගමු මැතිකුල, තිරිවරංගමු නම් මන්ත්‍රිකුලයෙහි (ජාතවූ); චණ්ඩාතපකිරණවන්, සූර්‍ය්‍යකිරණය වැනි; තදතෙදින්, ඝනබලතේජසින්; දැඩි, දෘඪවූ හෙවත් ගුපිතවූ; බණ්ඩාරනායක තනතුරුසිරින්, භාණ්ඩාගාරප්‍රධානස්ථානාන්තරශ්‍රියෙන්; හෙබි, ශොභිතවූ; වික්‍රම, ශෞර්‍ය්‍යාතිශය (ඇති); වීර, වීර්‍ය්‍යවත්වූ; විරිඳුන්, විරෝධීන්, දැක, දර්ශනය කොට; පිටි නොපෑ, පරාඞ්මුඛනූවූ; සක්‍රම, ක්‍රමාන්විතවූ හෙවත් පරම්පරාවිරෝධීනූවූ; නිබොරු බස් මිස, සත්‍යවචන මුත්; නොනෙපලන සැවී, (අනිකක්) කථනය නොකරන්නාවූ ප්‍රකෘති ඇති; අක්‍රමවංකගුණ, ක්‍රමවිරෝධය හා අනාර්ජවය යන අවගුණයන්; මදකුත්, ස්වල්පය කුත්, නොගෙන සිටි. ග්‍රහණය නොකොට සිටිනාවූ; වික්‍රමසිංහ

අදිකාරගමැතිඳු, වික්‍රමසිංහාධිකාරිනම් අග්‍රමන්ත්‍රීන්ද්‍රතෙම; සිටි, (පාර්ශ්වයෙක) ස්ථිතිය කෙරේ.

51 කැ මැ ති ලෙසි න් පා නා අවිසරම ත ද
බ ලැ ති නොපිපි පානා ශුදමැදට වැ ද
රු වැ ති අන ගි නා නා අබරණ පැල ද
සි ටි ති දෙප ස සෙ නා නායක වරු ද

51 කැමැති ලෙසින්; අභිලාෂය පරිද්දෙන්; තද, ඝනබද්ධවූ; අවිසරම, අශුද්ධශිල්පාභිනයය; පානා, ප්‍රකාශකරන්නාවූ; ශුද මැදට, ශුද්ධමධ්‍යයට; වැද, ප්‍රවිෂ්ටවැ; නොපිපිපානා, පරබ්බූව නොවන්නාවූ; සේනානායකවරුද, සෙනාපතීහුද; රුවැති, වර්ණවත්වූ; නානාඅබරණ, නානාවිධ ආභරණයන්; පැලඳ, ප්‍රසාධනය කොට; දෙපස, උභයපාර්ශ්වයෙහි; සිටිති, ස්ථිතිය කෙරෙත්.

52 ආ කා ල ගිය කාලත් දැන අකුසලින් මි දී
මී ත ල රකිනා නිරිඳුන්සේව නිතිල දී
සී තා ල නිබොරු තෙපුලෙන් සතසෙතටයෙ දී
වා ස ල මුදලිවරු හැම සිටිති එහි සැ දී

52 ආකාල, වර්තමාන කාලයද; ගියකාලත්, අතීතකාලයද; දැන, ඥානය කොට; අකුසලින්, අකුශලක්‍රියායෙන්; මිදී, මුක්තවැ, මීතල රකින, පෘථිවිය පාලනය කරන්නාවූ; නිරිඳුන්, නරේන්ද්‍රයන්ගේ; සේව, සෙවනය; නිති, අනවරතයෙන්; ලදී, ප්‍රතිලාභ කළාවූ; සීතල, (දයාවෙන්) ආර්ද්‍රවූ; හෙවත් අක්‍රෑරභාවයින් සිසිල්වූ; නිබොරු, මිථ්‍යානොවූ; තෙපුලෙන්, (කරුණාසහගත සත්‍ය) වචනයෙන්; සත, සත්ත්ව සමූහයා; සෙතට යෙදී, ශාන්තියට යුක්ත කළාවූ; හෙවත් සැපතට පත්කළාවූ; වාසල මුදලිවරු, රාජභවනයෙහි ප්‍රධාන මන්ත්‍රීහු; හැම, සියල්ලදෙනා; එහි, ඒ රාජසභායෙහි; සැදී, (සර්වාභරණයෙන්) සජ්ජිතවැ; සිටිති, ස්ථිතිය කෙරෙත්.

53 නො ච සසලේ දූන අයවැයදමේ සැ ටිත්
සඳ ස ස ලේ ලෙස එකතුව නොපෑ පි ටිත්
මු ව ක ම ලේ බොරු නොවකා සිතේ ලෙ ටිත්
අ ර මු ද ලේ ලේකම් මුදලිවරු සි ටිත්

53 සසලේ නොව, චචල නොව; අයවැයදමේ, ආයව්‍යය ධර්මයෙහි; සැටිත්, ආකාරයන්; දූන, ජානනය කොට; සඳ සසලේ ලෙස, චන්ද්‍රයා හා ශශලෙඛාව පරිද්දෙන්; එකතුව, එකීභූතව; පිටිත් නොපෑ, පරාබද්ධ නොව; මුවකමලේ මුඛපද්මයෙහි; බොරු, මෘෂාවද, සිතේ, චිත්තයෙහි; ලෙටිත් මාත්‍රයක්හෝද; නොවකා, මුක්‍ෂණය නොකොට; අරමුදලේ (රාජකීය) රක්‍ෂිතව්‍ය ධනයෙහි; ලේකම් මුදලිවරු, ලෙඛක ප්‍රධානමන්ත්‍රීහු; සිටිත්, ස්ථිතිය කෙරෙත්,

54 වි ම ති නොවී දූනගෙන අදිකරණ අ රුත්
පැ ව ති ලෙසම කියමින් හැමතැනම සු රුත්
නැව ති සිතින් අකුසල් අවගුණත් බො රුත්
සි ටි ති පසෙක වාසල මුකවෙට්ටිව රුත්

54 විමති නොවී, සංශයෙන් යුක්ත නොව; අදිකරණ අරුත්, අධිකරණාර්ථයන්; දූනගෙන, ජානනය කොට; පැවති ලෙසම, ප්‍රවෘත්තාකාරයෙන්ම, හෙවත් තත්වූපරිද්දෙන්ම; හැමතැනම, සකලස්ථානයෙහිම; සුරුත්, ශොභනවූ නිශ්චිතාර්ථයන්; කියමින්, කථනය කරෙමින්; අකුසල්, (ප්‍රාණවධාදි) අකුශලයන්ද; අවගුණත්, (ඊර්ෂ්‍යාසූයාදි) දුර්ගුණයන්ද; බොරුත්, අසත්‍යයද, සිතින්, චිත්තසන්තානයෙන්; නැවති, නිවාරණය කළාවූ; වාසල මුකවෙට්ටිවරුත්, රාජගාරික අධිකරණ මන්ත්‍රීහුද; පසෙක, පාර්ශ්වයෙක්හි; සිටිති, ස්ථිතිය කෙරෙත්,

55 මෙ සේ නොයෙක් මැතිසෙන් පිවිස සිටීස දේ
ඒ සේ සිටිනා පරසිඳු මැතිවරුන් මැ දේ
ල සේ නොගොස් අවසරලත් විටෙක වැ දේ
නොසේ වෙමින් තොප අවසර ගැනුම් ගැ දේ

55 මෙසේ, මේ උක්තප්‍රකාරවූ; නොයෙක් මැතිසන්, අනේක මන්ත්‍රිසේනාව; පිවිස, (රාජසභාවට) ප්‍රවිෂ්ටවූ; සිටි සඳ, ස්ථිතවූ කල්හි; එසේ, ඒ පරිද්දෙන්; සිවිය, (එකත් පස්ව) ස්ථිතිය කරන්නාවූ; පරසිඳු මැතිවරුන්, ප්‍රසිද්ධ මන්ත්‍රී වරයන්ගේ; මැදේ, මධ්‍යයෙහි; ලසේ, ශීඝ්‍රව, නොහොත්, ගමනය නොකොට; අවසරලත් විටෙක, ලබ්ධාවකාශවූ ක්ෂණ යෙක්හි; වැදේ, ප්‍රවිෂ්ටවූ; තොසේ වෙමින්, සන්තුෂ්ට වෙමින්; තොප, ගුණවත්හු විසින්; අවසර ගැනුම්, අවකාශග්‍රහණය; යෙදේ, යුක්ත වෙයි; සුදුසුවෙයි සේයි.

56 වන්ඉඳු සබාවට—සබාවෙන් ගුරුළිඳුගේ
නරනිඳු සබාවට ඒ-නොබා වැද මිතුර තොද සිතසේ.

56 මිතුර, මිත්‍රය; තොද, ගුණවත් තෙමේද; ඉඳුසභාවට, ඉන්ද්‍රයාගේ සභාවට; වන්, ප්‍රවිෂ්ටවූ; ගුරුළිඳුගේ, (විශ්‍රුතවූ) ගරුඬේන්ද්‍රයාගේ; සබාවෙන්, ස්වභාවයෙන්, හෙවත් ගරුඬ පක්ෂිරාජයා පරිද්දෙන්; ඒ නරනිඳු සබාවට, ඒ පූර්වෝක්ත රාජ සභාභ්‍යන්තරයට; නොබා, අභීතව; වැද, ප්‍රවිෂ්ටව—

57 ඇසි පි ය පමණෙකින් පෑ නරගනන් ර ගේ
සිත පි ය වඩන රුසිරෙන් නරනිඳුන් ළ ගේ
සි ටි පි ය නොසොල්වා සිටිවරගනන් ර ගේ
දැක පි ය මිතුර නෙත සිත සතුටුකර තා ගේ

57. ඇසිපිය පමණෙකින්, අක්ෂිපක්ෂ්ම (ස්පන්දන) මාත්‍රයෙකින්; නරගනන් රගේ, මනුෂ්‍යාංගනාවන්ගේ ආකාරය; පෑ, ප්‍රකාශකොට; සිත පියවඩන, හෘදයානන්දකරවූ; රුසිරෙන්, රූපශ්‍රීන් (යුක්තව); නරනිඳුන් ළගේ, නරේන්ද්‍රයාණන් සමීපයෙහි; සිටි පිය නොසොල්වා, ස්ථිතපාදයන් චලිත නොකොට; සිටි, ස්ථිතවූ; වරගනන්, උත්තමාංගනාවන්ගේ; රගේ, ආකාරය; මිතුර, මිත්‍රය; තාගේ, ගුණවත්හුගේ; නෙත, නෙත්‍රයන්ද; සිත, චිත්තයද; සතුටුකැරු, සන්තුෂ්ට කොට; දැකපිය, දර්ශනය කර.

58 වැහෙන තුනෙරහැලි මෙන් පැතිරගෙන තුබේ
සලනා සෙමෙර පවනින් ඉතිර ගෙන සබේ
දුවනා සිහිල් සොඳ සුවඳැති පහස ලැබේ
ගිමනා නිවෙයි නරනිඳු දුටුතැනම තුඹේ

58. තුබේ, ආකාශයෙහි; පැතිරගෙන, ව්‍යාප්තවෙගෙන; වැහෙන, වහනය වන්නාවූ; තුනෙර හැලිමෙන්, වෙරුනික්ෂීර ගත් මෙන්; සලන, විජනමානවූ; සෙමෙර, චාමරයන් සම්බන්ධිවූ; පවනින්, මාරුතය කරණකොටගෙන; සබේ, රාජසභාව; ඉතිරගෙන, අතිරික්තකොට, දුවන, ධාවනය කරන්නාවූ; සුවඳැති, සුගන්ධාන්විතවූ; සොඳ, සුන්දරවූ; සිහිල් පහස, ශීත ස්පර්ශය; ලැබේ, ලබ්ධවෙයි; (එහෙයින්) නරනිඳු, නරෙන්ද්‍රයා; දුටුතැනම, දර්ශනය කළ තන්හිදීම; තුඹේ, යුෂ්මත්හුගේ; ගිමන, ග්‍රීෂ්මය; නිවේ, නිර්වෘත වේ.

59 දින් දුන් කිරණමෙන් මැතිමුව සියපත ට
යළි දුන් රහස් යව්වන් රජු සවනත ට
කොඬොලින් නික්ම මිණිරුස් පැතිරෙයි අව ට
වනමෙන් පහන්වෙයි එමකිරණ තාසිත ට

59 මැතිමුව, මන්ත්‍රීන්ගේ මුහුණු නමැති; සියපතට, ශත පත්‍ර සමූහයට; දිනිඳුන් කිරණ මෙන්, සූර්‍ය්‍යකිරණය මෙන්ද; යළි, නැවද; රජු, නරෙන්ද්‍රයාගේ; සවනතට, ශ්‍රවණද්වයට, දුන්, (මන්ත්‍රීන් විසින්) දෙනලද; රහස්යව්වන්, රහස්‍ය යෂ්ටිමෙන්ද; කොඬොලින්, කුණ්ඩලාභරණයෙන්; මිණිරුස්, මාණික්‍ය රශ්මිය; නික්ම, නිෂ්ක්‍රාන්තවැ; අවට, හාත්පස්හි; පැතිරෙයි, ව්‍යාප්තවෙයි; එම කිරණ, එම (මාණික්‍ය) රශ්මිය; තසිතට, තාගේ චිත්තාභ්‍යන්තරයට; වනමෙන්, ප්‍රවේශවූවාක්මෙන්; පහන්වෙයි, (චිත්තය) ප්‍රසන්න වේ.

60 සිනිඳු පහන් පැහැඇති දෙයම එක්කො ට
පසිඳු සබය පිරිබඩ ගන්නා ලෙස ට
නිරිඳු බරණ රුස් පැතිරෙයි වටින් ව ට
එසිඳු බලාසිට තාගෙ සිත සතුටුකො ට

60 සිහිඳු, සනිඳුවූ; පහන්, ප්‍රසන්නවූ; පැහැ ඇති දෙයම, ප්‍රභාමත් ද්‍රව්‍යයන්ම; එක්කොට, එකස්ථානයෙක්හි රැස් කොට; පසිඳු සබය, ප්‍රසිද්ධවූ (රාජ) සභාව; පිරිබඹයන්නා ලෙසට, පරිභ්‍රමණය කරන්නාක්මෙන්; විවින් විට, ක්ෂණක්ෂණයෙහි; නිරිඳු, නිරේන්ද්‍රයාගේ; අබරණ, වතුසශ්‍රී ආභරණයන් සම්බන්ධවූ; රුස්, රශ්මිය; පැතිරෙයි, ව්‍යාප්තවෙයි; එසිඳු, ඒ (රශ්මිව්‍යාප්තිය)ද; බලාසිට, අවලෝකනයකොට සිටිනවුන්; තෙගෙ, ශූෂමත්හුගේ; සිත, චිත්තය; සතුටුකොට, සන්තුෂ්ට කොට--

61 ලොව ට පි හි ට ව න්නු හ ට නොපයන යතු ර
සි ත ට සි ත ට එම කොට වඩමින් අද ර
පි ය ට පි ය ට බල කොට ගෙන සිතෙයිවැ ර
එ වි ට ර ජු ට නමකොට රුගෙන අවස ර

61 නොප, ශූෂමත්හු විසින්; යන යතුර, කරහුලබන්නාවූ ප්‍රයාණය; ලොවට, ලෝකයාහට; පිහිටවන්නුහට, ප්‍රතිෂ්ඨාවන්නු පිණිස වේ. (එහෙයින්); සිතට සිතට, චිත්තයෙන් චිත්තයට; එමකොට, ඒ කාරණයම (ආලම්බන්‍ය)කොට; අදර, ආදරය; වඩමින්; වර්ධනය කෙරෙමින්; පියට පියට, පියවරක් පියවරක් පාසා, නොහොත් පදප්‍රහාරයක් පාසා; සිතෙයි, චිත්තයෙහි; වැර, වීර්‍ය්‍ය; බලකොටගෙන, ශක්තිකොටගෙන; එවිට, තත්ක්ෂණයෙහි; රජුට, (ශ්‍රීපරාක්‍රමබාහු) නරේන්ද්‍රයාහට; නමකොට, නමස්කාරකොට, අවසර රුගෙන, අවකාශ ග්‍රහණය කොට—

62 තු ස ර තු ස ර කරස්නිලසකැරු ඉ ක්ම
අ ඹ ර ත ඹ ර කරදිනකර එනනෙ ක්ම
බැහැර නොහැර සිත සිහිකැරු පිරිත ක්ම
ති ස ර ති ස ර මමිතුර මෙපුරෙන් නි ක්ම

62 තිසරතිසර, ශාංකාශ්‍රෂ්ඨවූ; මමිතුර, මාගේ මිත්‍රය, තුසර, තුෂාරයාගේද; තුසරකර, චන්ද්‍රයාගේද; සිහිලස; ශෛත්‍යය; ඉක්මකැරු, අතික්‍රාන්තකොට; අඹර, ආකාශ නමැති; තඹරකර, පද්මාකරයට; දිනකර, දිවාකරයා; එන

තෙක්ම, ආගමනය කරනකල්හිම; හෙවත් සූර්‍යෝදය කාලයෙහිම; සිත, චිත්තය; බැහැර, බාහිර අරමුණෙක්හි; නොහැර, විසර්ජනය නොකොට; පිරිතක්ම, පරිත්‍රාණ ධර්‍මයක්ම; සිහිකැර, සමරණයකොට; මෙපුරෙන්, මේ නගරයෙන්; නික්ම, නිෂ්ක්‍රාන්ත ව.

63 සු පි පි ක ම ල් මහනෙ ල් පෙති ඇතිරිපි ට
හුන් බි ගු දැ ල් ඒ ත නි ල් බිජුවට රග ට
දිසි ම න ක ල් ව හ ස ල් දෙර ඉදිරි පි ට
සි ට ම ඳ ක ල් සු වි ස ල් කොන්තාගංතො ට

63 සුපිපි, සුපුෂ්පිතවූ; කමල් මහනෙල්පෙති, පද්මොත්පල පත්‍ර නමැති; ඇතිරිපිට, ආස්තරණ මස්තකයෙහි; හුන්, උපවිෂ්ට වූ; බිගුදැල්, භෘඞ්ගසමූහයා; නිල්බිජුවට රඟට, නීලබීජයන්ගේ ආකාරයට; එත, ආගමනය කරනකල්හි; මනකල්, මනොඥ වූ; දිසි, දෘශ්‍යමානවූ; වහසල් දෙර, ගොපුරයාගේ; ඉදිරිපිට, අභිමුඛයෙහිවූ; සුවිසල්, අතිවිශාලවූ; කොන්තාගංතොට, එනම් නදීතීර්ථයෙහි; මඳකල්, ස්වල්පකාලයක්; සිට, ස්ථිතිය කොට—

64 තද ව නොගොස් ඝනරඟනොපෙනෙනරඟට
ම ද ව නොගොස් මඳනුවණේ ගති රඟට
ඇද ව නොගොස් දුදනන්ගේ සිත රඟට
නද ව නොගොස් දියපිට නොසිටන රඟට

64 ඝන රඟ, ගමනය කරන ආකාරය; නොපෙනෙන රඟට, අදෘශ්‍යමාන වනපරිච්ඡෙදන්; තදව, ශීඝ්‍රවූ; නොගොස්, ගමනය නොකොට; මඳනුවණේ, මන්දබුද්ධියගේ; ගතිරඟට, ගමන පරිච්ඡෙදන්; මදවූ, අශීඝ්‍රවූ; නොගොස්, ගමනය නොකොට; දුදනන්ගේ, දුර්ජනයන්ගේ; සිත රඟට, චිත්තය මෙන්, ඇදව, වක්‍රවූ; නොගොස්, ගමනය නොකොට; තරඟට, තරඞ්ගයට; නදව, සන්තුෂ්ටවූ; දියපිට, ජලමස්තකයෙහි; නොගොස්, ගමනය නොකොට; නොසිට, (ජලමස්තකයෙහි) ස්ථිතියද නොකොට—

65 තු ලා ගන ව ලා කුළුවිදුලි විදිය
නි ලා මන කා ලා තුරුදෙපස විදිය
දු ලා වන ම ලා මැලි සුවඳ විදිය
බ ලා සි රි ප ලා ගොස් එතොට විදිය

65 ගන, ඝනවූ; වලාකුළු, වලාහකකූටයන් හාද; විදුලි විදිය, විද්‍යුත්පඞ්ක්තිය හාද; තුලා තුල්‍යවූ; විදිය දෙපස, විථියගේ උභයපාර්ශ්වයෙහි; නිලා, ශ්‍යාමායමානවූ; මනකලා, මනොඥවූ; තුරු, වෘක්ෂයන්ගේද; දුලාවන, උජ්ජ්වලිතවන්නාවූ; සුවඳ විදිය, සුගන්ධ විහිදුවන්නාවූ, මලාමැලි, කුඹු මහත් පුෂ්පයන්ගේද; සිරි, ශොභාව; බලා, නිරීක්ෂණය කෙරෙමින්; එතොටවිදිය, පරතීර්විථියෙහි; පලාගොස්, ප්‍රයාණය කොට—

66 ලැග ය නාවා යෙහෙකැයි අම්බලම කො ට
ත ර ය ල වා සතසැනහී යනා ලෙස ට
උ ද ය දි වා කර මැති කරවූ රුව ට
උ ද ය දි වා කර පොකුණේ ගොසින් සි ට

66 ලැග, වාසයකොට; යනවා, ප්‍රයාණය කිරීම; යෙහෙකැයි, යහපතැයි; හොවත් මගීන්ට සැපයෙකැයි [යන සිතින්]; අම්බලම කොට, විශ්‍රාමශාලාවක් කොට; සත, සත්වයන්; තරය, ත්වරාව හෙවත් ගමනවෙගය; ලවා, වර්ජිත කොට; සැනහී, සනාතවැ නොහොත් සන්තෘප්තවැ; යන ලෙසට, ගමනය කරන පරිද්දෙන්; උදය දිවාකරමැති, උදයදිවාකර නම් මන්ත්‍රීශ්වර විසින්; රුවට, මනාකොට: කරවූ, කාරිතවූ; උදයදිවාකර පොකුණේ, උදයදිවාකර නම් පුෂ්කරිණියෙහි; ගොසින්, ගමනය කොට; සිට, ස්ථිතවැ.—

67 පි යා මැද පි යා මුළුලොවට එවිට ම
පි යා වනපි යා වනගමන නොහැර ම
පි යා ශුභ පි යා ගෙනා නොගොසින් මග ම
පි යා සර පි යා සර කර මිතුරුතු ම

67 පියාසර, ප්‍රියවූ ආචාර ඇති; මිතුරු තුම, මිත්‍රොත්තමය; එවිටම, තත්ක්ෂණයෙහිම; මුළුලොවට, සකල ලොකයාහට; පියාවන, ප්‍රියවන්නාවූ; පියා, පක්ෂපාත්‍රයන්; මැදපියා, මාධ්‍යස්ථය කොට; හෙවත් පිරිසිදුකොට; පියාවන, ප්‍රියකාව්‍යබහුල අරණ්‍යයෙහි; ගමන, යාත්‍රාව; නොහැරම, වර්ජිත නොකොටම; පියාහුග, පක්ෂයුග්මය; පියාගෙන, ආකුචනය කොට; මගම, (ගුම්) මාර්ගයෙහිම; නොගොසින්, ගමනය නොකොට; පියාසර කර, (නභොමාර්ගයෙහි) පක්ෂප්‍රසාරණය කර.

68 සරද වලා කුළුලෙස පැතිර නො ගොසිනි
දුවනබලා වැළ සහ විලට නො ගොසිනි
මිතුරබලා පිපිවන පිරිබිඟු ගොසිනි
සතුටුව ලා වනතින් මඳතැන් ගොසිනි

68 මිතුර, මිත්‍රය; සරදවලාකුළු ලෙස, ශරද්වලාහකකූටයක්මෙන්; පැතිර නොගොසිනි, ව්‍යාප්තව නොගොස්; දුවන, ධාවනය කරන්නාවූ; බලාවැළ සහ, බලාකාවලිය හා සමග; විලට, තඩාගයට; නොගොසිනි, ගමනය නොකොට; බිඟු ගොසිනි, භෘඞ්ගයන්ගේ ඣඞ්කාරනාදයෙන්; පිරි, පූර්ණවූ; පිපිවන, පුෂ්පිතවනය; බලා, අවලොකනයකොට; සතුටුවලා, සන්තුෂ්ටව; වනතින්, වන ප්‍රදෙශයෙන්; මඳතැන්, ස්වල්ප ස්ථානයක්; (මඳදුරක්); ගොසිනි, ගමනය කොට—

69 වනසැ වු ලේ දෙනාපියනාද අසාගෙ නේ
මගතැ වූ ලේ හැරසිටි තොපට සබඳි නේ
බ ව අ වූ ලේ දුරලන මොක් පුරය මෙ නේ
ගුරුබැ වූ ලේ සරියට මහවෙහෙර පෙ නේ

69 සබඳිනේ; මිත්‍රයාණනි; වනසැවූලේ, වනකුක්කුටයන් විසින්; දෙන, දානය කරන්නාවූ; පියනද, ප්‍රියවූ නාදයන්; අසාගෙනේ, ශ්‍රවණයකොටගෙන, මගතැවූලේ, මාර්ගතාපය; හැර, වර්ජිතකොට; සිටි, ස්ථිතවූ, තොපට, යුෂ්මත්හට; බව අවූලේ, භවසඞ්ඛාරය, හෙවත් සංසාරභය; දුරලන, දුරීභූත කරන්නාවූ; මොක්පුරය මෙනේ, මොක්ෂපුරය මෙන්; ගුරු

බැවුලේ සමීපයම, ගුරුබැවුල නම් උත්තරප්‍රදෙශය* සමීපයෙහි; මහාවෙහෙර, (කීර්ති ශ්‍රී මෙඝවර්ණ) මහාවිහාරය; පෙනේ, දෘශ්‍යමාන වේ.

70 තු න් දො ස් දුරැර සිත මුනිපුදට සතු වුව
පි න් රැ ස් කරන සැදැහෙන් ඇමට පෙර වුව
නා න් ස ස් කෙත්වතින් නිති සැදුණු නොප වුව
ම න් තොස් කරව දැක වම්පසෙහි ගොත වුව

70 සිත, චිත්තයෙහි තුන්දොස්, (ලොභද්වෙෂ මොහ සඞ්ඛ්‍යාත) දොෂත්‍රය; දුරැර, දුරීභූත කොට; මුනිපුදට, බුද්ධ පූජනයට; සතුවුව, සන්තුෂ්ටවූ; සැදැහෙන්, ශ්‍රද්ධාව කරණ කොටගෙන; ඇමට, හැමදෙනාහට; පෙරවුව, පූර්වස්ථවූ; පින්රැස්කරන, පුණ්‍යසමය කරන්නවුන්ගෙන්ද; නන්සස්, නානාවිධ ශස්‍යයෙන් යුක්තවූ; කෙත්, ක්ෂෙත්‍රයෙන් හා; වතින්, වාසයොග්‍ය භූමිසඞ්ඛ්‍යාත වාස්තුයෙන්ද; නොපවුව, අනල්පවූ; නිති, නිරන්තරයෙන්; සැදි, සජ්ජිතවූ; වම්පසෙහි, [ගුරුබැවුලෙහි යන්නාවූ තොපට] වාමපාර්ශ්වයෙහිවූ; ගොත වුව, එනම් ග්‍රාමය; දැක, දර්ශනය කොට; මන්, චිත්තය; තොස් කරව; සන්තුෂ්ටකරව.

71 පැ ල ඳ බරණ පිපිදෙඹතුරු වන පිවි ස
සු ව ඳ විසිඳි මල්කැන් ගවසා සිර ස
බොල ඳ ලඳුන් සිටිනා සුරඟනන්ලෙ ස
වෙ ළ ඳ ගොබද සිරිනරඹව දකුණුප ස

71 අබරණ, ආභරණයන්; පැලඳ, ප්‍රසාධනය කොට; පිපි, පුෂ්පිතවූ; දෙඹතුරුවන, පුන්නාගවෘක්ෂයෙන් යුක්ත වනයට; පිවිස, ප්‍රවිෂ්ටවූ; සුවඳ විසිඳ, සුගන්ධයෙන් ව්‍යාප්තවූ; මල් කැන්, පුෂ්පමඤ්ජරියෙන්; සිරස, ශීර්ෂය; ගවසා, සජ්ජනා කොට; හෙවත් හිස වසා පුරවාගෙන; බොලඳ ලඳුන්, මුග්ධවූ කාන්තාවන්; සුරඟනන් ලෙස, දෙවඟනන් පරිද්දෙන්; සිටිනා, ස්ථිතිය කරන්නාවූ; දකුණුපස, (යන්නාවූ යුෂ්මත්හට) දක්ෂිණපාර්ශ්වයෙහිවූ; වෙළඳගොබද, වෙළඳගොඩ නම් ග්‍රාමයෙහිද; සිරි, ශොභාව; නරඹව, නිරීක්ෂණය කරව.

* මෙකල "වාණගුරුගොඩැල්ල" යයි ව්‍යවහාරයි.

72 අඟට ගෙන රත්මැට්—සිටදිගට කුර අදිමින්
ගවයන් සිට් පොරට—ඔච්චි බලා සතුටින්

72 අඟට, ශෘඞ්ගයට; රත්මැටි, රක්තවර්ණවූ මෘත්තිකා වන්; ගෙන, ග්‍රහණයකොට; සිට, සිටියාවූ; දිගට, ආයාමයට; කුර අදිමින්, ක්‍ෂුරකර්ෂණය කෙරෙමින්; ගවයන්; වෘෂභයන්; පොරට, යුද්ධ පිණිස (පොර ඇනගැන්ම පිණිස); සිටි, සිටිතවූ; ඔච්චි, තද්ගතසතත නිමනභූමින්, සතුටින්, සන්තුෂ්ටියෙන් බලා, අවලෝකනය කොට—

73 අ ත් ස රි මේ යසි යනලෙසට එගොඩ ට
කි ත් සි රි මේ වන්රජු කැරුවූ රුව ට
සි ත් පි රි මේ වරයුතු විසිතුරුරඟ ට
කි ත් සි රි මේ වන් වෙහෙරට ගොසින්සි ට

73 එගොඩට, පරතීරයට; හෙවත් පරතීරස්ථවූ මහාවිහාර යට; අත්සරි, දීඝායාමයය; මේයයි, මේතෙමේයයි; යන ලෙසට, කථනය කරන පරිද්දෙන්; කිත්සිරිමේවන් රජු, කීර්තිශ්‍රීමේඝවර්ණ නරේන්ද්‍රයන්විසින්; රුවට, මනොඥ කොට; කැරුවූ, කාරිතවූ; විසිතුරු රඟට, විචිත්‍රවූ ආකාර යෙන්; සිත්පිරි, චිත්තප්‍රීණනය කරන්නාවූ; මේවරයුතු, කර්මාන්තයෙන් යුක්තවූ; කිත්සිරිමේවන් වෙහෙරට. කීර්තිශ්‍රී මේඝවර්ණ විහාරයට; ගොසින්, ගමනයකොට; සිට, සිටිනව—

74 කා ම ද කා ම ද පස්කඳ සබව හෙළිකො ට
ව ර ද ව ර ද හැර පින්කළ සව්සත ට
ස ර ද ස ර ද සඳවැනි වතැති මුනිඳු ට
නැමද නැමද සිත අදරින්ම සිහිකො ට

74 කාමද, කාමභවයෙහිද; අකාමද, කාමභවයෙන් පිටත් රූපාරූපභවද්වයෙහිද්‍වූ; පස්කඳ, ස්කන්ධ පංචකයාගේ; සබව, පංචාශද්විධ උදයව්‍යයධර්මතාසංඛ්‍යාත ස්වභාවය; හෙළි කොට, ප්‍රකාශකොට; වරදවරද, කුඩා මහත් පාපයන්; හැර, වර්ජිතකොට; පින්කළ, පුණ්‍යකර්ම කළාවූ; සව්සතට; සකල(වෛනෙය) ජනයාහට; සරද, නිර්වාණ

සංඛ්‍යාත පරමාර්ථ සාරය ගෙනදෙන්නාවූ; සරද සඳවැනි වතැති, ශරච්චන්ද්‍ර මණ්ඩලාගමන වක්ත්‍රයක් ඇති; මුනිඳුව, මුනීන්ද්‍රයාහට; නැම, (උන්වහන්සේගේ නව අරහාදි බුද්ධ ගුණ) නාමයැ; සිත, (තමාගේ) චිත්තයෙහි; ඇඳ, අවලම්බන කොට; අදරින්ම, ආදරයෙන්ම; සිහිකොට, ස්මරණය කොට; නැමැද, නමස්කාර කොට--

75 දුටුව පබෝ දය වන ඝනසිත නිබ ද
පවතිනබෝ පුදවත් වෙසෙසින් නොම ද
මුනි පිරිබෝ කළ මුනිඳුතුවෙන් බ ද
සිරි මහබෝ දගැප් පැදකුණෙන් වැ ද

75 දුටුව, දර්ශනය කළහොත්; සත, සත්ත්වයාගේ; සිත, චිත්ත සන්තානය; පබෝදයවන, ප්‍රබෝධකරවන්නාවූ; නිබද, නිරන්තරයෙන්; නොමද, අමන්දවූ; වෙසෙසින්, (පුෂ්පදීප ධූපාදි) වස්තුවිශේෂයෙන්; පවතින, ප්‍රවෘත්තවන්නාවූ; බෝපුද, බොහෝ පූජාවිධාන ඇති; මුනිපිරිබෝකළ, භගවත් ශාක්‍යමුනීන්ද්‍රයින් පරිභොගකරනලද්දාවූද; මුනිඳුතුවෙන් බද, (ඒ) මුනිඳුගේ ධාතුවෙන් බඳනාලද්දාවූද; සිරිමහබෝ දගැප්, ශ්‍රීමහාබෝධි ධාතුගර්භ සංඛ්‍යාත චෛත්‍යද්වයම; පැදකුණින්, ප්‍රදක්ෂිණාකරණයෙන්; වැද, වන්දනය කොට—

76 සියල් දියත සතවෙත නිතියෙන් දුව නා
නිමල් මුනිඳුගේ සිතැමෙත්කුලුණු මෙ නා
විසල් සමුදුරට ගොස් නිතොරවැ වදි නා
සිහිල් සිලිල්පිරි ගංතෙරෙහි සිටගෙ නා

76 සියල් දියත, සකල ජගත්හි; සතවෙත, සත්ත්වයන්කරා; නිතියෙන්, නිරන්තරයෙන්; දුවන, ධාවනය කරන්නාවූ; මුනිඳුගේ, මුනීන්ද්‍රයන්වහන්සේගේ; නිමල්, නිර්මලවූ; සිතැ, චිත්තයෙහිවූ; මෙත්කුලුණුමෙන; මෛත්‍රීකරුණා ගුණයන් මෙන්; විසල් සමුදුරට, විශාලවූ සමුද්‍රය කරා; ගොස්, ගමනය කොට; නිතොර වැ, නිරන්තර වැ; වදිනා, ප්‍රවේශවන්නාවූ;

සිහිල් සිලිල්, ශීතල ජලයෙන්; පිරි, පූර්ණ වූ; නොහොත්— සිහිල් සිලිල් පිරි, ශීතලජලප්‍රවාහ ඇති; ගංතෙරෙහි, (කලන ණි) නදීතීරයෙහි; සිටගෙන, ඝටිතවූ—

77 සමනොළ මුදුනැසිරිපද ඔබනා මඟුල් ට
නිකසළ වහසඟනාගෙන වඩිනා මුනිඳු ට
පැහැදුළ සුනිල්මැණිකෙන් කළ මඟලෙස ට
මනාදෙළ පිරෙයි ගඟසිරිසර දුට තොප ට

77 සමනොළ මුදුනැ, සමන්තකූටපර්වතමස්තකයෙහි; සිරි පද ඔබන මඟුලට, ශ්‍රීපාදලාඤ්ඡනප්‍රතිෂ්ඨාපනමඞ්ගලය පිණිස; නිකසළ, (විගතශාද්වලයෙන්) නිර්මලවූ, මහසඟන, මහාසඞ්ඝයාවහන්සේ; ගෙන, ග්‍රහණයකොට; වඩින, ප්‍රයාණය කරන්නාවූ; මුනිඳුට, මුනීන්ද්‍රයන්වහන්සේ උදෙසා; සුනිල් මැණිකෙන්, මහානීල මාණික්‍යයෙන්; (ඉඳුනිල් මිණින්); කළ, කරනලද; මඟලෙසට, මාර්ගයක් මෙන්; පැහැදුළ, ප්‍රභාප්‍රජ්වලිතවූ; ගඟ, කලනණි නදියගේ; සිරිසර, ශ්‍රීසාරය; දුට, දර්ශනය කළහොත්; තොපට, යුෂ්මත්හුගේ; මනාදෙළ, මනොදෙහදය; පිරෙයි, පූර්ණවේ.

78 එළි කළ වටම රන්කොත් පහමුදු න්නේ*
බැඳගළ නෙදිගු යටගෙයි දද වැනෙ න්නේ
පැහැදුළ නොයෙකපහපෙළගඟපෙනෙන්නේ
ගඟතුළ උදුළ පුර වැනි නාරදු න්නේ

78 අවටම, හාත්පසම; එළිකළ, ආලෝක කළාවූ; රන් කොත්, සෞවර්ණශෘඞ්ග ඇති; පහ, ප්‍රාසාදයන්ගේ; මුදුන් නේ, මස්තකයෙහි; බැඳගළ, බන්ධනයකොට හරනලද; දද, ධ්වජ (සමූහ) තෙම; නෙදිගු, නෛකදිශා නමැති; යටගෙයි, යටාගෘහයෙහි; වැනෙන්නේ, කම්පිතවන්නේය; පැහැදුළ, ප්‍රභාප්‍රජ්වලිතවූ; නොයෙක පහපෙළ, පඞ්ක්තීන් පිහිටි අනෙකප්‍රාසාදසමූහතෙම; ගඟ, ගඞ්ගායෙහි; පෙනෙන්නේ, දෘශ්‍යමානවන්නේය; (මෙසේ හෙයින්;) ගඟතුළ, ගඞ්ගා භ්‍යන්තරය; නාරදුන්නේ, සාගරජයන්ගේ; උදුළ, උජ්ව ලිතවූ; පුරවැනි, නගරය වැන්න,

* 'මුදුන්නේ' සිද පාඨයි.

79 සු ර ඹ කෙළෙනා සුරගඟ තුල් තරඟයෙ නි
කා ළ ඹ නැඟී යන සිදුවිදුදරන් මෙ නි
කොළඹ විසල් වත්තල් පුත්තූරු වෙ නි
නා ර ඹ යනෙන වෙළඳුන් ඔරුපාරු වෙ නි

79 සුරඹ, දෙවඟනන්; කෙළෙන, ක්‍රීඩනය කරන්නාවූ; සුරගඟ, ස්වර්ණදියෙහි; තුල්. සදෘශවූ; තරඟයෙනි, තරඞ්ගයෙන්; කළඹ නැඟී, කාලාභ්‍රකූටයන්ට අරූඪව; යන, ගමනය කරන්නාවූ; සිදුවිදුදරන් මෙනි, සිද්ධවිද්‍යාධරයන් මෙන්; විසල්, විශාලවූ; කොළඹ, එනම් සමුද්‍රතීර්ථයෙහිද; වත්තල්, එනම් නිගමප්‍රදෙශයෙහිද; පුත්තූරුවෙනි, පුත්තූරු නම් අභිනවපට්ටනයෙහිද සිට; ඔරුපාරුවෙනි, ද්‍රෝණියෙන් හා මහාද්‍රෝණියෙන්; යනෙන, ගමනාගමනය කරන්නාවූ; වෙළඳුන්, වණිග්ජනයන්; නරඹ, නිරීක්ෂණය කර.

80 ලෙළෙනා නන් දද වැද පුර අඟ සේ
සි ටි නා පුර අඟනන් ගඟ දෙප සේ
කෙළි නා ලඳලිය ගඟදිය සිත සේ
ද කි නා තගෙ නෙත සිත වෙයි සතො සේ

80 පුරඅඟසේ, පුරාකාශයෙහි; වැද, ඝට්ටිතවූ; ලෙළෙනා, ලීලොපෙතවන්නාවූ; නන්දද, නානාප්‍රකාර ධ්වජයන්ද; ගඟදෙපසේ, ගඞ්ගාවගේ උභයපාර්ශ්වයෙහි; සිටිනා, ස්ථිතිය කරන්නාවූ, පුරඅඟනන්, පුරාඞ්ගනාවන්ද; සිතසේ, සිත්වූ පරිද්දෙන්; ගඟ, ගඞ්ගායෙහි; දියකෙළිනා, ජලක්‍රීඩනය කරන්නාවූ; ලඳලිය, තරුණාඞ්ගනාවන්ද; දකිනා, දර්ශනය කරන්නාවූ; තගෙ, ශූෂමත්හුගේ; නෙතසිත, නෙත්‍රය හා චිත්තය; සතොසේ වෙයි, සන්තුෂ්ටවේ.

81 සිතලොබ වඩමින් දුවු දුවුව න් නේ
නි ම ල ඹ තුරු දිව වෙතට උතු න් නේ
ලෙළ ප බ වතඟත කෙළනා ලඳු න් නේ
ගනා නැ බ සියරැළි විදුලිය වැ න් නේ

81 දුටු දුටුවන්නේ, දර්ශනය කළ කළ ජනයන්ගේ; සිත, චිත්තයෙහි; ලොබ, ලෝභය; වඩමින්, වර්ධනය කෙරෙමින්; නිමලඹතුරු, නිර්මලජලාභ්‍යන්තරයෙහි; ලගුන්නේ; අන්‍යොන්‍යයන්ගේ; වෙතට, සමීපයට; දිව, ධාවනය කොට කෙළන, ක්‍රීඩනය කරන්නාවූ; ලඳුන්නේ, කාන්තාවන්ගේ; වතගත, වක්ත්‍රගාත්‍රයන් පිළිබඳවූ; ලෙළ පබ, ලලිත ප්‍රභාසෞමෝ; ගනගැබ, මේඝගර්භයෙක්හි; සියරැළි, ආවෙලශිතයෙන් යුක්තවූ; විදුලිය වැන්නේ, විද්‍යුත්ප්‍රභා වැනිවේ.

82 ලෙළෙනා මෙන් ගඟ තරඟ කත නා ලි ය
කෙළ නා ලෙස එළිබැස දිව නා ලි ය
පි හි නා යන එන සොඳුරු ම නා ලි ය
සො බ නා රුසිරු නොහැකි ව නා ලි ය

82 ගඟතරඟ, ගඞ්ගාතරඞ්ගමස්තකයෙහි; කතනාලිය, කත කලනාවන්; ලෙළෙනාමෙන්, ලලිතවන්නාක්මෙන්ද; දිව නාලිය, දිව්‍යනාග කාන්තාවන්; එළිබැස, අභ්‍යවකාශයට අවතීර්ණවැ; කෙළනා ලෙස, ක්‍රීඩා කරන්නාක්මෙන්ද; පිහිනා යන එන, සන්තරණය කොට ගමනාගමනය කරන්නාවූ; සොඳුරු, සුන්දරවූ; මනාලිය, මනොඥකාන්තාවන්ගේ; සොබනා, ශොභමානවූ; රුසිරු, රූපශ්‍රිය; වනාලිය නොහැකි, වර්ණනාකළ නොහැකි (වේ).

83 මිනිසෙක් දිය පිනා යෙයි එ තර ට
අඟනක් දිය පිනා එ යී මෙතර ට
පහරක් දුන සරණින් ඔහු සිරස ට
අනිකක් ඇඹුවා එසදෙස දුර සි ට

83 මිනිසෙක්, පුරුෂයෙක්; දියපිනා, ජලතරණය කොට; එතරට, පරතීරයට; යෙයි, ගමනය කෙරෙයි; (එකල්හිම); අඟනක්, අඞ්ගනාවක්; දියපිනා, ජලතරණයකොට; මෙතරට, ඔරිමතීරයට; එයි, ආගමනය කෙරෙයි; (ඕතොමෝ) ඔහු, ඒ පුරුෂයාගේ; සිරසට, ශීර්ෂයට; සරණින්, චරණයෙන්;

පහරක් දුන, ප්‍රහාරයක් දුන්නිය; එසදෙහි, තත්කාලයෙහි; අනිකක්, (ඒ දුටු) අන්‍ය ස්ත්‍රියක් නොවේ; දුරසිටා, දුරයෙහි සිටවෑ; ඇඹුවා, රොදනය කළා.

84 අඟන තා පය ගෑ ලතු සිරසෙයි වැ කී
මිනිසෙක ගඟදිය කෙළියෙන් නොවැ ළෑ කී
අනිකා තා ඇස රතුවිය ලතු නොම වැ කී
ඇය ස තා එරතට වෙන දිය කරණෙ කී

84 අඟනක, අඞ්ගනාවකගේ; පය ගෑ, පාදයෙහි ආලිප්තවූ; ලතු, අලංකතය (ලාරසය); සිරසෙයි වැකී, ශීර්ෂයෙහි ම්‍රක්ෂිතවූ; මිනිසෙක, එක්තරා පුරුෂයෙක් නොව; ගඟ, ගඞ්ගායෙහි; දියකෙළියෙන්, ජලක්‍රීඩායෙන්; නොවැළෑකී, අපගත නොවිය; (එකල්හි,) අනිකක, අනික් තැනැත්තියකගේ; ඇස, චක්ෂුස; ලතු නොමවැකී, අලක්තයෙන් ම්‍රක්ෂිත නොවව; රතුවිය, රක්තවර්ණවිය; ඇය සක, ඇයගේ චක්ෂුයෙහි; එරතට, ඒරක්තභාවයට; වෙනදිය, අන්‍ය ජලක්ෂේත්‍රම; කරණෙකී, කාරණය වේ. වාෂ්පජලයෙන් රක්තවර්ණවිය යිසේයි.

85 දියමන් දියගති දැනගත් අය නි ති
පැනගං ඉඳුරෙන් දිය හී ගැඹුරු ති
ඉදිම් න් දියතුළ දුරගොස් ඉපිලෙ ති
දිය බුං දිය කෝකිල ගසමින් යෙ ති

85 දියමන්, ජලයාගේ ප්‍රමාණයද; දියගති, ජලයාගේ ශීඝ්‍රතාදි ගතිද; නිති, අනවරතයෙන්; දැනගත් අය, ඥානය කළ තැනැත්තෝ; ගංඉවුරෙන්, නදීකූලයෙන්; පැන, උල්ලංඝනය කොට; ගැඹුරැති, ගාම්භීර්යය ඇත්තාවූ; දිය, ජලයෙහි; හී, පතිතවෑ; දියතුළ, ජලාභ්‍යන්තරයෙහි; ඉදිමින්, නිමග්නව සිද; දුර ගොස්, දූරයෙහි ගමනය කොට; ඉපිලෙති, උන්මජ්ජනය කෙරෙති; දියබුං දියකෝකිල ගසමින්, දියබුං ගැසීමය දිය කෝකිල ගැස්මය යන ජල ධ්වනිවිශේෂයන් පවත්වමින්; යෙති, ගමනය කෙරෙත්.

86 පිහින ත උඹුකුරු වෙමිනාගනන් ග ග
සියප ත ඉඳුවර දිසි තිසරුන් ර ග
පැහැපත බිගුරළ කෙළනා මන ර ග
සිරිග ත ගඟ දිගු ගෙදිගු විලෙයා ර ග

86 අඟනන්, අඞ්ගනාවන්; උඹුකුරුවෙමින්, උත්තානවෙමින්; හෙවත් උඩුබලා; ගඟ, ගඞ්ගාවෙහි; පිහිනත, සන්තරණය කරන කල්හි; සියපත, ශතපත්‍රයන්ගේද; ඉඳුවර, ඉන්දීවර යන්ගේද; තිසරුන්, හංසයන්ගේද; රඟ, ආකාරය; දිසි, (වක්ත්‍රනෙත්‍රපයෝධරයන් කරණකොටගෙන) දෘශ්‍යමානවිය; පැහැපත, ප්‍රභාවත්වූ; බිගුරළ, භෘඞ්ගසමූහයා; මනරඟ, සිත්වූ පරිද්දෙන්; කෙළනා, ක්‍රීඩනය කරන්නාවූ; ගඟ, ගඞ්ගා තොරෙච්; දිගු, දීර්ඝවූ; ගෙදිගුවිල, ගෘහදීර්ඝිකානාමාගයක් හා; එකරඟ, එකාකාරවෑ; සිරි, ශෝභාව; ගත, ග්‍රහණය කළා.

87 තරඟ පැහැර ගතා කොකුමගරා ග තා
අඟනන් ලවනතා මද නොතිබිය ර තා
තලිතල දියහෙතා බියෙන් වැසුනෙ තා
පුන්සිසි රුස් පතා ඉඳුවර සිරි ග තා

87 තරඟ, තරඞ්ගයන්විසින්; ගතා, ශරීරයෙහි; කොකුමගරා, කුඞ්කුමාඞ්ගරාගයන්; පැහැරගතා, විලුම්පනයකොට ගත්කල්හි; අඟනන්, (එසින් කුපිතවූ) අඞ්ගනාවන්ගේ; ලවනතා, අධරයෙහි; මදරතා, මඳවූ රක්තවර්ණයද; නොතිබිය, ශෙෂනොවූයේය; තලින්, (හස්ත) තලයෙන්; අළ, හරනලද; දිය, ජලය; හෙතා, පතිතවනකල්හි, බියෙන්, භීතියෙන්; වැසූ, ඡාදිතවූ; නෙතා, (ඔවුන්ගේ) නෙත්‍රයෝ; පුන්සිසි රුස්, පූර්ණචන්ද්‍රරශ්මිය; පතා, ප්‍රාර්ථනාකොට (සිටියාවූ); හෙවත් ප්‍රබොධොන්මුඛවූ; ඉඳුවර, ඉන්දීවරයන්ගේ; සිරි, ශොභාව; ගතා, ග්‍රහණය කළහ.

88 මසෙක් ගොදුරු පතා මෙවුලේ මිණිග තා
එ ල දු න් බි ය ප තා ගත වෙවුලුම් ග තා
එමතුනොවෙයි ඉතා නිල් යෙවෙලැයි සි තා
කොමලඟනන් මුතා සරල් වරල්ග තා

88 මසෙක්, ව්‍යාඝ්‍රයෙක්හෙව; ගොදුරුපතා, ගොචරප්‍රියවූ; මෙවුලේ, මේඛලාභරණයෙහි; මිණි, මාණික්‍යය; ගතා, ග්‍රහණය කොළේය; බියපතා, භයප්‍රාප්තවූ; එලඳුන්, ඒකාන්තාවන්ගේ; ගත, ශරීරය; වෙව්ලුම්ගතා, කම්පාග්‍රහණය කෙළේය; එමතු නොවෙයි, තාවන්මාත්‍ර නොවෙයි; (එපමණෙකුත් නොවෙයි;) දුනා නිල්, අතිනීලවූ; සෙවෙලැයි, ශෛවාලයයි; සිතා, චින්තනයකොට; සොමිළගනන්, කොමලාඞ්ගනාවන්ගේ; මුතා, මුක්තවූ, සරල්, රැලි සහිතවූ; වරල්, කෙශකලාපය; ගතා, ග්‍රහණය කෙළේය.

89 පමණින් ත ම ග ලා ගත දියතුළ ග ලා
සිටි නා ම න ක ලා වුවනත මනාක ලා
සයුරෙහි පිරි ක ලා වැනි සඳ දිසික ලා
කෙළනා ලඳුන් බලා පයැද නොයෙති බ ලා

89 තමගලා පමණින්, තමන්ගේ කණ්ඨප්‍රමාණයෙන්; ගත, ශරීරය; දියතුළ, ජලාභ්‍යන්තරයෙහි; ගලා, නිමග්න කොට; සිටිනා, ස්ථිතිය කරන්නාවූ; මනකලා, මනොඥ කාන්තාවන්ගේ; මනකලා, මනඃකල්‍යවූ; වුවනත, වක්ත්‍රය; සයුරෙහි, සාගරයෙහි; පිරිකලා, පූර්ණවූ (ෂොඩශ) කලා ඇති; සඳවැනි, චන්ද්‍රයා බඳුව; දිසිකලා, දෘශ්‍යමානවූ කල්හි; කෙළන, ක්‍රීඩනය කරන්නාවූ; ලඳුන්, (ඒ) කාන්තාවන්; බලා, අවලොකනයකොට; පය ඇද, පාදය ආකර්ෂණයකොට; නොයෙති, [දුවූවෙ] ගමනය නොකරවෙති; බලා, (මෙ විස්මය) නිරීක්ෂණය කරව.

90 ගඟෙහි ගැඹුරු තැ නේ විමසා තැන තැ නේ
ගොසින් කිම්ද ගෙ නේ සුරතින් වැලිගෙ නේ
යළිනෙනා කොළි මි නේ පාමින් කෙළිමි නේ
දුටු ව න් සි ත ස් නේ වඩවති වෙසෙසී නේ

ගඟෙහි, ගඞ්ගාවෙහි; තැන තැනේ, තන්හි තන්හි; ගැඹුරු තැනේ, ගම්භීරස්ථානයන්; විමසා, විමංසනය කොට; කිම්දගෙනේ, නිමග්නව; ගොසින්, ගමනයකොට; සුරතින්, ශූරවූ හස්තයෙන්; වැලිගෙනේ, වාලුකා ග්‍රහණය කොට;

යළි, නැවත; කෙළිම්හෙන්, ක්‍රීඩාමණ්ඩපයන්හිද; ගෙන, ග්‍රහණයකොට; පාම්හෙන්, ප්‍රකාශකෙරෙමින්; කෙළිම්හෙන්, ක්‍රීඩනය කෙරෙමින්; දුටුවන්, දර්ශනය කළ ජනයන්ගේ; සිත, චිත්තයෙහි; වෙසෙසින්, විශේෂයෙන්; සිතේ, වඩවත්, ශෝභා වර්ණනය කරවත්.

91 සුරඟන සුරසමඟ–සුරගඟ කෙළින කෙළි සේ
බැස ගඟ කෙළින මනරඟ–කොමළඟන රඟ මෙලෙසි න්

91 සුරඟන, දිව්‍ය ස්ත්‍රීන්; සුර සමඟ, දෙවියන් හා සමග්‍රවූ; සුරගඟ, ස්වර්ගඞ්ගයෙහි; කෙළින, ක්‍රීඩනය කරන්නාවූ; කෙළිසේ, ජලක්‍රීඩාවන් පරිද්දෙන්; ගඟබැස, ගඞ්ගාවට අවතීර්ණවූ; මනරඟ, සිත්සේ; කෙළින, ක්‍රීඩාකරන්නාවූ; කොමළඟන, කෝමලාඞ්ගනාවන්ගේ; රඟ, (ක්‍රීඩා) විලාසය; මෙලෙසින්, මෙහි කියනලද පරිද්දෙන් [වේ].

92 දැ ක යන එන දනන් ලන ගොදුරෙන් ති ළිය
එ ක රඟ වරල් විදහා පෙනෙමින් එ ළිය
සැ ක නොව කෙළිවතළ මින් රළගත් රැ ළිය
දැ ක ගිය තොපට ගඟිනෙතරවූ මස්කෙ ළිය

92 යන එන, ගමනාගමනය කරන්නාවූ; දනන්, ජනයන් විසින්; දැක. දර්ශනයකොට; ලන, ප්‍රක්ෂිප්‍යමාණවූ; ගොදුරෙන්, ගොචරයෙන් (ආහාරයෙන්); තිළිය, තුෂ්ටවූ; එක රඟ, එකාකාරයෙන්; වරල් විදහා, පුච්ඡප්‍රසාරණයකොට; එළිය, අභ්‍යවකාශයෙහි; පෙනෙමින්, උල්ලඞ්ඝනය කෙරෙමින් නොහොත් දෘශ්‍යමාන වෙමින්; සැකනොව, නිඃශඞ්කිත වූ; කෙළිවතළ, ක්‍රීඩායෙහි ව්‍යාපෘතවූ; මින්රළ, මත්ස්‍ය සමූහයා කරණකොටගෙන; ගත්රැළිය, ගත්නාලද තරඞ්ග භඞ්ග ඇති; මස්කෙළිය, එනම් නදීස්ත්‍රීය; දැක, දර්ශනය කොට; ගඟින්, ගඞ්ගාවෙන්; එතරවූ, පරතීරප්‍රාප්තවූ; ගිය, ගමනය කළාවූ; තොපට, යුෂ්මත්හට—

93 මුණි පුදයට සපැමිණි නන් සුරන් රැ ස
එහි පුදකොට හැරගියර න් විමන් ලෙ ස
දිලි හැමවිට පහ දද ව න් ගුවන් කු ස
කැලණියදුට පැමිණෙයි මන් නුවන් තොස

93 මුනිපුදයට, බුද්ධපූජනය පිණිස; සපැමිණි, සම්ප්‍රාප්තවූ; නන්සුරන්රැස, නානාවිධ දෙවසමූහයන් විසින්; එහි, ඒ (චෛත්‍යවාණ විහාර) ස්ථානයෙහි; පුදකොට, පූජනය කොට; හැරගිය, [අපේක්ෂා රහිතව] දමාගියාවූ; රන්විමන් ලෙස, ස්වර්ණවිමානයන් මෙන්; හැමවිට, සියලු වේලෙහි; දිලි, (ප්‍රභායෙන්) ජ්වලිතවූ; පහ, ප්‍රාසාදයන්ගේ; දද, ධ්වජයන්; වන්, ප්‍රවිෂ්ටවූ; ගුවන්කුස, ගගනාභ්‍යන්තර ඇති; කැලණිය, කල්‍යාණී පුරය; දුට, දර්ශනය කළ කල්හි; මන්නුවන් තොස, මනොනයනයන් පිළිබඳ සන්තොෂය; පැමිණෙයි, ප්‍රාප්තවේ.

94 මිණිගණ සහ පැමිණි-සක්විති මිණිරුවන මෙ න්
දහසින් අඩ රහත් සඟගණ පිරිවරි න
අහසින් වැඩ රුසින් දිගුබිත තවරගෙ න
මිණිඅක්නයිදු කළ-මිණිමඩුව තුළ වැඩහි ද
මුනිඳු දිවබොජුන් වැළඳූ තැනෙහි න ද
මුනිඳු පිහිටුවා කළ දගැබට වැ ද
දෙමහල් තුන්මහ ල් මුන්හල් දිලිතොම ද
ගනාහල් දුල් තිම ල් බෝසල් පුද වැ ද
සුවිසල් පස් මහ ල් සඟසතු ගෙවල් මැ ද
මහ සල් දන් මහ ල් දැක උන් සඳ සබ ද

94 සබඳ, මිත්‍රය; මිණිගණ සහ, (පරිවාර) මාණික්‍ය සමූහයා හා සමග; පැමිණි, ප්‍රාප්තවූ; සක්විති මිණිරුවන මෙන්, චක්‍රවර්තිති රජකුගේ මාණික්‍ය රත්නය සේ; දහසින් අඩ, සහස්‍රයෙන් අර්ධයක් (පන්සියයක්) ප්‍රමාණවූ; රහත් සඟ ගණ, අර්හත්භික්ෂුසමූහ සඞ්ඛ්‍යාතවූ; පිරිවරින, පරිවාරයෙන් (යුක්තවූ); අහසින්, ආකාශයෙන්; වැඩ, ආගමනය කොට; රුසින්, (ෂඩ්වර්ණ බුද්ධ) රශ්මියෙන්; දිගුබිත, දිශා නම්වූ භිත්තීන්; තවරගෙන, ආලිප්ත කොට; මිණිඅක්නයිඳු, මණ්‍යක්ෂි

නාගකන්‍යා විසින්; කළ. නිර්මිත කරනලද; මිණිමුවුතුළ, මාණික්‍ය මණ්ඩපාභ්‍යන්තරයෙහි; වැඩහිඳ, උපවිෂ්ටවූ; මුනිඳු. මුනීන්ද්‍රයාණන්වහන්සේ; දිවබොජුන්, දිව්‍යභොජනය; වැළඳූ. වළඳනය කළාවූ; තෑනෙහි, ස්ථානයෙහි; තද, (මහනා) තන්‍දුනීයවූ; මුනිඳු, බුද්ධාතුන්; පිහිටුවා, ප්‍රතිෂ්ඨාපනය කොට; කළ, කරවාලද්දාවූ; දගැබව, කල්‍යාණී මහා චෛත්‍යයට; වැද, වන්දනා කොට; දෙමහල්, ද්විභූමිකාවූත්; තුන්මහල්, ත්‍රිභූමිකාවූත්; කොමද, අංකුරයෑ; දිලි. දීප්තවූ; මුන්හල්, බුද්ධප්‍රතිමාමන්දිරයන්ද; ගන, සාන්ද්‍රවූ; නිල්, නීල වර්ණවූ; දල, පත්‍රයන්; නිමල්, නිර්මලවූ; බෝසල්, බොධිද්‍රැමයද; පුද, පූජනය කොට; වැද, වන්දනය කොට; සුවිසල්, අතිවිශාලවූ; පස්මහල්, පංචභූමිකාවූ; සඟසතු ගෙවල්, සාංඝික ආවාසයන්ගේ; මැද, මධ්‍යයෙහි; මහසල්, මහාමණ්ඩප හා; දන්මහල්, දානශාලාද; දැක, දර්ශනයකොට; උන්සඳ, උපවිෂ්ටවූ කල්හි.—

95 සි දු තු ළ නොසිට නැඟිමෙන් වළඹ ගිනිවැ ට
දි සි ය ළ පබළ කලඹෙව් ලෙළ තරඟ පි ට
බැද හ ළ රතු ගලක් ලෙස සඳ ගෙවලෙනා ව ට
පැහැ දු ළ රිවි මඬල යනි පෙනෙය තාමෙනා ට

95 සකි මිත්‍රය, වළඹගිනිවැට, වඩබාග්නිව්‍යූහය; හෙවත් මුහුදුදිය දවන වහ්නිස්කන්ධය; සිදුතුළ, සාගරයාගේ අභ්‍යන්තරයෙහි; නොසිට, අස්ථිතවූ; නැඟීමෙන්, (අහසට) නැංගාක් මෙන්ද; යළ, නැවත; ලෙළතරඟ පිට, ලලිත (චපල) තරඞ්ග මස්තකයෙහිවූ; පබළකලඹෙව්, ප්‍රවාල කලාපයක් මෙන්ද; දිසි, දෘශ්‍යමානවූ; සඳ වෙලෙන්, සන්ධ්‍යාවලාහකයන් කරණකොටගෙන, අවට, හාත්පසින්; බැද, බන්ධනයකොට; හළ, (අහසෙහි) හරනාලද; රතුගලක් ලෙස, රක්තමාණික්‍යයක් පරිද්දෙන්; පැහැදුළ, ප්‍රභායෙන් උජ්ජ්වලිතවූ; රිවිමඬල, සූර්‍ය්‍යමණ්ඩලය; තමනතට, තාගේ නෙත්‍රයට; පෙනෙය, දෘශ්‍යමානවේ.

96 දිය තුර* පැතිර බස්නා තඹ වතුරු වෙ නි
දිනකර කිරණ අවරඹරට වැද ගියෙ නි
නිලකර දියත පැතිරෙන අඳුරු ඉඳුරෙ නි
සැඩකර කිරණ වැද තැව් ලොව නිවනා වැ නි

96 දියතුර. ජලදහනාන්තරයෙහි; පැතිර, ව්‍යාප්තවූ; බස්නා, සෑඳෑනාවූ (බැසැන්නාවූ); තඹවතුරු වෙනි, තඹවන් ජලප්‍රවාහයක් මෙන්; දිනකර කිරණ, සූර්යරශ්මිය; අවරඹරට, පශ්චිමදිශාකාශයට; වැදගියෙනි, ප්‍රවිෂ්ටවූ ගියහෙයින්; දියත, ලෝකය; නිලකර, නීල (කෘෂ්ණ) වර්ණ කොට; ඉඳුරෙනි, ඉන්දුදශායෙන්; පැතිරෙන, ව්‍යාප්තවන් නාවූ; අඳුරු, අන්ධකාරය තෙම; සැඩකර කිරණ, චණ්ඩාංශුහුගේ (සූර්යයාගේ) රශ්මිය; වැද, ප්‍රවිෂ්ටවූ; තැව්, සන්තාපිතවූ; ලොව, ලොකය; නිවන වැනි, නිර්වාපණය කරන්නාක්මෙනි.

97 ඇමතැන කරනා මුනිපුද නරඹනා ලෙස ට
තැනතැන සැවුල්ගණ පැමිණෙනා තුරුසිර ට
දිලිහෙන මුනි මැඳුර පහනින් එහි නොසි ට
දිව යන අඳුරු මෙන් වවුලන් නිකුත් වි ට

97 ඇමතැන, (විහාරයෙහි) සියලු තන්හි; කරන, ක්‍රියමාණවූ; මුනිපුද, බුඩපූජනයන්; නරඹන ලෙසට, (එකස්ථානයෙක්හි සිට) නිරීක්ෂණය කරනපරිද්දෙන්; තැන තැන, තන්හි තන්හි; තුරුසිරට, වෘක්ෂයන්ගේ මස්තකයට; සැවුල් ගණ, කුකුළුන් සමූහයා; පැමිණෙන, ප්‍රාප්තවන කල්හි; මුනි මැඳුර, ජිනමන්දිරයෙහි; දිලිහෙන, ජ්වලමානවූ; පහනින්, ප්‍රදීපයන් හෙතුකොටගෙන; එහි, ඒ ජිනමන්දිරයෙහි; නොසිට, ස්ථිතනොකොට; දිව යන, ධාවනයකොට යන්නාවූ; අඳුරුමෙන්, අන්ධකාරයන් පරිද්දෙන්; වවුලන්, ජතුකාවන්; නිකුත්විට, නිෂ්ක්‍රාන්තවූ කල්හි.—

* දිගතුර—සමහර පොත්.

98 ඇඳගෙන සිහිල් මදනල දියදහරහෙත
විලඟන බියෙන් දිලිනිලුපුල් ඇස්වසත
අඹුවන සලෙලුවන් මෙන් පරඟනන්වෙත
හැකිළෙන පියුම් ගැබ බමරුන් බැස බැඳෙත

98 සිහිල්, ශීතලවූ; මදනල, මන්දමාරුතය; ඇඳගෙන, ආකර්ෂණයකොට; දියදහර, ජලධාරාවන්; හෙත, පතිතවන කල්හි; විලඟන, සරසිනමැති අඞ්ගනාවන්; බියෙන්, භීතියෙන්; දිලි, ජ්වලිතවූ; නිලුපුල්, නීලොත්පල නමැති; ඇස්, නෙත්‍රයෙන්; වසත, නිමීලනය කරනකල්හි; පරඟනන් වෙත, පරාඞ්ගනාවන් සමීපයෙහි; අඹුවන, බද්ධවන්නාවූ; සලෙලුවන්මෙන්, කාමුකයන්මෙන්; හැකිළෙන, සඞ්කුචිත වන්නාවූ; පියුම්ගැබ, පද්මගර්භයෙහි; බමරුන්, භ්‍රමරයන්; බැස, අවතීර්ණවැ; බැඳෙත, බද්ධවනකල්හි—

99 හිමකර සිනිඳු සොමි රැස් රැස් කරනුවට
නිලඹර කෙතෙහි ඉසි බිජුවට නිසිලෙසට
එකවර දිලෙන දිගු දලුලන ලෙස රුවට
මමිතුර පෙනෙයි බබළන තරු වැළද තට

99 හිමකර, හිමාංශුහු විසින් (චන්ද්‍රයාවිසින්); සිනිඳු, ස්නිග්ධවූ; සොමිරැස්, සෞම්‍යරශ්මීන්; රැස්කරනුවට, රාශිභූත කරනු පිණිස; නිලඹරකෙතෙහි, නීලාම්බරනමැති ක්ෂෙත්‍රයෙහි; නිසිලෙසට, යොග්‍යවූ පරිද්දෙන්; ඉසි, ඉස්නාලද්දවූ (වපුරනලද්දවූ); බිජුවට, රශ්මිබීජයන්; එකවර, එකක්ෂණයෙහි; රුවට, මනොඥකොට; දිලෙන, දීප්තිමත්වන්නාවූ; දිගු දලු, දීර්ඝවූ අඞ්කුරයන්; ලනලෙස, නිර්ගමනය කරන්නාක් මෙන්; බබළන, භ්‍රාජමානවූ; තරුවැළද, තාරකාවලියද; මමිතුර, මාගේ මිත්‍රය; තට, යුෂ්මත්හට; පෙනෙයි, දෘශ්‍යමාන වේ.

100 ම   ද නාල සබඳ සඳවෙලෙ ගිනි දැල් නොම ද
වැ   ද වැද පිපිර හුණු තුරු බිජුමෙන් එස ද
රෙ  ද බැද රෙනැර ගෙන යන බමර මුළු වැද
කො ද ,වන පිපෙන රඟ බල හැමතැන සව ද

100. සබඳ, මිත්‍රය; එසඳ, ඒ කාලයෙහි; මදනලසබඳ, මන්‍දමාරුතය හා සම්බන්‍ධවූ; නොමඳ, අමන්‍දවූ; සඳවෙලෙ ගිනිදැල්, සන්‍ධ්‍යාවලාහක නමැති අග්නිජ්වාලයන්; වැද වැද, සංඝට්ටිතවීමෙන්; පිපිර, ස්ඵුටිතවූ; හුණු, (ගුම්වෙහි) පතිතවූ; තුරුබිජුමෙන්, තාරකා බීජයන් මෙන්; රෙදබැද, පඩංක්තිබන්‍ධනය කොට හෙවත් පෙළ සැදී; රෙන් ඇරගෙන, රේණුග්‍රහණය කොට; යන, ගමනය කරන්නාවූ; බමර මුළු, භෘඞ්ගසමූහයා, [illegible] ශබ්දිතවීමෙන්; හැමතැන, සකලස්ථාන [illegible]; [illegible]යන්; පිපෙන රඟ, පුෂ්පිතවන [illegible]ර[illegible], අවලොකන[illegible] කර.

[illegible] [illegible]ලාලව වනදනන් ලේ බීමෙන් නොම  ද
[illegible] තු ව ගියේදෙ සත සැක කරන ල  ද
ම තු ව උදු සිරසින් පෙනෙන ඒම ස  ද
බ ල ව සඳ වෙලෙන් රතුවූ සුපුන් ස  ද

101. ලොලව, දුබ්බවූ; වනදනන්, විරහිජනයන්ගේ; ලේ, රුධිරය; නොමඳ, අමන්‍දවූ; බීමෙන්, පානය කිරීමෙන්; රතුව ගියේදෙ, රක්තවර්ණවූයේදෝහොයි; සත, සත්වයන් විසින්; සැකකරනලද, ශඞ්කාකරන ලදුව; එමසඳ, ඒ කාලයෙහි; උදුසිරසින්, උදයපර්වත ශිඛරයෙන්; මතුව, උද්ගතවූ; පෙනෙන, දෘශ්‍යමානවූ; සඳවෙලෙන්, සන්‍ධ්‍යාවලාහකයන් කරණකොටගෙන; රතුවූ; රක්තවර්ණවූ; සුපුන්සඳ, සම්පූර්ණ චන්‍ද්‍රබිම්බය; බලව, අවලොකනය කරව.

102 නව යොවුනත් වූවනට කිපී සිසිර කා  ර
උන හිමි ය න් වෙන්වන තැනා දූනා වස  ර
මත කොවුලන් වෙත ලන රහසයටි යු  ර
තුරු සිදු රෙ න් ඒන සඳරැස් බල මිතු  ර

102. නවයොවුනන්, නව යුවතීන්ගේ; වුවනට, වක්‍ත්‍රයට; කිපි, කුපිතවූ; සිසිරකර, චන්‍ද්‍රයා විසින්; ළිය හිමියන්, ඔවුන්ගේ ස්වාමීන්; වෙන්වන, පෘථග්භූතවන්නාවූ; තැන, ස්ථානයෙහි; අවසර, අවකාශය; දුන, ජනනයකොට; මත කොවුලන් වෙත, මත්තකොකිලයන් සමීපයෙහි; ලන, ප්‍රක්ෂිප්තවාණවූ; රහසවිහුර, රහස්‍යසන්ධින් මෙන්; තුරුසිදු රෙන්, වෘක්ෂච්ඡිද්‍රයෙන්; එන, ආගමනය කරන්නාවූ; සඳරැස්, චන්‍ද්‍රරශ්මීන්; මිතුර, මිත්‍රය; බල, අවලොකනය කර.

103 සුනෙර මතින් අලළන සඳ කිරිසයු ර
ඉ ති ර වෙරළ දිව යනාමෙන් රළපත ර
පැ ති ර උදය ගිරි සිරසින් දිලි නොහැ ර
මි තු ර බලාලව එන සඳරැස් වතු ර

103. සුනෙර මතින්, මෙරුපර්වත නමැති මන්ථයෙන්; කිරි සයුර, ක්ෂීරසාගරය; අලළනසඳ, (විෂ්ණු විසින්) ආලොඩනය කරනකල්හි; වෙරළ, සමුද්‍රකූලය; ඉතිර, අතිරික්තවැ; දිව යන, ධාවනය කරන්නාවූ; රළපතර මෙන්, තරඞ්ග සමූහය මෙන්; පැතිර, (ආකාශකුහරය) ව්‍යාප්තකොට; නොහැර, (කිසිතැනකදු) වර්ජිතනොකොට; දිලි, ජ්වලිතවූ; උදයගිරි සිරසින්, උදයපර්වත ශිඛරයෙන්; එන, ආගමනය කරන්නාවූ; සඳරැස් වතුර, චන්‍ද්‍රරශ්මි ප්‍රවාහය; මිතුර, මිත්‍රය; බලාලව, නිරීක්ෂණය කර.

104 තොස් වන සුවඳ පිරිබඩමල් ගෙන අත ට
ල ස් නොව සුවඳ තෙල් පහණින්. එකලූකො ට
රැ ස් වන දනන් මුනිපුදයට වෙහෙරත ට
ගො ස් තොද මිතුර විබිසණ සුර මැදුරත ට

104. තොස්වන, තුෂ්ටවන්නාවූ; සුවඳ පිරිබඩ, සුගන්ධ පරිභාණ්ඩ ඇත්තාවූ; මල්, පුෂ්පයන්; අතට, හස්තයට; ගෙන, ග්‍රහණයකොට; ලස් නොව, අලස නොවැ; සුවඳ තෙල් පහ නින්, සුගන්ධ තෛලප්‍රදීපයෙන්; එකලූකොට, ඒකාලොක කොට; මුනිපුදයට, බුද්ධපූජනය පිණිස; වෙහෙරතට

විහාරාභ්‍යන්තරයට; දනන්, ජනයන්; රුස්වන, රාශීභූතවන කල්හි; මිතුර, මිත්‍රය; තොද, ශුෂවත් ගෙමෙද; විබිසණ පුර මැදුරතට, විභීෂණදෙවමන්දිරාභ්‍යන්තරයට; ගොස්, ගමනය කොට—(එක්සිය දෙලොස්වන දසපදසැහැලිකව හා සම්බන්ධයි.)

105 පින්කෙත්වන් මෙලක—
රජමහකැලණි වෙහෙරෙ හි

ගණනායක පෙර සඟගණ පරපුරෙ නි
ගණනායක තැන් ලැබ සිටිනා සැපති නි

උස්කළ නිරිඳුකුල—කොස්ගම ඒකනාය ක

මැතිඳු කුල පසිදු කළ එතම උපති නි
මු නිඳු බණ පුරුදුකර දෙසන සතති නි

සිත සැ ක හැර දැන තිවිනළු සඳ ලක ර
සි රි ල ක හැම තිවිඳුන්ගෙන් ලත් අද ර
දි ලි ස ක තිරි හිමකරලෙස යස විස ර
බුව නෙක බුජතෙර හිමි වැජඹෙයි නිතො ර

105. මෙලක, මේ ලංකාද්වීපයට; පින්කෙත්වන්, පුණ්‍ය ක්ෂෙත්‍රවාණයාවූ; රජමහකැලණි වෙහෙරෙහි, රජමහ කැලණි නම් විහාරයෙහි; ගණනායක, සංඝනායකවූ; පෙර සඟගණ, පුරාතන යතිසමූහයාගේ; පරපුරෙනි, පරම්පරායෙන්; ගණනායක තැන්, සංඝනායක ස්ථානය; ලැබ, ප්‍රතිලාභ කොට; සැපතිනි,[ගුණ]සම්පත්තීන් (යුක්තවූ); සිටිනා, වාසය කරන්නාවූ; නිරිඳුකුල, නරේන්ද්‍රකුලය; උස්කළ, උසස්කළාවූ හෙවත් වර්ධනය කළාවූ; කොස්ගම, එනම් ග්‍රාමයෙහි; ඒක නායක, ඒකනායකාභිධානවූ; මැතිඳුකුල, මන්ත්‍රීන්ද්‍ර වංශය; එතම උපතිනි, එහි ස්වකීයොත්පත්තිය කරණකොටගෙන; පසිඳුකළ, ප්‍රසිද්ධකළාවූ; මුනිඳුබණ, මුනීන්ද්‍ර ධර්මය; පුරුදුකර, පරිචයකොට; සතතිනි, නිරන්තරයෙන්; දෙසන, දේශනා කරන්නාවූ; සිත, චිත්තයෙහි; සැක හැර, ශංකානිරාකරණය

කොට; කිවිනළු සඳලකර, කාව්‍යනාටකාද්‍යලඞ්කාර ශාස්ත්‍ර යන්; දූත, ජනනයකොට; සිරිලක, ශ්‍රීලඞ්කාවීපයෙහි; හැම කිවිඳුන්ගෙන්, සියලු කවීන්ද්‍රයන්ගෙන්; අදරලත්, ආදරය ලද්දාවූ; සකකිරි, (බෞද්ධ) ශඞ්ඛයෙහි ප්‍රක්ෂිප්ත ක්ෂීරයක් මෙන්ද; කිමකර ලෙස, චන්ද්‍රයා මෙන්ද; දිළි, ජ්වලිතවූ; යසවිසර, කීර්ති රශ්මි ඇති; බුවනෙකබුජතෙර හිමි, භුවනෛකබාහු සංඝරාජ ස්වාමි තෙම; නිරතුර, නිරන්තරයෙන්; වැජඹෙයි, විජෘම්භමාන වේ.

106 පැ වැ ති නොයෙක් සක්වළ අණසක යන ත
ලොවැති සියලු උවදුරු දුරලන පිරි ත
කැමැ ති සඟන ගෙන ඉඳ සුරිඳු මැදුර ත
එ ය ති සඳුන් පවසා ගිය සඳ නැවැ ත

106. නොයෙක් සක්වළ, අනෙකචක්‍රවාලයන්හි; හෙවත් කෙළලක්ෂයක් සක්වලෙහි; සතත, නිරන්තරයෙන්; අණසක, ආඥාචක්‍රය; පැවැති, ප්‍රවෘත්තවූ; ලොවැති, ලොකයෙහි විද්‍යමානවූ; සියලු උවදුරු, සකල උපද්‍රවයන්; දුරලන, දුර්භූතකරන්නාවූ; පිරිත, (රතනසූත්‍රාදි) පරිත්‍රාණ ධර්මය; එයති සඳුන්, ඒ (භුවනෛකබාහු මහාසංඝරාජ) යතීන්ද්‍රයන්; කැමැති සඟන, අභිමත (ප්‍රමාණයක්) භික්ෂූන්; ගෙන, (රශ්මිභූත කිරි මෙන්) ග්‍රහණයකොට; සුරිඳු මැදුරත, සුරෙන්ද්‍රමන්දිරාභ්‍යන්තර යෙහි (විභීෂණ දෙවාලයෙහි); ඉඳ, උපවේශනය කොට; පවසා, ප්‍රකාශකොට; නැවැත, නිවෘත්තවැ; ගියසඳ, ගමනය කළ කල්හි—

107 සි ත් මත් කරවමින් රුඟුමෙන් සුරන් රු ස
වෙත් පත් සුරඟනන් මෙන් සුරපුරෙන් බැ ස
ග ත් ගත් වෙසින් විදුවා දනනුවන් ර ස
වි ත් ද ත් මුළු මුළුව සිට වඩවමින් තො ස

107. රුඟුමෙන්, නෘත්‍යයෙන්; සුරන් රුස, දෙවසමූහයාගේ; සිත්, චිත්තයන්; මත්කරවමින්, මත්ත කරවමින්; සුරපුරෙන්, සුරපුරයෙන්; බැස, (භූලොකයට) අවතීර්ණවැ; වෙත්පත්, සමීපස්ථවූ; සුරඟනන් මෙන්; දිව්‍යාප්සරාවන්

පරිද්දෙන්; ගත් ගත් වෙසින්, ගායිත ගායිත වෙශයෙන්; දන, ජනයන්ගේ; ශ්‍රවන්. නෙත්‍රයන්ට; රස, (නාට්‍ය) රසය; විදුවා, විඥාපනය කරවා; වත්දන්, (ගන්ධර්වී) විඥාව ජනනය කළාවූත් (නාටකාචාර්යන්) විසින්; මුළු මුළුව සිට, සමූහ සමූහවෑ සිට; තොස, සන්තෝෂය; වඩවමින්, වර්ධනය කරවමින්.

108 කර නා සිත උමතු දනයන් රා ගිය
නගනා වෙනා වෙනම සති සත්* රා ගිය
වය නා නදට එක්කොට පවසනා ගිය
අසනා සතුන් සවනත අමරස ගිය

108. රාගීය දනන්, සරාගජනයන්ගේ; සිත, චිත්තය; උමතු කරනා, උන්මත්ත කරන්නාවූ; වෙන වෙනම, වෙන්, වෙන් වම; සතිසත් රාගීය, මාලවරාගාදී වූ ප්‍රභේදගත ධාන්‍යාදි ෂට්ත්‍රිංශත්ස්වරයන්; නඟන, ආරෝපනය කරන්නාවූ; වයන පදට, වාද්‍යමාන පදයට; එක්කොට, එකීභූත කොට; පවසන, ප්‍රකාශකරවූ ලබන්නාවූ; ගීය, ගීතය හෙම; අසන සතුන්, ශ්‍රවණය කරන සත්වයන්ගේ; සවනත, කර්ණයන්හි; අමරසගීය, අමෘතරසාකාර (වේ.)

109 කියනා යුතු මෙයයි සුරඟදඹ මේ ලම
විය නා එසබ ඇමගේ තොසෙළවා ලම
බර නා සතර රඟටම කළ හැසා ලම
වය නා නොහැර මද්දල සුද්දතා ලම

109. සුරඟදඹ, දිව්‍යාඞ්ගනාවන්ගේ; මේලම, වාද්‍යෝපකරණය; මෙයයි, මේතෙමියයි; කියතයුතු, කථනයකළ යුතුවූ; බරත සතර රඟටම, ("ආනංබ මද්දලඃ ශ්‍රෛණිතඥකානං හරතාදිභිඃ" යනාදීන්) භරතශාස්ත්‍රයෙහි කී ලෙසින්ම; හැසා ලම, ආනබයොටම; කළ, කරනලද; මද්දල සුද්දතාලම, මද්දලයෙහි සම්බන්ධ ශුද්ධවූ තූර්‍ය්‍යය; නොහැර, වර්ජිත නොකොට; එසබ, ඒ සභාවෙහි; වියත, (රසවිරසතා දන් මෙහි) ව්‍යක්තවූ; හැමගේ, සියලු දෙනාගේ; තොස, සන්තෝෂය; එළවාලම, ආවහනය කොට්ම; වයත; වාදනය කරන කල්හි—

* "දෙතිසක්" හැම.

110 රඟන රඟ එරඟබිම සොඳුරු විදු ලිය
රඟන රඟ වැන්න ඝන තුළෙහි විදු ලිය
රඟන දන නුවන් දගැ රුසිරු ඉඳු ලිය
රඟන ලොබ නැරඹැරඟ ඔවුනා ඉඳු ලිය

110 එරඟබිම, ඒ නෘත්‍ය භූමියෙහි; සොඳුරු, සුන්දරවූ; විදුලිය, විද්‍යාවත් අඟනාවන්; හෙවත් භරතශාස්ත්‍රඥවූ නළඟනන්; රඟනරඟ, නෘත්‍යකරන ආකාරය (කොන්ද යත හොත්); ඝනතුළෙහි, මෙඝකූටයෙහි; විදුලිය, විද්‍යුල්ලතාවන්; රඟනරඟ වැන්න, නෘත්‍යකරන ආකාරය මෙනි; දනන්, ජනයන්ගේ; නුවන්, නෙත්‍රයන්, දගැ, බන්ධනය කොට; රඟන, නෘත්‍යකරන්නාවූ; රුසිරු, මනොඥවූ; ඉඳුලිය, ඉන්ද්‍රයාගේ (උර්වශ්‍යාදි) අප්සරාවෝ; ඔවුන, ඒ සුවිඛ්‍යාත නාටිකාවන්ගේ; රඟ, නෘත්‍යය; නැරඹැ, නිරීක්‍ෂණය කොට; රඟන ලොබ, (ස්වකීයවූ) නර්තනෙච්ඡාව; ඉඳු සෘජුවම; ලිය, දුරුකළහ.

111 එ ර ඟ මඬල සරත් සදියෙනි තෙත් කො ට
තරඟ උලැඟි ගොසගත් සයුරක් ලෙස ට
ස ම ග ගීතරඟ තාලමට සරි කො ට
මෙරඟ නළඟනන් රඟ කොට නැවැතිව් ට

111. එරඟමඬල, ඒ රඞ්ගමණ්ඩලය (නෘත්‍යභූමිය); සරතසදියෙනි, ශ්‍රාන්තත්වයෙන් ජනිත ස්වෙදජලයෙන්; තෙත් කොට, ආර්ද්‍රීභූතකොට; තරඟ උලැඟි, උල්ලඞ්ඝිත තරඞ්ග ඇතිව; ගොසගත්, ඝොෂග්‍රහණය කළාවූ; සයුරක් ලෙසට, සාගරයක් වැනිකොට; සමග, සමග්‍රවූ; ගීතරඟ, ගීතය හා නෘත්‍යය; තාලමට, වාදිත්‍රයට; සරිකොට, සමානකොට; මෙරඟ, මේ උක්තප්‍රකාරයෙන්; නළඟනන්, නාටිකාඞ්ගනාවන්; රඟකොට; නෘත්‍යකොට; නැවැතිව්ට, නිවෘත්තවූ කල්හි,

112 එකසර කෙසර සර—එක සරිනි බියපත් කැරැ
ඈනාත රතුසුසෙන් බුන් සිට මිහිස් වෙ සි ත්
දිය ත පසිඳු මහරම් රම් රදුන් වි සි ත්

සිරිලකට හිමි කැරූ-සුරසෙන් මැද බිසෙව් කළ

මෙම සිරිලක රජසිරි ලැබ නොයෙක ලෙ  ස
ත ම පුදකළ නිරිඳුන් හට පෙර දව  ස

බි ද සතුරන් ජයසිරිදී වරින් ව  ර
ල ද ගම්බිම් ගජහය සෙනඟ පිරිව  ර
වැ ද විබිසණ සුරිඳුගෙ සිරිපා තඹ  ර
නද පියකර තෙපුලෙන් මෙලෙස සැලක  ර

112. මිනිස්වෙසින්, මනුෂ්‍යවේශයෙන්; (දශරථරජහුගේ පුත්‍රත්වයෙන්); සිට, ස්ථිතවූ; එකසර කෙසරසර, එකවර කෙශරසිංහයක්හුගේ මෙන් සාරවූ; එකසරිනි, එකම (අභීත) නාදයෙන්; අනත, අනන්තවූ; රකුසුසෙන්, රාක්ෂස සේනාවන්; බිඟපත්කැරූ, භයප්‍රාප්තකොට; බුන්, භග්න කළාවූ; දියත පසිදු, ජගත්හි ප්‍රසිද්ධවූ; මනරම්, මනොරම්‍යවූ; රම්රදුන් විසින්, රාමනරෙන්ද්‍රයන් විසින්; සිරිලකට, ශ්‍රීමත් ලඞ්කාපුරයට; හිමිකැරූ, ස්වාමිකොට; සුරසෙන් මැද, දෙව් සෙනා මධ්‍යයෙහි; බිසෙව්කළ, අභිෂෙක කරනලද්දවූ; පෙර දවස, අතීත කාලයෙහි; මෙම සිරිලක, මෙම ශ්‍රීලඞ්කාවීප යෙහි: රජසිරි ලැබ, රාජ්‍යශ්‍රීප්‍රතිලාභය කොට; නොයෙක ලෙස, අනෙකප්‍රකාරයෙන්; තම පුදකළ. තමහට පූජාකළාවූ; නිරිඳුන් හට, නරෙන්ද්‍රයන්ට; සතුරන්, ශත්‍රූන්; බිඳ, භග්න කොට; ජයසිරි දී, ජයශ්‍රී ප්‍රදානය කොට; වරින් වර, වාරයෙන් වාරයෙහි; ගම්බිම්, ග්‍රාමභූමි හා; ගජහය, හස්ත්‍යශ්වයන්ද; පිරිවර සෙනඟ, පරිවාර සෙනාඞ්ගයන්ද; ලද, ප්‍රතිලාභ කළාවූ, විබිසණ සුරිඳුගෙ, විභීෂණ සුරෙන්ද්‍රයාගේ; සිරිපා තඹර, ශ්‍රීපාද පද්මය; වැද, වන්දනය කොට; නද, ආනන්ද කරවූ; පියකර, ප්‍රියඞ්කරවූ; තෙපුලෙන්; වචනයෙන්; මෙලෙස, මෙපරිද්දෙන්; සැලකර, ආරොචනය කර.

113 මෙසිරිලක සියල්—සියසතින් එක්සත් කළ

නිතර පසිඳු පියුම්බා හිමි ලෙස  ට
පවර මෙසිරි පැරකුම්බා නිරිඳු හ  ට

රජසිරි සැප සමග—සුබසෙත් දී දිගා කැරැ

කලක් යෙහෙන් ලක රජසැප විඳිනා ලෙ  ස
නිදුක් නිරෝගී කැරැ යොදමින් දිවැ  ස
වෙතින නිතොර ඇම උවදුරුම දුරු  කොට
කරන සතුරු වියවුල් අතුරු දන්  කොට
නිතින මෙනරනිඳුවෙත සෙත දියුණුකො ට
රකින ලෙස අයදු විබිසණ සුරිඳු  හට

113. මෙසියල් සිරිලක, මේ සකල ශ්‍රීලංකාවීපය; සිය සතිනි, ස්වකීය චිත්තයෙන්; එක්සත්කල, එකච්ඡත්‍රකළාවූ; නිතර, නිරන්තරයෙන්; පියුමම්බාහිමි ලෙසට, ශ්‍රීපතිහු පරිද්දෙන්; පසිඳු, ප්‍රසිද්ධවූ; පවර, ප්‍රවරවූ; මෙසිරි පැරකුම්බා නිරිඳුහට, මේ ශ්‍රීපරාක්‍රමබාහු නරේන්ද්‍රයාහට; රජසිරි සැප සමග, රාජශ්‍රී සම්පත්තිය හා සමග; සුබසෙත්, ශුභසෞඛ්‍යය; දී, දෙනය කොට; දිගාකැරැ, දීර්ඝායුෂ්කකොට; යෙහෙන්, යහපත්සේ; කලක්, චිරකාලයක් මුළුල්ලෙහි; ලකරජසැප, ලංකාරාජ්‍යශ්‍රීය; විඳින ලෙස, වින්දනය කරනා පරිද්දෙන්; දිවැස, දිව්‍යචක්ෂුස; යොදමින්, (මේ නරේන්ද්‍රයා කෙරෙහි) යුක්ත කෙරෙමින්; හෙවත් දිවැස්ලා වදුරමින්; නිදුක් නිරෝගී කැරැ, නිර්දුඃඛ නීරෝග කොට; නිතොර, නිරන්තර යෙන්; වෙතින, (මේ නරේන්ද්‍රයා) කෙරෙන්; ඇම උවදුරුම, සකල උපද්‍රවම; දුරුකොට, දූරීභූතකොට; කරන, කරනු ලබන්නාවූ; සතුරු, වියවුල්, ශත්‍රු ව්‍යාකූලයන්; අතුරු දන්කොට, අන්තර්ධානකොට; නිතින, නිත්‍යයෙන්; මෙනරනිඳු වෙත, මේ නරේන්ද්‍රයා කෙරෙහි; සෙත, ශාන්තිය හෙවත් සෞඛ්‍යය; දියුණුකොට, විගුණත්වයට පමුණුවා; රකින ලෙස, රක්ෂණය කරනසේ; විබිසණ සුරිඳුහට, විභීෂණ සුරේන්ද්‍රයා හට; අයදු, අයාචනා කර.

114 පැලඳ තිසරණ මිණි—අබරණ තමා මුදුනෙහි

නිසග සොමිගුණෙන් පසුකළ සුපුන් ස  ඳුන්
සම ග මෙ නරනිඳුගේ අගබිසෝ ල  ඳුන්

මතුරජ සිරි ලබන—මනුරද සිරිනි මනනඳ

පුබුදු කරන ගුණයෙන් සව්සතන් සි   ත
පසිදු රජ කුමරුවන් සහ සිරින් යු   ත

මුනි ඳු සසුන් සැදි ලක්දිව පිරියස   ස
මැතිඳු වරන් සමගින් රජ සෙනහ රු   ස
පු රු දු සිරින් තොර නොකරම හැම දව   ස
සුරි ඳු සඳුන් අයදුව නිති රකින ලෙ   ස

114. තමා මුදුනෙහි, සචකීය මස්තකයෙහි; තිසරණ, ශරණත්‍රය නමැති; මිණිඅබරණ, මාණික්‍යාභරණය; පැලඳ, ප්‍රසාධනයකොට; නිසග, නෛසර්ගිකවූ; සොමිගුණෙන්, සෞම්‍යගුණය කරණකොටගෙන; සුපුන් සඳුන්, සම්පූර්ණ චන්ද්‍රබිම්බය; පසුකළ, පශ්චාද්භූත කළාවූ; මෙ නරනිඳුගේ, මෙ නරෙන්‍ද්‍රයාණන්ගේ; අගබිසෝ ලදුන් සමඟ, අග්‍රමහිෂී කාන්තාවන් හා සමග්‍රව; මතු, අනාගතයෙහි; මනුරද සිරිනි, මනු නරෙන්‍ද්‍රයාගේ ශොභාවෙන්; මනනඳ, මනොනන්‍දනවූ; රජසිරි. (ලඞ්කා) රාජශ්‍රිය; ලබන, ප්‍රතිලාභ කරන්නාවූ; ගුණයෙන්, ගුණධර්මය කරණකොටගෙන; සව්සතන්, සකල සත්‍වයන්ගේ; සිත, චිත්තය; පුබුදුකරන, ප්‍රබොධ කරන්නාවූ; සිරින් යුත, ශ්‍රීමත්වූ; පසිදු රජකුමරුවන් සහ, ප්‍රසිද්ධ රාජ කුමාරයන් හා සමග; මුනිඳු සසුන් මුනීන්‍ද්‍ර ශාසනයෙන්; සැදි, සජ්ජිතවූ; ලක්දිව, ලඞ්කාවීපයෙහි; පිරියසස, පරිපූර්ණවූ යශස්ඇති; මැතිඳුවරන් සමගින්, මන්ත්‍රීන්‍ද්‍රවරයන් හා සමග; රජ සෙනහරුස, රාජසේනාමහරාශියද; හැම දවස, සියලු කාලයෙහි, පුරුදු, පරිචිතවූ; සිරින්, සම්පත්තියෙන්; තොරනොකරම, වර්ජිත නොකොටම; නිති, නිත්‍යයෙන්; රකිනලෙස, රක්‍ෂණය කරන පරිද්දෙන්; සුරිඳු සඳුන්, (විභීෂණ) සුරෙන්‍ද්‍රොත්තමයන්; අයදුව, ආරාධනා කරව.

115 මෙලෙස අයැද අවුදින් මහ වෙහෙර මැ   ද
සි ර ස රුවන් මඩුවේ සිතුලෙසින් ඉ   ඳ
සතොස වෙමින් එවෙහෙර සිරි බලනා ස   ඳ
දි ව ස හමුව ජර පත්වෙයි නියා ස   ඳ

115. මෙලෙස, මෙපරිද්දෙන්; අයැද, ආයාචනයකොට; අවුදින්, ආගමනයකොට; මහවෙහෙර මැද, (කලණි) මහාවිහාරයාගේ මධ්‍යයෙහි; රුවන් මඬුවේ, රත්නමය මණ්ඩපයාගේ; සිරස, මස්තකයෙහි; සිතු ලෙසින්, සිත්වූ පරිද්දෙන්; ඉඳ, උපවේශනයකොට; සතොසවෙමින්, තුෂ්ටි සහිත වෙමින්; එවෙහෙර, ඒ විහාරයාගේ; සිරි, ශොභාව; බලන සඳ, අවලොකනය කරනකල්හි; දිවසහමුව, දිවස කාලය සමුබවූ; නිසා සඳ, රාත්‍රි නමැති කාන්තාව; ජරපත්වෙයි, ජරාප්‍රාප්ත වේ.

116 නොහැර සසල බව කර දී* අවරත ට
එ ත ර ඉඳුරු පැහැ පහවූ බැවින් බ ට
තු ස ර කිරණ බිඹු රඟ ඇති රඟින් දු ට
මි තු ර ගැඹුරු තිලකුණු සිහිවේය ත ට

116. එතර, තත්ක්ෂණයෙහි; සසලබව, චපලභාවය; නොහැර, වර්ජනය නොකොට; කර, රශ්මිය; අවරතට, අවර දිශාවට; දී, දානයකොට; බටබැවින්, (එහි) අවතීර්ණවූ බැවින්; ඉඳුරුපැහැ, ප්‍රාචීදිශාගත ප්‍රභායෙන්; පහවූ, වර්ජිතවූ; තුසර කිරණබිඹු, චන්ද්‍රබිම්බයාගේ; රඟ, ආකාරය; ඇතිරඟින්, විද්‍යමානාකාරයෙන් (තත්වූ පරිද්දෙන්); දුට, දර්ශනයකළ කල්හි; මිතුර, මිත්‍රය; තට, යුෂ්මත්හට; ගැඹුරු, ගම්භීරවූ; තිලකුණ, (අනිත්‍යදුඃඛානාත්මතා සඞ්ඛ්‍යාත) ත්‍රිලක්ෂණය; සිහිවිය, ස්මරණය වේ.

117 සුලබ සයුරු රන් මිණි කිරණ රැස්කො ට
ව ළ බ නාලෙන් පැසවා රැගෙන විතර ට
එ ප බ ගලා රුඳුවා මෙන් ගනරත ට
නා ර ඹ දිනිඳු රැස් එන රඟ පෙරඹර ට

117. සයුරු, සාගරයෙහි; සුලබ, සුලභ්‍යවූ; රන්මිණි, සුවර්ණ හා මාණික්‍යයන්ගේ; කිරණ, රශ්මීන්; රැස්කොට, රාශීභූතකොට; වළබනාලෙන්, වඩබාග්නියෙන්; විතරව,

* "දුක්දී" සමහර-

ප්‍රමාණයකාට; පැසවා, තපත කොට; රුහෙන, ග්‍රහණය කොට; එපබ, ඒ ප්‍රභාව; ගතරතට, සතරසත වර්ණය පිණිස; ගලා, සංසක්තකොට; රුඳුවාමෙන්, රජනය කලාක්මෙන් (අතිරක්තවර්ණවූ); දිනිඳුරුස්, සූර්‍ය්‍යරශ්මිය; පෙරබරට, ප්‍රාචීදිශාකාශයට; එනරඟ, ආගමනය කරන ආකාරය; නරඹ, නිරීක්ෂණය කර.

118 පැ ල හිඳුව න සිසිහස් කර අහස් කෙ ත
දු ළ සපුව න මිණිමුතුවන කොඳවන ත
නි ල කරව න තුනු පැහැයෙන් ගිරි රඟ ත
උ ණු කරව න දසසත කිරණින් දිග ත

118. සිසිහස්කර, චන්ද්‍ර නමැති කෘෂකයා; අහස්කෙත, ආකාශ නමැති ක්ෂේත්‍රයෙහි; පැල, (තාරකා නමැති) අඞ්කුර යන්; හිඳුවන, රෝපණය කරන කල්හි; මිණිමුතුවන, කොෂයෙන් මුක්තවන්නාවූ (ප්‍රබොධවන්නාවූ); කොඳවනත, කුන්දවනාභ්‍යන්තරයෙහි; දුළසපුවන, උජ්වලතා සම්පත්තිය ඇතිවන කල්හි; නිලකර, නීලග්‍රීවයන්ගේ (මයුරයන්ගේ) වනතුනු පැහැයෙන්, වර්ණදෙහ ප්‍රභායෙන්; ගිරි, පර්වතයන්; රඟන, නෘත්‍යකරන කල්හි; හෙවත් පර්වත මස්තකයෙහි මයුරනෘත්‍යය පවත්නා කල්හි; දිගත, [දශ) දිගන්තය; දසසත කිරණින්, සහස්‍රරශ්මියෙන්, හෙවත් සූර්‍ය්‍යරශ්මියෙන්; උණුකරවන, උෂ්ණකරවන කල්හි:—

119 නොමඳ හි ය ද මුනිඳු රුදි දගැබ ද
ඇ ම ද නැමඳ සිටි සිල්වත් සඟගණ ද
ප බ ද වි ශි ද පිරි සිරිමාබෝතුර ද
පැ හැ ද නැමඳ එපුරෙන් යානන් සබ ද

119. සබද, වයස්‍යය; නොමඳහියද, අමන්ද හිතදයකාවූ; මුනිඳ රුදි, ජිනධාතුයෙන් රජිතවූ; දගැබද, ධාතුගර්භයද; ඇමද, (චෛත්‍යාඞ්ගණ) සම්මාර්ජනය කොට; නැමද, (චෛත්‍ය) වන්දනය කොට; සිටි, ස්ථිතවූ; සිල්වත්, ශීල ගුණයෙන් යුක්තවූ; සඟගණද, භික්ෂු සමූහයද; පබද, (ශාඛා)

ප්‍රබන්ධයෙන්; විසිද, විකසිතවූ; සිරි, පූර්ණවූ; සිරිමාබෝතු රද, ශ්‍රීමහාබෝධිද්‍රැමයද; පැහැද, ප්‍රසන්නවූ; නැමද, නමස්කාරකොට; එපුරෙන්, ඒ නගර පූර්වයෙන්; යාගත්, යාත්‍රාග්‍රහණය කර.

120 එද දගැබින් යන රැස්කදක් ලෙ ස
විද පියා යුග යනා තෝ අහස් තු ස
රද ගිය වලාකුළසේ* ගංදෙප ස
සද දිලෙන පොල්වතු දකු දකුණු ප ස

**120.** එද, තත්කාලයෙහි; දගැබින්, ධාතුගර්භයෙන්; යන, නික්ම යන්නාවූ; රැස්කදක් ලෙස, (බුධ) රශ්මිස්කන්ධයක් මෙන්; අහස්කුස, ආකාශ කුක්ෂියෙහි; පියායුග, පක්ෂයුගලය; විද, ප්‍රසාරණය කොට; යන, ගමනය කරන්නාවූ; තෝ, ත්වත්තෙම; ගංදෙපස, (කලණි) නදියගේ උභයපාර්ශ්ව යෙහි; රඳගිය, රජිතකොට ගියාවූ; වලාකුළසේ, මෙඝකූටයන් පරිද්දෙන්; සද, හැමකල්හි; දිලෙන, දීප්‍යමානවූ; පොල්වතු, නාරිකෙලාරාමයන්; දකුණුපස, (මාර්ගීයාගේ) දක්ෂිණ පාර්ශ්වයෙහි; දකු, දර්ශනය කර.

121 ග ත් ම ත් වලින් ලිය ලිය ගී තමන් ලෙ ස
නෙ ත් සි ත් සතුටුකැරු කෙළි කුමරියන් රැ ස
වෙ ත් ප ත් තැන් පොරට ගවම් රළන් බැ ස
කෙ ත් ව ත් නොයෙක් ගම්බිම් පෙනෙය
වම්ප ස

**121.** මත්වලින්, මත්තාවස්ථාව හේතුකොටගෙන; ලිය ගීගත්, ලයානිත ගීතිකා ග්‍රහණය කළාවූ; ලිය, කාන්තා (සමූහයද); තමන් ලෙස, තමන්ගේ ආකාරයෙන්; නෙත් සිත්, (දුටුවන්ගේ) නෙත්‍ර චිත්තයන්; සතුටුකැරු, සන්තුෂ්ට කොට; කෙළි, ක්‍රීඩනය කරන්නාවූ; කුමරියන් රැස, කුමාරීන්ගේ සමූහයද; ගවම්රළන්, ගෝමහිෂයූථයන්; පොරට, යුධ පිණිස; බැස, අවතීර්ණවූ; වෙත්පත්, සමීපස්ථවූ; තැන්, ස්ථානද ඇත්තාවූ; කෙත්වත්, ක්ෂෙත්‍ර වාස්තු හා; නොයෙක් ගම්බිම්, අනේක ග්‍රාමභූමි; වම්පස, (මාර්ගීයාගේ) වාමපාර්ශ්ව යෙහි; පෙනෙය, දෘශ්‍යමාන වේ.

---

* "කළඹකුළ" සමහර.

122 ඇ වූ ණුව මෙන් කෙත්වත් වතුපිටි එක ට
පි රු ණුව සිටි මදකුත් අතුරක් නොකො ට
තු රු ණුව දිසි අඟනන් සුරඟන ලෙස ට
ප මු ණුව දැක පමුණුව තොස තාගෙ සිත ට

122 කෙත්, ක්ෂෙත්‍රද; වත්, වාස්තු (ගෘහභූමි) ද; වතු, ආරාමද; පිටි, ප්‍රසාද හෝ බහිර්භූමිද; එකට, එකස්ථානයෙක්හි; ඇවූණුවමෙන්, ආවූර්ණනය කළාක්මෙන්; මදකුත්, ස්වල්පමාත්‍රය කුදු; අතුරක් නොකොට, අනතුරක් නොතබා; පිරුණුව සිටි පූර්ණව ප්‍රතිෂ්ඨිතවූ; සුරඟන ලෙසට, දෙවඟනන් පරිද්දෙන්; තුරුණුව දිසි, තරුණව දෘශ්‍යමානවූ; අඟනන්, අඞ්ගනාවන් ගෙන් (යුක්තවූ); පමුණුව, එනම්ග්‍රාමය; දැක, දර්ශනය කොට; තාගෙ සිතට, තාගේ චිත්තයට; තොස, තුෂ්ටිය; පමුණුව, ප්‍රාපිත කර.

123 තු ර ඟ ගජ නැඟී යන එන නි ස් සෝ ය
ස ම ග බරසුලා යන දැසි ද ස් සෝ ය
සි ත ඟ දෙනුන් වෙත කෙළි වැසි ව ස් සෝ ය
එ ම ග තැනින්තැන සිටි රටවැ ස් සෝ ය

123 එමඟ, ඒ මාර්ගයෙහි; තුරඟගජනැඟී, අසුන්පිට හා ඇතුන්පිට අරුඪවූ; යනඑන, ගමනාගමනය කරන්නාවූ; නිස්සෝය, යොධවූ [ප්‍රභූ]ජනයෝය; සමග, (ඒ ප්‍රභූන් හා) එක්ව; බර උසුලා යන, භාරවහනය කෙරෙමින් යන්නාවූ; දැසිදස්සෝය, දාසිදාසයෝය; සිතඟ, මනොනුකූලවූ; දෙනුන් වෙත, ධෙනූන් සමීපයෙහි; කෙළි, ක්‍රීඩාය කරන්නාවූ; වැසිවස්සෝය, වත්සතරීන් හා වත්සතරයෝය; තැනින් තැන, තත්හි තත්හි; සිටි, ස්ථිතවූ; රටවැස්සෝය, ජානපදිකයෝය.

124 දෙළ දෙ ළ හුරු මුඵ පළකළ පබළ ද ළ
ප ළ ප ළ පොරණ යන මුවම් ගවර ර ළ
ද ළ ද ළ උදුළ මොළ ගජරළ කෙළිවත ළ
බ ල ලෙ ළ පුවළ පෙරමඟ වනාගළ නැඹ ළ

124 දෙළ දෙළ, දෙළක්පාසා; හුරුමුළු, ශූකර සමූහයා විසින්; පළපළ, ප්‍රකාශකරනලද; දළ, දෑඩවූ; පබළ, ප්‍රවාල මාණික්‍යඇති; පළ පළ, තන්හි තන්හි; පොරඇත, ශුඩ කොරෙමින්; යත, ගමසය කරන්නාවූ; මුවමිගවර, මෘගමක්ෂ ගවයයන් සම්බන්ධවූ; රළ, ශූරඇති; දළ දළ, දංෂ්ට්‍රාවක් පාසා; උදුළ, උජ්වලිතවූ; මොළ, චණ්ඩවූ; ගජරළ, හස්තියූථයන්ගේ; කෙළි, ක්‍රීඩායෙන්; වතළ, වතෘතවූ; ලෙළ. ලීලෝපෙතවූ; පුවළ, ප්‍රෞඪවූ; පෙරමග, ප්‍රතිපථයෙහිවූ; නැඹළ, මහත්වූ; වනගළ, වනඝටාව; බල, අවලෝකනය කර.

125 මිහිලො ල් බිගු සරේ ය වනාස රේ ය
ග හු ලැ ල් වැද සිරේ ය ගිරි සි රේ ය
පි පි ම ල් සපු තු රේ ය විසිතු රේ ය
ව න සි රි සඳ කොරේය ලොබ කො රේ ය

125 මිහිලොල්, පුෂ්පරසයෙහි ලොලවූ; බිගු, භෘඞ්ග යන්ගේ; සරේය, නාදඇති; වනසරේය, වනභාගයෙන්ද; වැද, ඝට්ටිතවැ; ඉසිරේය, විකීර්ණවන්නාවූ; ඇල්, ශීතලවූ; ගහුල්, නිර්ඣරඇති; ගිරිසිරේය, පර්වතකූටයෙන්ද; පිපි, පුෂ්පිතවූ; සල්සපුතුරේය, ශාලවෘක්ෂයෙන් හා චම්පකවෘක්ෂයෙන්ද; විසිතුරේය, විචිත්‍රවූ; වනසිරිසඳකොරේය, වනශ්‍රී කාන්තාව කෙරෙහි; ලොබ කොරේය, (දුටු දුටු ජනතෙමේ) ලොභ කරන්නේයි.

126 ගිරි නි ල් ම ල් රඟා ය පිල් න ගා ය
කැරුසෙබඩුන් ළඟා ය මනර ගා ය
රි වි දෙ ව් හ ට ර ගා ය ගිරි ර ගා ය
සිටි මොනරුන් මඟා ය වන ම ගා ය

126 ගිරිනිල්මල් රඟාය, ගිරිකර්ණිකාපුෂ්පාකාරවූ; පිල්, පිච්ඡයන්; නඟාය, උද්ගතකොට; මනරඟාය, මනොඥකූලවූ; සෙබඩුන්, මයූරාඞ්ගනාවන්; ළඟාය කැරු, සමීපස්ථ කොට ගෙන; ගිරිරඟාය, පර්වතශෘඞ්ගයන්හි; රිවිදෙව්හට, සූර්‍යයා

දෙව්රාජයාහට; රඟාය, නෘත්‍යකොට; සිටි, ස්ථිතවූ; මොනරුන්, මයූරයන්; වනමඟාය, වනමාර්ගයෙහි; මඟාය, නිරීක්ෂණය කර.

127 කිරිලේස සම තලා ය වැලිත ලා ය
සැදි සුවඳැති මලා ය වන ම ලා ය
එන ව න සර කලා ය මන ක ලා ය
දැකනෙත්ලත් පලා ය ලැබ ප ලා ය

127 කිරිලෙස, ක්ෂීරයක්සේ (ධවලවූ); සමතලාය, සමතලවූ ගෙවත් උද්‍යාන අවනත නොවූ; වැලිතලාය, වාලුකාතලයන්හි; සුවඳැති, සුගන්ධවත්වූ; වනමලාය, වනජපුෂ්පවයවූ; මලාය, මාලාදාමයෙන්; සැදි, සජ්ජිතවූ; එන, ආගමනය කරන්නාවූ; මනකලාය, මනොඥවූ; වනසරකලාය, වනචර (වෙනෙහි හැසිරෙන) කාන්තාවන්; දැක, දර්ශනය කොට, නෙත්ලත්පලාය, නෙත්‍රප්‍රතිලාභඵලය; ලැබ, ලබ්ධවූ; පලාය, ප්‍රයාණය කර.

128 පැතිරෙනා ගඟුලැලී ලෙලතුරු සළු සි ලී
කසමල් හෙල්මැලී මිණිබරණින් දි ලී
රනහස වැළු කුලී බඳමිණි මේක ලී
විලසක ලෙස බලී බල සැදි වන වි ලී

128 පැතිරෙන, විස්තීර්ණවන්නාවූ; ගඟුලැලී, නිර්ඣර නමැති; ලෙල, ලීලොපෙතවූ; උතුරුසළු, උත්තරශාටකයක්; ඉසිලී, උද්වහනය කළාවූ; කසමල්, කාශපුෂ්ප හා; හෙල්මැලී, කහ්ලාරකුසුම නමැති; මිණිබරණින්, මාණික්‍යාභරණයෙන්; දිලී, ජ්වලිතවූ; උකුලිබඳ, ශ්‍රොණියෙහිබද්ධවූ; රනහසවැළ, ස්වර්ණහංසාවලි නමැති; මිණිමේකලී, මණිමෙඛලා ඇති; බලී, මහත්වූ; වනවිලී, වනභාගය; සැදි, සජ්ජිතවූ; විලසක ලෙස, විලාසිනියක මෙන්; බල, නිරීක්ෂණය කර.

129 සඳකැන් මෙන් නිසා එන ගඟුලැලි නි සා
ගිලිමල් රොන් ව සා යන මිණිතිල් ව සා
ව න විල් සු ව හ සා දෙන රුචි සුව හ සා
එ ව නෙහි ම ග අ සා දැක යව අස අ සා

129 නිසා, රාත්‍රියෙහි; සඳකැන්මෙන්, චන්ද්‍රකාන්තියෙන් මෙන්; එන, ආගමනය කරන්නාවූ; ගඟුලැලිනිසා, නිර්ඣරයන් නිඃශ්‍රයකොට; ගිලි, ගලිතවූ; මල්රොන්, පුෂ්පරේණූන්; වසා, ඡාදනය කොට; යන, (ප්‍රවාහසඑව) ගමනය කරන්නාවූ; නිල් මිණි, ඉන්ද්‍රනීල මාණික්‍යයන්ට; වසා, වාසස්ථානවූ; වනවිල්, වනතඩාගයන්හි; සුව; කිරපක්ෂීන් හා; හසා, හංසයන්විසින්; දෙන, දානය කරනුලබන්නාවූ; රුව්සුවහසා, රූපශතසහස්‍රයන්; අසා, ශ්‍රවණයකොට; දක, (ඔවුහුද) දර්ශනය කොට; එවනෙහි, ඒ වනයෙහි; මග, මාර්ගය, අස අසා, පෘවර්ජනය කෙරෙමින්; යව, ප්‍රයාණය කර.

130 වුවන කම ල් ග තා  රනලිය සිරි ග  තා
අඩ සඳ න ළ ල තා  බඳමල් මුතු ල  තා
විශොවග යුද පතා  ඇවිදින නිති ප  තා
දෑක වන සර කතා  අස පිය රස ක  තා

130 වුවන, වක්ත්‍රයෙන්; කමල්, පද්මයන්ගේද; ගතා, ශරීරයෙන්; රනලිය, ස්වර්ණලතාවන්ගේද; සිරිගතා, ශොභාග්‍රහණය කළාවූ; අඩසඳනළලතා, අර්ධචන්ද්‍රාකාර ලලාටයෙහි; බඳ, බන්ධනය කරනලද; මල්, පුෂ්පහා; මුතුලතා, මුක්තාලතිකාවන්ඇති; නිතිපතා, නිරන්තරයෙන්; විශොවගයුද, මන්මථයුද්ධය; පතා, ප්‍රාර්ථනාකොට; ඇවිදින, ආහිණ්ඩනය කරන්නාවූ; වනසරකතා, වනචරකාන්තාවන්; දෑක, දර්ශනය කොට; පියරසකතා, ප්‍රියවූ රසවත් කථාවන්; අස, ශ්‍රවණය කර.

131 දුටුවන් ම න ද ගා  කරවන යුග ද  ගා
සිරිවස සි රි නි ගා  කළ ලෙල සිහි නි  ගා
නිති තමහිමි ළගා  යන එන කොම ළ  ගා
රූ සි රු ම ග ම ගා  වඩින එවන ම  ගා

131 දුටුවන්, දර්ශනය කළාවූන්ගේ; මන, චිත්තයන්; දගා කරවන, බන්ධනය කරවන්නාවූ; යුගදගා, ජඞ්ඝායුග්මඇති; සිරිවසසිරි, ශ්‍රීවත්සශොභාවට; නිගාකළ, නිග්‍රහකළාවූ;

ලෙල, ලීලෝපේතවූ; සිඟිතිඟා, කෘශවූ මධ්‍යප්‍රදේශඇති; නිති, අනවරතයෙන්; තමගිම්ලඟා, ස්වකීයවල්ලභයන් සමීප යෙහි; යනඑන, ගමනාගමනය කරන්නාවූ; සොවලඟා, කෝමලාඞ්ගීන්ගේ; රූසිරු, රූපශ්‍රීන්; මඟ මඟා, නිරීක්ෂණය කොට කොට; එවනමඟා, ඒ වනමාර්ගයෙහි; වඩිත, ප්‍රයාණය කරන්න.

132 සව න තුවන නිතියෙන් කරවන සතු වූ
රව න බම න බිඟු පිල්බරද පරපු වූ
ගිමන නිව න සිඟිලැලි වැලිතලා පි වූ
එව න දෙවන හිමවනයක් වැනිය ඉ වූ

132 ඉවූ, ඉෂ්ටවිත්‍රය; නිතියෙන්, නිත්‍යයෙන්; සවනතුවන, කර්ණනෙත්‍රයන්; සතුටුකරවන, සන්තුෂ්ටකරවන්නාවූ; රවන, නාදකරන්නාවූ; බමන, භ්‍රමණය කරන්නාවූ; බිඟු, භෘඞ්ගයන්ගෙන් හා; පිල්බරද, මයූරයන්ගෙන් හා; පරපුටු, කොකිලයන්ගෙන්ද; ගිමන නිවන, ග්‍රීෂ්මනිර්වාණය කරන් නාවූ; සිඟිලැල්, අතිශයින් ශීතලවූ; වැලිතලාපිටු, සෛකත පෘෂ්ඨයන්ගෙන්ද; එවන, ඒ වනයතෙම, දෙවනහිමවනයක් වැනිය, විතීය හිමාලයවනයක් වැන්නේය.

133 මලි නේ නො ව දිලිහෙන තුරුම ලි නේ
සව නේ හෙ ත බිඟුරුව් මඟ සව නේ
මූ වි නේ ග ත් අඹකැන් විලිමුවි නේ
ගම නේ දු ක් නොදැනෙයි දුටු ගම නේ

133 මඟසවනේ, මාර්ගසන්නවනයෙහි; මලිනේ, පුෂ්පයන් කරණකොටගෙන; මලිනේ නොව, මලිනීභූත නොව; හෙ වත් පරිශුඩව; දිලිහෙන, ප්‍රජ්වලිතවන්නාවූ; තුරු, වෘක්ෂ යන්හි; බිඟුරුව්, භෘඞ්ගනාදයන්; සවනේ හෙත, ශ්‍රවණයෙහි පතිතවනකල්හිද; මූවිනේ ගත්, මුඛයෙන් ගෘහිතවූ; අඹකැන්, චූතමඤ්ජරීන්ඇති; විලිමුවිනේ, වලීමුඛයන්; දුටුගමනේ, දර්ශනය කළකල්හිද; ගමනේ, ප්‍රයාණයෙහි; දුක්, දුඃඛය; නොදැනේ, ඥායමාන නොවේ.

134 තම තම සැක බය හැර යන ව දුරු
මත මන කරවන වනාඝර සො දුරු
තම ගන බවනාභවන ගිරි දූ දුරු
මන නා ද වනාගල දැක යව සොඃ දුරු

අර්ධභ්‍රමයි.

134 තමතම, තමතමන්කෙරෙහිවූ හෙවත් ඔවුනොවුන් කෙරෙහිවූ; සැකබය, ශඞ්කාභීතීන්; හැර, වර්ජිතකොට; යන, ගමනය කරන්නාවූ; වදුරු, වානරයන්ගෙන්ද; මන, චිත්තයන්; මතකරවන, මත්තකරවන්නාවූ; වනාඝර සොඳුරු, වනචර සුන්දරීන්ගෙන්ද; ගනතම, ඝනාන්ධකාරයාගේ; බවන, භවනයන්; අභවන, ඥාපනය කරන්නාවූ; ගිරිදූදුරු, ගිරිජර්ජරයෙන් හෙවත් පර්වතකුහරයන්ගෙන්ද; සොඳුරු, සුන්දරවූ; මනනද, මනොනන්දනය කරන්නාවූ; වනගල, වන ඝටාව; දැක, දර්ශනය කොට; යව, ප්‍රයාණය කරව.

135 හ ස ස ර දැ නා ගනා ස කා ස වසව නේ
ගොස කර ය නා එ නා කොකා සු වගුව නේ
බැ ස ය ර හ නා ව නා සැ කානොවමුව නේ
තොස කර ව නා ම නා දැ කා ය වඑව නේ

අවුල්ජාලයි.

135 මනතොස කරවන, චිත්තසන්තොෂය කරවන්නාවූ; එවනේ, ඒවනයෙහි; හසසර, හංසරුතය; සකසව සවනේ, සකසා ශ්‍රවණයෙහි [කිරීමෙන්;] දැනගන, ජනනය කොට; ගුවනේ, ගගනයෙහි, ගොසකර, නාදකෙරෙමින්; යනඑන, ගමනාගමනය කරන්නාවූ; කොකාසුව, චක්‍රවාකයන් හා කිර පක්ෂීන්; නොහොත් චකපක්ෂීන් හා කිරපක්ෂීන්; මුවනේ, මෘගයන්ට; සැකනොව, ශඞ්කිත නොව; බැස, (භූමියෙහි) අවතීර්ණවැ; වන, අරණ්‍යය; සරහන, භූෂණය කරන්න වුන්; දැක, දර්ශනය කොට; යව, ප්‍රයාණය කරව.

136 පෙර ගිරි පියා ඉඳුසුන් වි සි න්
ගිරිබෙයද ගී තැන තැන ගො සි න්
ලෙලදෙන නොමින් පියපත් ලෙ සි න්
බල වන්කෙහෙල් වන වනගි සි න්

136 පෙර, පූර්වයෙහි; ඉඳු, ඉන්ද්‍රයා විසින්; ගිරිපියා, පර්වතයන්ගේ පක්ෂයන්; සුන්විසින්, ඡේදනයකරනලද හෙයින්; ගිරිබෙයද, පර්වතකටකයන්හි (මෙඛලාවන්හි); ගී, පතිතවූ; තැන තැන, තන්හි තන්හි; ගොසින්, (විකීර්ණවූ) ගොස්; නොමින්, අප්‍රමාණවතුවූ; පියපත්ලෙසින්, ඒ පක්ෂපත්‍රයන්මෙන්; ලෙලදෙන, ලීලාදනය කරන්නාවූ; වනකෙහෙල්වන, වන්‍යකදලීවනයන්; වනගිසින්, වනව්‍යාඝ්‍රයෙන්; බල, අවලොකනය කර.

137 ග න ග න ගුවන් තල විදුලි ව න්
ව න ගැබ මෙවන් පැ න යනෙනු ව න්
දි ගු පු ළු ලු ව න් ගනනිල් නු ව න්
බ ල ව න මු ව න් තුටු කැරු නු ව න්

137 මෙවන්, මෙඝවර්ණවූ හෝ මේ යථොක්තාකාරවූ; වනගැබ, වනගර්භයෙහි (වනාභ්‍යන්තරයෙහි); ගනගන, මෙඝයන් සාන්ද්‍රවූ; ගුවන්තල, ගගනතලයෙහි; විදුලිවන්, විද්‍යුල්ලතාවන් මෙන්; පැනයනෙනුවන්, ලංඝනය කොටමින් ගමනාගමනය කරන්නාවූ; දිගුපුළුලුවන්, දීර්ඝව පෘථුලවූ; ගන නිල්, ඝනනීලවර්ණවූ; නුවන්, නෙත්‍රඇති; වනමුවන්, වන්‍ය මෘගයන්; නුවන් තුටුකැරු, නයනයන් සන්තුෂ්ටකොට; බල, අවලොකනය කර.

138 දිලි පි යු ම රා මිණි පැහැ ස රා
තාමතුඹිනි රා අඹර්ස උ රා
ඉ ඳු ඳු නූ යූ රා නිලඹර අ රා
බල යන ගිරා පෙළ සිත පූ රා

138 දිලි, ජ්වලිතවූ; පියුවරගමිණි, පද්මරාගමාණික්‍යයන්ට බඳු; පැහැසර, ප්‍රභාවෙන් සාරවූ; අඹ, අම්බුඵලයන්; තමතු ඹින්; ස්වකීය චඤ්චුයෙන්; ඉරා, දාරණය කොට; රස, රසය; උරා, චූෂණය කොට; ඉඳුදුනුසුරා, ඉන්ද්‍රචාපාකාරයෙන්; නිලඹර, නීලාම්බරයට; අරා, ආරූඪවැ; යන, ගමනය කරන්නාවූ; ගිරාපෙල, කීරපක්ෂිපඞ්ක්තිය සිත පුරා, චිත්තපූරණය කොට; බල, අවලෝකනය කර.

139 පි හි කු ළු බිඟුදැල් මද පොද හෙ ළා
ගි රි කු ළු ලෙස යන තුරුපෙළ න ළා
ග ජ මු ළු දැක තැන තැන වන ග ළා
ග න කු ළු යයි සිතමින් නොව මු ළා

139 බිඟුදැල්, භෘඞ්ගසමූහයාගෙන්; පිහිකුළු, ප්‍රතිවර්ජ නතාවූ; මදපොද, මදබිඳුන්; හෙළා, පතිතකොට; තුරුපෙ ළ, වෘක්ෂපඞ්ක්තීන්; නළා, මර්දනයකෙරෙමින්; ගිරිකුළුලෙස, (ජඞ්ගමවූ) පර්වතකූටයන්මෙන්; යන, ගමනය කරන්නාවූ; ගජ මුළු, හස්තිසමූහයා; වනගලා, වනෂණ්ඩායෙහි; තැන තැන, තන් හි තන්හි; දැක, දර්ශනයකොට; ගනකුළුයයි, මේඝකූටයහයි; සිතමින්, චින්තනය කෙරෙමින්; මුළා නොව, මූඪ නොව.

140 ග න බො ල් මඩනවරා සියල ගේ
වා ද මූ ල් බිඳ ඇන උල්කර අ ගේ
පි ළි ම ල් වන උනුනට වැද ළ ගේ
බ ල වි ල් තෙර වනමීවුන් ර ගේ

140 විල්තෙර, සරස්තීරයන්හි; සියලගේ, සකලශරීර යෙහි; ගන, සාන්ද්‍රවූ; බොල්මඩ, බහලවූ කර්දමයන්; නවරා, අලිප්තකොට, වදමුල්, ස්තබ්ධ වෘක්ෂමූලයන්; ඇන, හනනය කොට; අගේ, ශෘඞ්ගයන්; උල්කර, තීක්ෂ්ණකොට, ළගේ, සමීපයට; වැද, ප්‍රවිෂ්ටවැ; උනුනට, අන්‍යොන්‍යයන්ට; පිළිමල්වන, ප්‍රතිමල්ල (ප්‍රතිවිරුඬ) වන්නාවූ; වනමීවුන්, වන මහිෂයන්ගේ; රගේ, ආකාරය; බල, අවලෝකනය කර.

141 දී ලෙ න ගිනිසිළු ලෙස ස බා
යෙ නෙ න වනගැබ උනු න ඹා
ව ඩ න දුටු දුටුවන් ලො බා
ව ඩි නා දැක සැවුලන් සු බා

141 සබාගිනිසිළු ලෙස, ප්‍රකෘතිවහ්නිශිඛාවන් මෙන්; දිලෙන, ජ්වලමානවූ; උනුනුන්, අන්‍යොන්‍යයන්; අඹා, පලව මින් හෙවත් ලුහුබඳිමින්; යෙනෙන, ගමනාගමනය කරන්නාවූ; දුටුදුටුවන්, දර්ශනය කළ කළවුන්ගේ; ලොබ, ලොභය; වඩන, වර්ධනය කරන්නාවූ; සුබා, ශොභනවූ; සැවුලන්, කුක්කුටපක්ෂීන්; දැක, දර්ශනය කොට; වඩින, ප්‍රයාණය කරන්න.

142 වි සි ර දිලිහෙන ගඟුලැ ලී
තඹ ර රෙණුවල වනවි ලී
නිතර පලරස තුරු වැ ලී
මිතු ර දැකයව වන ම ලී

142 විසිර, විශීර්ණව; දිලිහෙන, ජ්වලමානවූ; ගඟුලැලී, නිර්ඣරයන්ද; තඹරරෙණ්, තාමරසරේණුවෙන්; අවල, ආකුලවූ; වනවිලී, වනතඩාගයන්ද; නිතරපලරස, නිරන්තර ඵලරසයෙන් යුක්තවූ; තුරුවැලී*, වෘක්ෂලතාවන්ද; වනමලී, වනජකුසුමයන්ද; දැක, දර්ශනය කොට; මිතුර, මිත්‍රය; යව, ගමනය කරව.

143 රැ දි ගු ව න් තල කිරි ව ලා
සු නු ව මි න් හෙළ සිරි සු ලා
ව න හි සි න් මඳ පවන ලා
එ නා ප හ න් ලොදරෙන් බ ලා

143 කිරිවලා, ශ්වේතවලාහක නමැති; සුනුවමින්, සුධාකර්මයෙන්; රැඳි, රජිතවූ; ගුවන්තල, ගගනතලයෙහිවූ; හෙළසිරි, ධවලශ්‍රී හෙවත් ශ්වේතප්‍රභාව; උසුලා, උවහ

* "තුරුබැලී" සමහර.

නය කොට; වනහිසින්, වනමෘගකයෙන්; මදපවනලා, මන්ද මාරුතයෙහිලා; එන, ආගමනය කරන්නාවූ; පහන්, ප්‍රසන්නවූ; ලොදරෙන්, ලොබුරෙණුන්; බලා, අවලොකනය කොට—

144 දි ලි ග ගු ල් හැ ලි ඔ සරි ලා
සැ දි නි ම ල් වන සිරිකා ලා
ඇ දි දු හු ල් ලෙස මනකා ලා
දු කා වි ස ල් සුදු වැලිතා ලා

144 දිලි, ජ්වලිතවූ; ගහුල්හැලි, නිර්ඣරනමැති; ඔසරි ලා; උත්තරීයප්‍රාවරණය කොට; සැදි, සජ්ජිතවූ; නිමල්, නිර්මලවූ, වනසිරිකලා,' වනශ්‍රීනමැති කාන්තාව විසින්; ඇදි, ආච්ඡාදනය කරනලද; දුහුල්ලෙස, දුකූලයක්සේ; මනකලා, මනොඥවූ; විසල්, විශාලවූ; සුදු, ධවලවූ; වැලිතලා, වාලුකාතලය; දුක, දර්ශනය කොට—

✓ 145 තැනා තැ නා සු ව ර ළ ව නා හි ස ගු ව නේ
පැ නා ය නා ගිරි කු ළ බැ ස සැ ව ගි ම නේ
ය නා එ නා මු ව ර ළ පැනා බැ ස එ ව නේ
දූ නා ගෙනා ගිරි දෙළ බැ ස ය ව ග ම නේ

145 වනහිස ගුවනේ, වනමිසනක ගගනයෙහි (ගමන ප්‍රාප්තවූ); සුවරළ, කීරපක්ෂිසමූහයා; බැස. (ආකාශයෙන්) අවතීර්ණව; ගිමනේ සැව, ග්‍රීෂ්මයෙන් පහව; තැන තැන, තන්හි තන්හි; පැනයන, ලංඝනය කෙරෙමින් යන්නාවූ; ගිරිකුළ, පර්වතකූටයද; එවනේ, ඒ අරණ්‍යයෙහි; මුවරළ, මෘගයූථයන්: පැන බැස, පානීයය සඳහා අවතීර්ණව; යන එන, ගමනාගමනය කරන්නාවූ; ගිරිදෙළ, ගිරිනිර්ඣරයද; දූනාගෙන, ජානනය කොටගෙන; බැස, (එහි) අවතීර්ණවැ; ගමනේ යව, ගමනක්‍රියායෙහි යෙදෙව හෙවත් ගමනය කරව.

146 ගි ලූ නෙළුම්බුදලි පළ කා ළ
දි ලූ වලලූහුනු ද ළ ද ළ
සැ ලූ ඉවුරු බිද දෙළ දෙළ
ව ලූ රුගණ දතු පළ ප ළ

146 දළ දළ, දංෂ්ට්‍රාවක්පාසා; ගිලූ, ගිලිහවූ (භක්ෂිතවූ); නෙළුම්බුදූලි, මෘණාලයන් හා; දිලූ, දීප්තිමත්වූ; වලඳහුනූ, වන ලශුනයන්ද; පළකළ, ප්‍රකාශකළාවූ; දෙළදෙළ, දෙළක් පාසා, ඉවුරු, කූලයන්; බිඳ, භග්නකොට; සැලූ, පතිතක ළාවූ; වලුරුගණ, වනශූකර සමූහයා; පළ පළ, තන්හි තන්හි; දකු, දර්ශනය කර.

147 ත ඹු රු ත ළා ඉවුරු හෙ ළා
අ ගි න වු ළා මුල් පෙර ළා
ය න ස හ ළා ගවරර ළා
දකු නොවළා එවනග ළා

147 එවනගළා, ඒ වනෂණ්ඩයෙහි; තඹුරුතළා, තාම්රස තඩාගයන්හි; ඉවුරු, කූලයන්; හෙළා, පතිතකොට; අඟින්, ශෘඞ්ගයෙන්; අවුළා, ආවිඩකොට; මුල්, මූලයන්; පෙරළා පරිවර්තනය කොට; සහළා, සම්ග්‍රව; යන, ගමනය කරන් නාවූ; ගවරරළා, ගවයූථයන්; නොවළා, නොවළහා (නො වරදවා); දකු, දර්ශනය කර.

148 මු වා ක ර න රි වි සේ යා
ඉ වා සි ටි න තු රු සේ යා
නි වා ගි ම න සැ ප යේ යා
ගෙවා එ ව න නොලසේ යා

148 රිවිසේයා, සූර්යාතපය; මුවාකරන, ආවරණය කරන් නාවූ; ඉවාසිටින, උවාව සිටින්නාවූ; තුරු, වෘක්ෂයන්ගේ; සේයා, ඡායාවන්හි; ගිමන, ග්‍රීෂ්මය; නිවා, නිර්වාපණය කොට; නොලසේයා, අනලසව; එවන; ඒ අරණ්‍යය; ගෙවා, අති ක්‍රාන්තකොට; සැපසේ, සැපවූපරිද්දෙන්; යා, ප්‍රයාණය කර.

149 ඇ සෙ සි නියන රැසගී ලිය තු ඩි න් තු ඩි න්
දි සෙ සී බසි න ගවමීරළ කඩි න් කඩි න්
පැයෙසි රුවට කළ කොන්වත් ගොඩින් ම ඩි න්
තොසෙසි එනම දුට ඒ වැබඩින් ව ඩි න්

154 සා ර ප ල ය අඹදඹ රඹද වල් පි ට
මි ර ජ ල ය ඇළදෙළ කඳු පිවින් බ ට
නෑරලොලය වඩවන දුටු දනන් හ ට
කෑර ග ල ය වැජඹෙයි* මේ ලෙසින් සි ට

154 සාරපලය, සාරවූ ඵල ඇති හෙවත් ඵලයෙන් සාරවූ; අඹ, ආම්‍රවෘක්‍ෂයෙන්ද; දඹ, ජම්බුවෘක්‍ෂයෙන්ද; රඹද, රම්භා වෘක්‍ෂයෙන්ද යුක්තවූ; වල්පිට, වන ප්‍රදෙශ ඇත්තාවූ; කඳුපිවින්, පර්වතමස්තකයෙන්; බට, අවතීර්ණවූ; මිරජලය, මධුරජල ඇති; ඇළදෙළ, ශාඛානිර්ඣර ඇත්තාවූ; දුටුදනන්හට, දර්ශනය කළ ජනයන්ගේ; ලොලය, ලෞල්‍යය; නෑර, වර්ජිත නොකොට; වඩවන, වර්ධනය කරවන්නාවූ; කෑර ගලය, එනම් පර්වතාසන්නග්‍රාමය තෙම; මෙලෙසින්, මේ මතු කියන පරිද්දෙන්; සිට, ස්ථිතව; වැජඹෙයි, විජෘම්භ මාණවේ—කෙපරිද්දෙකින්ද යත්:—

155 කු ළි න් කු ළ ම සිහිලඹ වැහෙනා කඳු රැය
දෙළි න් දෙළ ම කල්යල් කරනා කුඹු රැය
ප ළි න් ප ළ ම තල්පොල් ගෙවතු මැඳු රැය
තා ළි න් තා ළ ම පුල් පියුම්පුල පඬෙ රැය

155 කුළින් කුළම, පර්වත කූටයක් පාසාව; සිහිලඹ වැහෙන, සිහිල් දිය වහනය වන්නාවූ; කඳුරැය, කන්‍දර යෝය; දෙළින් දෙළම, ගිරිනිර්ඣරයක් පාසාම; කල්යල්, කාල අකාල දෙක්හි; හෙවත් යලමහ දෙක්හි; කරන, [බීජ වාපනය] කරනු ලබන්නාවූ; කුඹුරුය, ක්‍ෂෙත්‍රයෝය; පළින් පළම, ස්ථානයක් පාසාම; තල්පොල්, තාලනාරිකෙලයෙන් යුක්තවූ; ගෙවතු, ගෘහොද්‍යාන හා; මැඳුරුය, මන්දිරයෝය; තළින් තළම, තඩාගයක් පාසාව; පුල්, පුෂ්පිතවූ; පියුම්, පද්ම හා; උපුල, උත්පල හා; පඬරුය, පුණ්ඩරීකයෝය; (ශ්වෙත පද්මයෝය)—

156 පැ සෙ යි නිබඳ සුවඳැල් කෙත්වත් අව ට
ඇ සෙ යි ළමා වසුපැටියන් හඬ දුර ට
දි සෙ යි වෙහෙර එහි සුරවිමනක් ලෙස ට
ර සෙ යි අමා රසමය ඒ පියස දු ට

---

* "වැජඹෙනු"—"වැජඹෙන"

156 අවට, භාජ්‍යස; කෙත්වත්, ක්ෂෙත්‍රවාස්තූන්හි; නිබඳ, නිරන්තරයෙන්; සුවඳැල්, සුගන්ධ ශාලිය; පැසෙයි, පරිණතවෙයි; ළවාවසුපැටියන්, බාලවත්සතරයන්ගේ; හඬ, නාදය; දුරට, දූරයෙහි; ඇසෙයි, ශ්‍රූයමාන වෙයි; එහි, ඒ ප්‍රදෙශයෙහි; වෙහෙර, (පඤ්චවතී පරිවෙණබද්ධ) විහාරය තෙම; සුරවිමනක් ලෙසට, දිව්‍යවිමානයක් පරිද්දෙන්; දිසෙයි, දෘශ්‍යමාන වෙයි; ඒ පියස, ඒ ප්‍රදෙශය; දුට, දර්ශනය කළකල්හි; අමාරසමය, අමෘතරසමයවූ; රස, (ප්‍රීති) රසයෙක් තෙම; එයි, ආගමනය කෙරෙයි; හෙවත් ආවහනය වේ.

157 නි බ ද පැසි පලලඹ දෙන මිහි ර ඹ ය
සු ව ද විහිද සිවි විලිතුන් කැන් ර ඹ ය
නොමද තැනින් තැන වලුබර වන ර ඹ ය
එ මැ ද වෙහෙර දිලි දුරලන සසර බ ය

157 නිබඳ, නිරන්තරයෙන්; පැසි, පරිණතව; පලලඹ දෙන, ඵලාවලම්බනය කරන්නාවූ; මිහිරඹය, මධුරාම්‍රයෝය; සුවඳවිහිද, සුගන්ධ විසර්ජනය කොට; සිවි, සපිතවූ; විලි තුන්, පරිපක්වවූ; කැන්රඹය; රම්භාමඤ්ජරීහුය; තැනින් තැන, තන්හි තන්හි; වලුබර, ඵලභරිතවූ; නොමඳ, අමන්දවූ; වනරඹය, වනකදලිවෘක්ෂයෝය, එමැද, තන්මධ්‍යයෙහි; සසරබය, සංසාර භීතිය; දුරලන, දූරීභූතකරන්නාවූ; වෙහෙර, [යථොක්ත] විහාරයතෙම; දිලි, ජ්වලිතවූයේය.

158 නො හැ ර සතන් සිත් තිසරණ තිල කුණුය
දෙ සැ ර ඔවුන් පවසන බස් විය කුණුය
නි තො ර නිවත් අය උන්වෙතම රු කුණුය
වෙ හෙ ර පිහිටි එපියස ගෙවි සල කුණුය

158 සතන්, සත්වයන්ගේ; හෙවත් ඒ විහාරගත උපාසක ජනයන්ගේ; සිත්, චිත්තයන්හි; නොහැර, වර්ජිතනො කොට පවත්වන්නාවූ; තිසරණ, ශරණත්‍රය හා; තිලකුණුය, ත්‍රිලක්ෂණ භාවනාවෝය; දෙස් ඇර, දෙෂ වර්ජනය කොට; ඔවුන්, ඒ ජනයන් විසින්; පවසන, ප්‍රකාශකරනු ලබන්නාවූ;

විසකුණුය බස්, විචක්‍ෂණ වචනයෝය; නිතොර, නිරන්තර යෙන්; නිවන් අය, නිධන ජනයෝ; උන් වෙතම; ඒ උපාසක ජනයන් වෙත්හිම; රුකුණුය, රක්‍ෂිතවූවාහුය; වෙහෙර පිහිටි, විහාරය ප්‍රතිෂ්ඨිතවූ; එපියස, ඒ ප්‍රදෙශයාගේ; මේ සලකුණුය, මේ සංලක්‍ෂණයෝය.

159 සැ දැ හැ සි ති න් මල්පුදවත් ගෙන අත ට
ස තර අ ති න් මහදන රුස්වන කල ට
දි නි දු අ ති න් ගිලිහුණු පියුමක් ලෙස ට
සුබමොහොතින් වැද හසරද එවෙහෙර ට

159 සැදැහැසිතින්, ශ්‍රද්ධාචිත්තයෙන්; මල්පුදවත්, පුෂ්පාදි පූජාවස්තූන්; අතට ගෙන, හස්තප්‍රාප්තකොටගෙන; සතර අතින්, චතුර්දිශාවෙන්; මහදන, මහාජනයා; රුස්වනකලට, රාශිභූතවනකල්හි; දිනිදු අතින්, සූර්ය්‍යයාගේ හස්තයෙන්; ගිලිහුණු, ගලිතවූ; පියුමක් ලෙසට, පද්මයක්මෙන්; හසරද, හංසරාජය [පුෂ්පවත්තෙම]; සුබමොහොතින්, ශුභමුහුර්ත්තයෙන්; එවෙහෙරට, ඒ විහාරාභ්‍යන්තරයට; වැද, ප්‍රවිෂ්ටවැ—

160 මි හ ඹ මුව මඬලමෙන් දිලෙන හැම වී ට
දු ල බ ඉසුරු පිරිසැදි ඒ වෙහෙර සි ට
කි ර ඹ පොකුරුමීරස ලැබ බොන ලෙස ට
නර ඹ මිතුර තගෙ නෙතසිත සතුටු කො ට

160 මිතුර. මිත්‍රය; මිහඹ, මහිකාන්තාවගේ; මුවමඬලමෙන්; මුඛමණ්ඩලයමෙන්; හැමවිට, සර්වකාලයෙහි; දිලෙන, ප්‍රජ්වලමානවූ; දුලබ ඉසුරු, දුර්ලභ ඓශ්වර්යයෙන්; පිරි, පූර්ණව; සැදි, සජ්ජිතවූ; ඒ වෙහෙර සිට, ඒ විහාරයෙහි ස්ථිතව; කිරඹ; ක්‍ෂීරජලය හා; පොකුරු මී, පුෂ්කරමධූන්; ලැබ, ලැබව; බොන ලෙසට, පානය කරනපරිද්දෙන්; තගෙ, ශ්‍රීමත්හුගේ; නෙත, නෙත්‍රයන් හා; සිත, චිත්තය; සතුටු කොට, සන්තුෂ්ටකොට; නරඹ, (ඒ විහාරය) අවලොකනය කර.

161 දි මු ත් වෙහෙර වට විසිතුරු මල් වතු ය
එ හි ත් සුවඳ මල් නිති වෙයි මිණි මුතු ය
ම හ ත් තුරු මියුරු පල ගෙන නැමි අතු ය
රුග ත් සෙවණ නොහැරම සිටි පොල්වතු ය

161 දිමුත්, දීප්තිමත්වූ; වෙහෙර අවට, විහාරයාගේ හාත් පසෙහි; විසිතුරු, විචිත්‍රවූ; මල්වතුය, පුෂ්පාරාමයෝය; එහිත්, ඒ පුෂ්පාරාමයන්හිදු; නිති, නිරන්තරයෙන්; සුවඳ මල්, සුගන්ධ පුෂ්ප (සමූහ)ය; මිණිමුතුවෙයි, ප්‍රබුද්ධවෙයි; මියුරු පල, මධුර ඵලයන්; ගෙන, ග්‍රහණයකොට; නැමිඅතුය, අව නතවූ ශාඛා ඇති; මහත්තුරු, මහාවෘක්ෂයෝය; රුගත් සෙවණ, ගෘහිතවූ ඡායාවර්ණය; නොහැරම, වර්ජිතනො කොටම; සිටි, ස්ථිතවූ; පොල්වතුය, නාරිකෙලාරාමයෝය.

162 නොයෙක් තැනම පිපිමල් පිරුණු පො කුණුය
ගෙ ය ක් කනම සැදැහෙන් දෙවන ද කුණුය
සු ද ක් ලෙස තිබෙයි මළුමංහැර කුණුය
සි ය ක් අයකෙරෙති වැඳපුද පැද කුණුය

162 නොයෙක් තැනම, අනෙක ස්ථානයන්හිම; පිපිමල්, පුෂ්පිත කුසුමයෙන්; පිරුණු, පූර්ණවූ; පොකුණුය, පුෂ්කරිණී හුය; ගෙයක්කනම, ගෘහකොණයක් පාසාම; සැදැහෙන්, ශ්‍රද්ධාවිතත්වයෙන්; දෙවන, දානය කරවන්නාවූ; දකුණුය, දක්ෂිණාවෝය; හෙවත් සත්කාරදානයෝය; මළුමං, මාළකාන්ත හා මාර්ගය තෙම; කුණුය, කසවරයන්; හැර, වර්ජිතකොට; සුදක් ලෙස, ධවලාස්තරණයක් මෙන්; තිබෙයි, ස්ථිතවේ; සියක් අය, සියගණන් ජනයෝ; වැඳ, වන්දනයකොට; පුද, පූජනය කොට; පැදකුණුයු කෙරෙති, ප්‍රදක්ෂිණ කෙරෙත්.

163 නු දු රු ව සි හි ලැ ලි ය ග ගු ලැ ලී ය
ව ට සැ දි ම ල් වැ ලි ය සු දු වැ ලී ය
පි පි ව න සි රි ම ලි ය ව න ම ලී ය
තු මු ව න සි ති වි ලි ය පු ල් වි ලී ය

163 දූදුරුව, අවිදූරව [සන්දෘශ්‍යමානවූ]; සිඟිලැලිය, අතිශයින් ශීතලවූ; ගඟුලැලිය, ගිරිනිර්ඣරයෝය; වට, හාස්පස්හි; සැදි, සජ්ජිතවූ; මල්වැලිය, පුෂ්ප ලතාවෝය; සුදු, ධවලවූ; වැලිය, වාලුකා තලයෝය; පිපිවන සිවි; පුෂ්පිත පරිද්දෙන් සජ්ජිතවූ; මලිය, පුෂ්ප ඇති, වනමලිය, වන්‍ය කුසුමවෘක්ෂයෝය; සිතිව්ලිය, චේතනාවන්; තුටුවන, තුෂ්ටකරවන්නාවූ; පුල් විලිය, පුෂ්පිත තඩාගයෝය.

164 පවනද පිපි තුරේය නිරතු රේය
කුසුමන් පෙති තුරේය මළු තු රේය
අවට සුපිපි සරේය බිඟු ස රේය
සිතඑවෙහෙරකො රේය ලොබ කො රේය

164 පවන්, මාරුතය තෙම; අද, අවුත්; නිරතුරේය, නිරන්තරයෙන්, පිපිතුරේය, පුෂ්පිත වෘක්ෂයන්හි; කුසුමන්, පුෂ්පයන් සම්බන්ධවූ; පෙති, පත්‍රයන්; මළුතුරේය, මාළකයාගේ අභ්‍යන්තරයෙහි; අතුරේය, ආස්තරණය කෙරෙයි; අවට, හාස් පස්හි; සුපිපි, සුපුෂ්පිතවූ; සරේය, තඩාගයෙහි හෝ පද්ම යන්හි; බිඟුසරේය, භෘඞ්ගනාදය (වෙයි); (එහෙයින්;) සිත, (දුටුඇසුවන්ගේ) චිත්තය තෙම; එවෙහෙර කෙරේය, ඒ විහා රය කෙරෙහි; ලොබකෙරේය, ලොභකරන්නේය.

165 නොකියා වෙන කතාය බණකතාය
කියත සඟන හිතාය නිතිහිතාය
නොගොසින් ඉවතාය කරවතාය
සිටිනා සත පතාය නිතිපතාය

165 සඟන, භික්ෂූන්; වෙනකතාය; (රාජකථාදි) අන්‍ය කථාවන්; නොකියා, කථනය නොකොට; නිතිහිතාය, නිරන්තර හිතාධ්‍යාශයෙන්; හිතාය, හිතාවහවූ; බණකතාය, ධර්මකථාවන්; කියත, කථනය කරනකල්හි; ඉන්, ඒ ස්ථානයෙන්; ඉවතාය, බැහැරට; නොගොසින්, ගමනය නො කොට; වතායකර, වතාවත්කොට; සිටිනා, සිටියාවූ ජනතෙම; නිති, අනවරතයෙන්; සතපතාය, සත්පථය (ආර්‍ය්‍යමාර්ගය); පතාය, ප්‍රාර්ථනා කෙරේ.

166 කෙ ළ නා බිඟුරුවින් බුදුමතුරු දපමි නා
සි ටි නා තුරු වෙහෙර අතුඅතිනි මල්ගෙන
ය ති නා යත එහිමි බුදුබව ලබන දි නා
සි ටි නා වැනිය පිට දෙන ලෙසට පතමි නා

166 කෙළනා, ක්‍රීඩාය කරන්නාවූ; බිඟු, භෘඞ්ගයන්ගේ; රුවින්, රාවයෙන්; බුදුමතුරු, බුද්ධමන්ත්‍රයන්; දපමිණ, ජල්ප නය කෙරෙමින්; අතුඅතිනි, ශාඛා නමැති හස්තයෙන්; මල්ගෙන, පුෂ්පයන් ග්‍රහණයකොට; වෙහෙර, විහාර භූමි යෙහි; සිටි, සිටිනවූ; නාතුරු, නාගවෘක්ෂයෝ; එ යතිනායක හිමි, ඒ යතීන්ද්‍රාධිනාථයන්වහන්සේ; බුදුබව, බුද්ධත්වය; ලබන දින, ප්‍රතිලාභ කරන්නාවූ දිනයෙහි; පිට දෙනලෙසව, (උන් වහන්සේ විසින්) පෘෂ්ඨදානය කරනු ලබන පරිද්දෙන්; පත මින, ප්‍රාර්ථනය කෙරෙමින්; සිටිනා වැනිය, සිටීය කරන්න වුන් මෙනි.

167 අ සා නිති ඝගන පවසන දහම් කා ද
තොසා වෙමින් එවෙහෙර උන් පරෙවිසො ද
ව සා මුව පියෙන් දූව වළලූ පිට ඉ ද
දෙ සා බලන වැනි උන්නට නරත නා ද

167 සඟන, භික්ෂූන් විසින්; නිති, අනවරතයෙන්; පව සන, ප්‍රකාශකරනුලබන්නාවූ; දහම්කද, ධර්මස්කන්ධයන්; අසා, [ශ්‍රවණයකොට; තොසාවෙමින්, තුෂ්ටවෙමින්; එවෙ හෙර, ඒ විහාරයෙහි; උන්, උපවිෂ්ටවූ; හෙවත් වාසය කරන් නාවූ; සොඳ, සුන්දරවූ; පරෙවි, පාරාපත පක්ෂීන්; දූවවළලූ පිට, සඞ්ඝාටමස්තකයන්හි; ඉඳ, උපවේශනය කොට; මුව, මුඛය; පියෙන්, පක්ෂපත්‍රයෙන්; වසා, ඡාදනය කොට; උන්නු නට, අන්‍යොන්‍යයන් සම්බන්ධව; නදකරන, නාදකරන කල්හි; දෙසා බලන වැනි, (ඒශ්‍රැත ධර්මයන්) කථනය කොට බලන්නවුන් මෙනි.

168 දු වු ස ත සිතට තුටුවන ලෙසට නිතියෙනි
ස ත ර ත එකට සමතර බෙර ඇසක්මෙ නි
පැහැප ත සුදනොහළ වැලි අතුළ මළුතැ නි
මි ගි ක ත සඳනලෙව් දුන් උරමඩල වැ නි

168 දුටුසත, දර්ශනයකළ සත්ත්වයන්ගේ; සිතට, චිත්තයට; නිතියෙනි, නිත්‍යයෙන්; තුටුවන ලෙසට, තුෂ්ටාවහ වන පරිද්දෙන්; සතරත, චතුර්දිශායෙහි [භූමිය]; එකට, එකාකාරයට; බෙර ඇසක්මෙනි, භෙරිතලයක් මෙන්; සමකර, සමතල කොට; පැහැපත, ප්‍රභාප්‍රාප්තවූ; සුද, ධාවල්‍යය; නොගළ, වර්ජිත නොකළාවූ; වැලි, වාලුකායෙන්; අතුළ, ඇස්තරණය කරනලද; මළුතැනි, මාළකාඞ්ගණයතෙම; මිණි කත, මණිකාන්තාවගේ; සඳනලෙව්දුන්, චන්දනාලෙපදානය කළාවූ; හෙවත් ශ්වේතචන්දනයෙන් ආලිප්තවූ; උරමඬල වැනි, වක්ෂඃස්ථලය වැන්න.

169

ස ස ර එ ත ර වන ලෙස වඩනා අදහ ස
නොහැ ර වෙ හෙ ර රැඳි සඟගණගේ සත ස
නි තො ර ස ත ර සිල්කඳ ගෙනසිටිනා ලෙ ස
ස ත ර ප වු ර බබළුයි සිට සතර දෙ ස

169 සසර, සංසාරයෙන්; එතරවන ලෙස, පරතීරස්ථවන පරිද්දෙන්; වඩන, වර්ධනය කරන්නාවූ; අදහස, අධ්‍යාශය; නොහැර, වර්ජිතනොකොට; වෙහෙර, (ඒ) විහාරයෙහි; සතස, සත්කෘතවූ; හෙවත් මනාවූ; රැඳි, නිවාසිත්වයෙන් රඤ්ජිතවූ; සඟගණගේ, යතිසමූහයාගේ; සතර සිල්කඳ; චතුස්සංවර ශීලස්කන්ධයන්; නිතොර, නිරන්තරයෙන්; ගෙන, ග්‍රහණයකොට හෙවත් සුරක්ෂිතකොට; සිටින ලෙස, ස්ථිතිය කරන්නාක්මෙන්; සතරපවුර, [එහි] ප්‍රාකාරචතුෂ්ටය තෙම; සතරදෙස, චතුර්දිශාවන්හි; සිට, ස්ථිතවූ; බබළයි, භ්‍රාජමාන වේ.

තවද, කාංස්‍යමණිනූපුරරාවවිරාජිත හංසරාජොත්තමය මෙද ඒ විහාරයාගේ ආකර්ණනියවූ වර්ණනා විශෙෂයෙකැ, එද තාකර්ණයට ස්වර්ණාලඞ්කාර කර.

අහිකෙකුදු ඇති, කසුතාළමෙහිදු මිණිනූපුරවලායෙහිදු හඬට බඳු නාදයෙන් භ්‍රාජිතවූ උතුම් හංසරාජය මේ (මතු කියනු ලබන්නේ)ද ඒ (පූර්වෝක්ත) විහාරය සම්බන්ධිවූ ඇසිය යුතු වැනුම්වෙසෙසෙක, ඒ වර්ණනාවද තාගේ කනට රන්පළඳනාවක් (වැනි) කර.

170 ස ර ණ වැඳ ගුරුන් නියවා දිනෙ න් දි න
ප ර ණ අලුත් පොත් පෙරළා ප නි න් ප න
ද ර ණ කරන ලෙස ඉදගන වෙනින් වෙන
හෙර ණ සික කියති හෙරණෝ තැනින් තැන

170 ගුරුන්, ආචාර්ය්‍යයන්ගේ; සරණ, චරණයන්; වැඳ, වන්දනයකොට; දිනෙන්දින, ප්‍රතිදිනයෙහි; නියවා, වාචනය කොටගෙන; පරණ, පුරාණවූද; අලුත්, අභිනවවූද; පොත, ග්‍රන්ථයන්; පනින්පන, පර්ණයක් පාසා; පෙරළා, පරිවර්ත්තනයකොට; වෙනින්වෙන, පෘථක් පෘථක් භූතවූ; ඉදගන, උපවිෂ්ටවූ; දරණ කරනලෙස, ධාරණය කරන පරිද්දෙන්; හෙරණෝ, ශ්‍රමණපුත්‍රයෝ; තැනින් තැන, තන්හි තන්හි; හෙරණසික, සාමණේර ශික්ෂාව; කියති, අධ්‍යයනය කෙරෙත්.

171 මෙ න් ස ක කිරඹ පිරිසිදු කැරැ සිල්ගු ණ ය
ඉ න් සැ ක නොවී කරනුව සසර තර ණ ය
නා න් සි ක පද නිබඳ රකිනා ලෙස ප ණ ය
මු න් සි ක* සික වළඳ විමසන සඟග ණ ය

171 සක, (ධෞත) ශඞ්ඛයෙහි (ප්‍රක්ෂිප්තවූ); කිරඹ මෙ(න්), ක්ෂීරජලය මෙන්; සිල්ගුණය, ශීලගුණය; පිරිසිදුකැරැ, පරිශුද්ධ කොට; ඉන්, එය කරණකොටගෙන; සැකනොවී, නිඃශඞ්කිතවූ; සසර තරණය, සංසාර (සාගර)යෙන් එතරවීම; කරනුව, කරනු පිණිස; නිබඳ, නිරන්තරයෙන්; නාන්සිකපද, නානාවිධ ශික්ෂාපදයන්; පණය ලෙස, ප්‍රාණයන් මෙන්; රකිනා, රක්ෂණය කරන්නාවූ; මුන්සික, මූලශික්ෂාව හා; සිකවළඳ, සික්ඛාපද වළඤ්ජනය; විමසන, විමංසනය කරන්නාවූ; සඟගණය, භික්ෂුසමූහයෙක්ද (ඇත්තේය.)

172 එ ස මන් බදුරු මුනි සදහම් පෙළෙහි ඇ ති
ලෙ ස සණ් සඳ සමස් ඇ දැනුමට පැවැ ති
අ ස මින් නෑස ටීකා විනි ස සැක නැ ති
කා ස සින් විරිත සමහරු වනපොත් කෙරෙති

* "මූල්සික"

172 සමහරු, ඇතම් ශිෂ්‍යයෝ; එසමත්බදුරුමුනි, ඒ සමන්තභද්‍ර මුනිඳුගේ; සදහම්පෙලෙහි, සද්ධම්මපාලියෙහි; ඇති ලෙස, විද්‍යමාන පරිද්දෙන්; සත්සදහමස් ඈ, සංඝ සද්ධි සමාසාදිය; දැනුමට, ජනනය පිණිස; පැවැති, ප්‍රවෘත්තවූ; සාස සින් විරිත, සාතත්‍යනවෘත්තිග්‍රන්ථය; නෑසවිකා, නානාස විකාවන්හිවූ; සැක නැති, ශංකාරහිතවූ; විනිස, විනිශ්චය; අසමින්, ශ්‍රවණය කොරෙමින්; වනපොත් කෙරෙති, ප්‍රගුණ කොරෙත්; වාචොද්ගත කෙරෙති යිසේයි.

173 ස ස ර ණ පි වි ස විදිනා දුක් ඉමෙක් නැ ති
තිස ර ණ පිණි ස වඩමින් තම සිතෙයි බැ ති
දෙසර ණ සි ර ස කැරු වැඳ ගුරුවරන් නි ති
නිස බ ණ වි නි ස සමහර සඟගණ අස ති

173 සසරණ, සංසාරනමැති අර්ණවයට; පිවිස, ප්‍රවිෂ්ටවැ; විදිනා, විඳනයකරණු ලබන්නාවූ; දුක්, දුඃඛයාගේ; ඉමෙක්, (අද්‍යන්ත) සීමාවෙක්; නැති, නැත්තේයයි කියා; තිසරණ පිණිස, ශරණත්‍රය සඳහා; තම සිතෙහි, ස්වකීය චිත්තයෙහි; බැති වඩමින්, භක්තිවර්ධනය කෙරෙමින්; ගුරුවරන්, ආචාර්‍ය්‍ය වරයන්ගේ; දෙසරණ, චරණයුගලය; සිරසකැරු, මස්තක යෙහි තබාගෙන, වැඳ, වන්දනයකොට; සමහර සඟගණ, ඇතම් භික්ෂුසමූහයෝ තුමූ; නිති, නිරන්තරයෙන්; නිසබණ, නිඃශ්‍රය ධර්මයන්ගේ; විනිස, විනිශ්චය; අසති, ශ්‍රවණය හෝ ප්‍රවර්ජනය කෙරෙත්.

174 ප සි දු නො යෙ ක් වතපිළිවෙතැ තිරසර හු
මු නි ඳු ස සු න් වැඩ වැඩුමට වැරසැර හු
පු බු දු නැ ණි න් තෙර පදවියට විතර හු
පු රු දු කෙ රෙ ති තෙර බණ එහි සමහර හු

174 එහි, ඒ විහාරයෙහි; පසිදු, [විනයෙහි] ප්‍රසිද්ධවූ; නොයෙක් වතපිළිවෙතැ, අනෙක ව්‍රතප්‍රතිවෘත්තයෙහි; තිරසරහු, ස්ථිරසාරවූ; මුනිඳුසසුන්, මුනීන්‍ද්‍රශාසනයාගේ; වැඩ වැඩුමට, වෘද්ධිවර්ධනයට; වැරසැරහු, වීරසාරවූ; පුබුදු නැණින්, ප්‍රබොධවූ ඥානයෙන්; තෙරපදවියට, ස්ථවිරපදයට; විතරහු, ප්‍රමාණවූ; සමහරහු, ඇතම් (භික්ෂූ)හු; තෙරබණ, ස්ථවිරවාදයට සුදුසු ධර්මයන්; පුරුදුකෙරෙති, පරිචිත කෙරෙත්.

175 සොඳුරු පොරණ ඇඳුරෙල්* නොහැර පිවිතුරු
වි දු රු නැණින් පිරිසිඳ දුරුර මොහඳු රු
මි යු රු බසින් සැකහැර දෙසන විසිතු රු
ගැඹු රු විජම් පෙළරුත් අසති සමහ රු

175 සොඳුරු, සුන්දරවූ; පොරණ, පුරාණවූ; පිවිතුරු, පවිත්‍රවූ; ඇඳුරෙල්, ආචාර්‍ය්‍යාවය; නොහැර, වර්ජනය නොකොට; විදුරු නැණින්, වජ්‍රයට බඳු ඥානයෙන්; මොහඳුරු, මොහාන්ධකාරය; දුරුර, දූරීභූතකොට; මියුරුබසින්, මධුරවචනයෙන්; සැකහැර, ශඞ්කාපහරණය කොට; දෙසන, දෙශනාකරනුලබන්නාවූ; විසිතුරු, විචිත්‍රවූ; ගැඹුරු, ගම්භීරවූ; විජම්පෙළරුත්, අභිධම්මපාලිය හා අර්ථයන්; සමහරු, ඇතම් භික්ෂූහු; අසති, ශ්‍රවණය කෙරෙත්.

176

ම ඳ ක් ඇසුව සිදුවන සගමොක් කැමැ ති
නොයෙක් රගින් මොක් සිදුනොකොට නොනැවති
උ ඳ ක් දෙසැට මිසදිටු මුල්සිඳ පැවැ ති
අ යෙ ක් සුතුරු පෙළදම් පදරුත් අස ති

176 මඳක්, ස්වල්ප මාත්‍රයක්; ඇසුව, ශ්‍රවණය කළහොත්; කැමැති, ඊප්සිතවූ; සගමොක්, ස්වර්ගමොක්ෂ සම්පත්; සිදුවන, සිඬවන්නාවූ; නොයෙක් රගින්, අනෙකාකාරයෙන්; මොක් මොක්ෂසුඛය; සිදුනොකොට, සිඬනොකොට; නොනැවති, නිවෘත්ත නොවන්නාවූ; උඳක්, හුදකලාවම; දෙසැට මිස දිටු, ද්වාෂෂ්ටිමිථ්‍යාදෘෂ්ටීන්ගේ; මුල්, මූලයන්; සිඳ, ප්‍රච්ඡින්න කොට; පැවැති, ප්‍රවෘත්තවූ; සුතුරු පෙළදම්, සූත්‍රපිටක පාලි ධම්මයාගේ, පදරුත්, පදාර්ථයන්; අයෙක්, ඇතම් භික්ෂූහු; අසති, ශ්‍රවණය කෙරෙත්.

177 පැ ව ති සියල් ටීකා ගැටපද දැ ක ය
වි ම ති නොවි මඳකුත් එකද තැන ක ය
කැමැ ති ලෙසින් පවසන හැර සිත සැ ක ය
අ ස ති නොයෙක් සගගණ විනය පිට ක ය

* ''ඇඳුරෙර්''

177 පැවති, ප්‍රවෘත්තවූ; (විද්‍යමානවූ); සියල් ටීකා ගැටපද, සකල ටීකා ග්‍රන්ථපද ව්‍යාඛ්‍යානයන්; දැනය, දර්ශනයකොට; එකද තැනකය, එකස්ථානයෙක්හිදු; මදකුත්, ලේශමාත්‍ර යකුත්; විමතිනොවී, විවිධමතියකින් යුක්තනොව; සිත, චිත්තයෙහිවූ; සැකය, ශඞ්කාවන්; හැර, වර්ජිතකොට; කැමැති ලෙසින්, අභිමත පරිද්දෙන්, පවසත, ප්‍රකාශකරණු ලබන්නාවූ; විනයපිටකය, විනයපිටක දෙශනාව; නොයෙක් සඟගණ, අනෙක භික්ෂුසමූහයෝ; අසති, ශ්‍රවණය කෙරෙත්.

178 ම ද කු ත් පවර පෙරදුරු උවදෙස් නොහැ ර
දැ න ග ත් ගැඹුරු පද පදරුත් නියමක ර
පැ ණ ව ත් පසිදු පඬිවර ඉද වෙහෙර තු ර
ප ව ස ත් නොයෙක් තකු වියරණ සදලකර

178 පවර, ප්‍රවරවූ; පෙරදුරු, පූර්වාචාර්යයන්ගේ; උව දෙස්, උපදෙශයන්; මදකුත්, ලේශයකුත්; නොහැර, වර් ජිත නොකොට; ගැඹුරු, ගම්භීරවූ; පද පදරුත්, මූලපද යන් හා තත්පදාර්ථයන්; නියමකර, නිශ්චයකොට; දැනගත්, ජානනය කළාවූ; පැණවත්, ප්‍රාඥවූ; පසිදු, ප්‍රසිද්ධවූ; පඬිවර, පණ්ඩිතවරයෝ; වෙහෙරතුර, විහාරාභ්‍යන්තරයෙහි; ඉඳ, උපවෙශනයකොට; නොයෙක්, අනෙකවිධවූ; තකුවියරණ සදලකර, තර්කව්‍යාකරණච්ඡන්දොලඞ්කාරශාස්ත්‍රයන්; පවසත්, ප්‍රකාශ කෙරෙත්.

179 අ සේ ස දෙස පරසිදු පොරණ පඬිව ර
වි සේ ස යෙන් පැවසූ නොයෙක මනහ ර
දෙසේ දුරලම්හි * සඳවියරණ ලක ර
ඇ සේ කියන විසිතුරු කාවිනළු සත ර

179 අසේසදෙස, සකලදෙශයන්හි; පරසිදු, ප්‍රසිද්ධවූ; පොරණ පඬිවර, පුරාණ පණ්ඩිතවරයන් විසින්; විසේසයෙන්, අසාමාන්‍යයෙන්; හෙවත් ෂඩ්භාෂාපරමෙශ්වරමහාකවීන්ට මුත් සෙස්සවුන්ට අසාධාරණවශයෙන්; මනහර, මනොහරවූ; නොයෙක, අනෙකවිධ ව්‍යක්තානතයෙන්; පැවසූ, ප්‍රකාශිතවූ;

* "දුරලන්බ"

සදවියරණලකර, ඡන්දොවිචිතකරණාලඞ්කාර ශාස්ත්‍රවිධියෙන්; දෙසෙස්, (අක්ෂරපදවාක්‍යගත) දෙෂයන්; දුරලමිනි, දුරීභූත කෙරෙමින්; කියන, [ඒ විහාරයේ පණ්ඩිතයන්විසින්] කථනය කරනු ලබන්නාවූ; විසිතුරු, විචිත්‍රවූ; කව්නළු සතර, කාව්‍යනාටක ශාස්ත්‍රය; ඇසේ, ශ්‍රූයමාණ වේ.

180

නුදුටු නොඇසූ නාම* —එහි මහිම හැම මෙලෙසේ
අසා දැක සැක හැර–අනුරපුර මහවෙහෙර දුටුමෙන්

180 එහි, ඒ (පඨමවතීපරිවෙණ) විහාරයෙහි; නුදුටු, (තොප විසින් පෙර) දර්ශනය නොකළාවූ; නම නොඇසූ, නාම මාත්‍රයකුදු ශ්‍රවණය නොකළාවූ; හැම මහිම, සකලමහිමයන්; මෙලෙසේ, මේ උක්තප්‍රකාරයෙන්; අසා, ශ්‍රවණය කොට; අනුරපුර මහවෙහෙර, අනුරාධපුර මහාවිහාරය; දුටුමෙන්, දර්ශනය කළාක්මෙන්; දැක, දර්ශනය කොට; සැක හැර, ශඞ්කා වර්ජනය කොට—

181

ද ද යු ත් ග ත් පවනින් ලෙලදෙන අ ඹ ර
පැහැප ත් කොත් කිරණින් දුරුකළ අ දු ර
දැකනෙත් සි ත් තුටු කෙරෙමින් මුනි මැ දු ර
කු ස ල ත් ප ත් කර තර සසර සමු දු ර

181 පවනින්, මාරුතයෙන්; ගත්, ගෘහීතවූ; අඹර, ආකාශයෙහි; ලෙලදෙන, ලීලාදානය කරන්නාවූ; දද, ධ්වජ (සමූහ)යෙන්; යුත්. යුක්තවූ; පැහැපත්, ප්‍රභාවත්වූ; කොත්, ශෘඞ්ගයන්ගේ; කිරණින්, රශ්මියෙන්; දුරුකළ අඳුර, දුරීභූතකරනලද අන්ධකාර ඇති; මුනිමැදුර, ජිනමන්දිරය; දැක දර්ශනය කොට: නෙත්සිත්, නෙත්‍රයන් හා චිත්තය; තුටුකෙරෙමින්, තුෂ්ටකෙරෙමින්; සසරසමුදුර, සංසාරසාගරයට; තර, උත්පාදක්බඳුවූ; කුසල්, කුශලධර්මය; අත්පත්කර, හස්තප්‍රාප්ත කර.

* "තම"

182 උ දු රුදු කාදවෙලෙප් සුරසිඳුසේම සු දු
මු දු දළු නිල්කොළින් විදුගන තුලෙක බ දු
බු දු සුදු විසින් පුදකළ බැවින් පරසි දු
ච දු සිත තොසින් මුනිඳුන් පිටදුන් දුම් දු

182 සුරසිඳුසේම, ක්ෂීරෝදධිය මෙන්ම; සුදු, ධවලවර්ණවූ; උදු, ඍජුවූ; රුදු, මහත්වූ; කාදවෙලෙප්, ස්කන්ධප්‍රදේශඇති; මුදුදළු, මෘදුවූ අංකුරයන් හා; නිල්කොළින්; නීලවර්ණ පත්‍රයන් කරණකොටගෙන; විදුගනතුලෙක බඳු, විද්‍යුත් සහිත මේඝකූටයක් හා සමානවූ; බුදුසුදු විසින්, සම්‍යක්සම්බුද්ධයන්ද විසින්; පුදකළ බැවින්, (අනිමිෂලෝචන පූජාවෙන්) පූජනය කරනලද බැවින්; පරසිදු, [ජගත්හි] ප්‍රසිද්ධවූ; මුනිඳුන්, මුනීන්ද්‍රයන් විසින්; පිටදුන්, පෘෂ්ඨදානය කරනලද; දුම්දු, (බෝධි)ද්‍රැමේන්ද්‍රයා; සිතතොසින්, චිත්තසන්තෝෂයෙන්; චඳු, වන්දනය කර.

183 වත්තල වෙහෙර වැඩැ-වැඩළුන් වනවාසයෙහි

නා ග සේන මහතෙරිඳුන්ට මුනුබු රු
බෝ ග ණිසුරු අළසෙන්ගමු හුනන්හ රු*

ඔහුවෙත උන් උතුම්—අළගක්කෝණර සඳ

බැ දු† අත්තනායක මැති සඳු න් ගේ
ර දු ගොවුරු පිහුම වුවන්‡ ලදු න් ගේ

ශ්‍රී මි ව නා සිඟානා සුදසුන් මහලේ නා
වැජඹෙ නා ලමැණිකුලයෙන් සිරිලැබ යෙහෙ නා
සි සි ව නා ලොවැ යසස් පරසිඳු කුලෙන් එ නා
නි සි ව නා ඔහුට මුනුබුරුවනා මනානද නා

183 වත්තල වෙහෙර, වත්තල නම් ග්‍රාමයෙහිවූ (විජය බාහු) විහාරය; වැඩැ, වර්ධනය කොට; වනවාසයෙහි, අරණ්‍යසේනාසනයෙහි; වැඩළුන්, විහරණය කළාවූ; නාගසේන-මහතෙරිඳුන්ට, නාගසේනාභිධාන මහාස්ථවිරස්වාමින්ට;

* "මිගත්තරු" † "වැදූ" ‡ "එදූ සොඳුරු පරමළවුන්"

මුහුබුරු, නපතෘවූ; බෝගණිසුරු, බොධිපාලක ජනසමූහයා හට ඊශ්වරවූ; අළුසෙන්ගමු හුනත්නරු, අළුසෙන්ගමු හුනත්නරුනම් (යම්ක්ෂත්‍රියොත්තමයෙක්විද); ඔහු, ඕහට; වෙහැළුන්, (බන්ධුවයෙන්) සම්පසුවූ; උතුම් අළගක්කෝණරසඳ, උභයමවූ අළගක්කෝණර නාමය හා; බැඳු, සබඳවූ, අත්තනායක මැතිසඳුන්ගේ, අධිනායකාඛ්‍ය මන්ත්‍රීන්‍ද්‍රයාණන්ගේ; හෙවත් අධිනායක අළගක්කෝණර පාදයන්ගේ; සොවුරු, සහොදර (බුහුනැණි)වූ; පියුමවූවන්, පතිව්‍රතානම්වූ; රදලදුන්ගේ, රාජදුහිතෘ කාන්තාවන්ගේ; හිමිවන, ස්වාමිවූ; සිහානා සුදසුන් මහලේන, අසිග්‍රාහක සුදර්ශනාභිධාන [යම්] මහාලෙඛක (මන්ත්‍රීන්‍ද්‍රයෙක් ඇද්ද); ලමැණිකුලයෙන්, ලම්බකර්ණ වංශයෙන් (පැමිණියාවූ,) සිරිලැබ, ඓශ්වර්‍ය්‍යසම්පත් ලදින්; යෙහෙන, සැපතෙස්; වැජඹෙන, විජෘම්භමාණවූ; ලොවැ, ලොකයෙහි; සිසිවන, චන්ද්‍රයාමෙන්; පරසිඳු, ප්‍රසිද්ධවූ; යසස්, කිර්ති ඇති; කුලෙන්, (අසම්භින්න) අන්වයෙන්; එන, පැවත එන්නාවූ; ඔහුම, ඒ මන්ත්‍රීන්ද්‍රයාහටද; මනනඳන, මනොනන්දනය කරන්නාවූ; මුහුබුරුවන, නපතෘවූ—

184 දුල් සියපත් පතුල්—නිරිඳුන් මුදුන් මල්කළ

භුවණින් සියල් විදු දනාහට මුදුන් වන
තිලිනෙන් සුරබි සුරතුරු රඟ* අඳුන් වන

නිවරද පාමා බස--ඇමටම කළ අමාරස

බවූවා ලෙස්න් අවූවා ඇදුරතු දෙවන
සිවූවා යසස් තුවූවා පෙළරුත් දෙසනා

පසිඳු වනරත්නා ගිරිමෙන් මුළු ලොවට
මුරුඳු වනරත්නා රුවමෙන් දිලිරුවට
මැතිඳු වනරත්නා දිවිලඳ මුනිරදුට
නාමඳු වනරත්නා මාහිමි හිමිසඳුට

184 දුල්, දීප්තිමත්වූ; පතුල් සියපත්, පාදපද්මයන්; නිරිඳුන්, නරෙන්ද්‍රයන්ට; මුදුන් මල්කළ, මූර්ධමාල්‍ය වැනි කළාවූ;

* "සුරතුරුඹිණි"

ශ්‍රවණීන්, ඥානය කරණකොටගෙන; සියල්විද්‍යදනහට, සකල විවර්ජනයාහට; මුද්‍රන්වන, මස්තකයෙහි සිටිනාවූ; තිලිංගනත්, ත්‍රභගය කරණකොටගෙන; සුරබි සුරතුරු රඟ, සුරගිටෙ ශ්‍රුවගේ හා සුරද්‍රැවයාගේ ආකාරය; හඳුන්වනා, සජානනය කරවන්නාවූ; නිවරද, නිරවද්‍යවූ; තමා බස, ස්වකීය වචනය; ඇමටම, (ශ්‍රවණය කරන) සියලූදෙනාහටම; අමාරස කල, අමෘතානක්සේ රසවත් කළාවූ; දෙවන, (අර්ථකථාචාර්‍ය බුධඝොෂමාහිමියන්කෙරෙන්) විතියවූ; අටුවා ඇදුරකු, අර්‍ථකථාචාර්‍යයකු; බටුවාලෙසින්, අවතීර්ණවූවාක්මෙන්; යසස්, (ස්වකීය) කිත්තිය; සිටුවා, (චිරස්ථායිකොට) පිහිටුවා; තුවුවා, තුණුව නොහොත් තුණුවහ කොට; පෙළරුත්, ත්‍රිපිටක පාලි අර්ථයන්; දෙසන, දෙශනා කරන්නාවූ—බුළලොවට, සකල ලොකයාහට; රත්න ගිරිමෙන්, මෙරුපර්වතය මෙන්; පසිදු වන, ප්‍රසිඩවූ; රුවට, මනාකොට; දිලි, ජ්වලිතවූ; රත්න රුව මෙන්, ස්වර්ණරූපයක් මෙන්, මුරුදුවන, මෘදුවූ [ප්‍රකෘති ඇති]; රත්නදිව්, උත්තමවීපවූ ශ්‍රීලඞ්කාවීපය; ලද, ප්‍රතිලාභ කළාවූ; මුනිරදුට, මුනිරාජයාහට; මෑතිදුවන, (ස්වකීය ශාසනාලූශාසක) මන්ත්‍රිඥයකු බඳුවූ; වනරත්නමාහිමි හිමිසඳුට, වනරතන සඞ්ඝරාජස්වාමීන්ද්‍රයාණන්ට; නමඳු, නමස්කාර කර.

තවද—ලඞ්කාරසම්පූර්ණද සම්විවර්ණ ක්ෂත්‍රිය රත්නායමාන වනරතනසඞ්ඝරාජොත්තමයාගේ මෙද එක් වර්ණකථනයෙක. එද තා කර්ණ පර්‍යාලඞ්කාර කර.

අනේකකුදු ඇති—ලක්දිව්රැකිමෙහි චතුරවූ බුඩි ඇති රාජොත්තමයකු වැනිවූ වනරතන සඞ්ඝරාජස්වාමීන්ගේ මේ කියනුලබන්නේද එක් ගුණවැනිමෙක. එයද තාගේ කන් පෙතුට ආභරණයක් කර ගෙවත් කන්පලඳනාවත් කර.

185 සි ශු මි අරුත් ටිකා පොත් කළ බුහු ටි
උ තු මි පොරණ ඇදුරන්ගේ රඟින් සි ටි
කි ය මි කෙසේ ඔහු ගුණ නුවණ නොකිලි ටි
වි ජ මී පෙළ අරුත් අතැඹුල ලෙසින් දි ටී

185 සියුම් අරුත්, සූක්ෂ්මාර්ථවත්වූ; විනා පොත්, විනය ග්‍රන්ථයන්; කල, රචනා කළාවූ; බුහුටි, ප්‍රතිභාන්විතවූ; උතුම්, උත්තමවූ; පොරාණ ඇදුරන්ගේ, පුරාතනාචාර්යයන්ගේ; රසින්, ආකාරයෙන්; සිවි, සිතවූ; ඔහු, උන්වහන්සේගේ; නොකිලිටි, අකිලිෂ්ටවූ; ගුවණ ගුණ, (ඇතිනාක්) ඥාන ගුණය; කෙසේ, කවර පරිද්දෙකින්; කියම්, කථනය කෙරෙම්ද; එතෙකුදුවුවත් ලේශමාත්‍රයක් කථනය කෙරෙව් සීසේයි; (ඒ සඞ්ඝරාජෝත්තමව යෙව;) විජම් පෙළ, අභිධර්ම පාලිය සම්බන්ධවූ; අරුත්, අර්ථසමූහය; අතැඹුලලෙසින් හස්තාමලකයක් සේ; දිවි, දර්ශනය කෙළේය.

186

වෙසෙසින් සුතුරු අබිදම් ගංවැද සත තා
පිරෙමින් පැතිර සිටිනා නොදැක වෙරළ තා
සැදිනන් නයවිනය සමුදුර ගැඹර ඇ තා
ඔහුමින් තිමිංගලමින් නොකෙළිතැන් නැ තා

186 වෙසෙසින්, විශේෂයෙන්; සුතුරු අබිදම්ගං, සූත්‍රාභිධර්ම නමැති නදීන්; සතත, නිරන්තරයෙන්; වැද, ප්‍රවේශවැ; පිරෙමින්, පූරිතවෙමින්; වෙරළත. වෙලාන්තයක්; නොදැක, දර්ශනය නොකොට, පැතිර සිටිනා, ව්‍යාප්තවැ පවත්නාවූ· නන්නය, නානානයින්; සැදි, සජ්ජිතවූ; ගැඹර ඇත, ගාම්භීර්යයෙන් යුක්තවූ; විනයසමුදුර, විනයපිටක නමැති සමුද්‍රයෙහි; ඔහු, ඒ සඞ්ඝරාජෝත්තමයාගේ; මින්, ඥාන නමැති; තිමිංගලමින්, තිමිඞ්ගලමහාමත්ස්‍යයා; නොකෙළි තැන්, ක්‍රීඩනය නොකළ ස්ථානයෙක්; නැත, අවිද්‍යමානයි.

187 අයතු නැත එසම නොතාකුන් දෙ රටකය
දිනතු තියම දැන් ඔහු සිටිනා පිටකය
ඉතිහු හැඹුරු පදරුත් සුතුරු පිටකය
දැනෙතු ලොවට එයතිඳු දෙයන විටකය

187 එසම කෙනෙකුන්, උන්වහන්සේ හා සමාන තැනැත්තක්හු සම්බන්ධවූ; අසනු, ශ්‍රැතියක්; දෙරටකය, රාජ්‍යවයෙක්හි; නැත, අවිද්‍යමානය; දැන්, වර්තමානකාලයෙහි;

ඔහු සිටින, උන්වහන්සේ ස්තුතිය කරන්නාවූ; පිටකය, පැස හෙවත් මානභාජනය; දිනනු, (භාරතීකාරයෙන්) ජයග්‍රහණය කිරීම; නියම, නියතය; ඉතිනු, (මේ) මෙසේමැ නු; ගැඹුරු පදරුත්, ගම්භීරපදාර්ථ ඇති; සුතුරු පිටකය, සූත්‍ර පිටකය; ලොවට, ලෝකයාහට; දැනෙනු, (සුවසේ) අවබොධ වීම; එයතිඳු, ඒයතීන්ද්‍රයා; දෙසන විටකය, දෙශනාකරන කලෙක්හිය.

188 විසඹ* ස ර ණ සසුනඹරට රිවි ම ඬ ල
ස නා අස ර ණ ගිම් නිවුමට සඳ ම ඬ ල
නැණලූසර ණ ඔහු තෙපලට හිමි ම ඬ ල
හැ ම වි ය ර ණ ඔහු නැණකෙළි කෙළි ම ඬ ල

188 විසඹ, වාග්වනිතාවට; සරණ, පිහිටාවූ හෙවත් ස්වාමිවූ [මෙතෙම]; සසුන්, (තථාගතශාසන) ශාසන නමැති; අඹරට, ආකාශයට; රිවිමඬල, සූර්‍යමණ්ඩලය වැන්න, සනා, සත්වයන්ගේ; අසරණ, අනාථතා නමැති; ගිම්, සන්තාපයාගේ; නිවුමට, නිර්වාපණයට; සඳමඬල, චන්ද්‍රමණ්ඩලය වැන්න; නැණලූසරණ, ඥානාලොකයට පිහිටාවූ (උන්වහන්සේ;) තෙපලට හිමිමඬල, වාක්පතිමණ්ඩලය [බෘහස්පතිහු] වැන්න; හැමවියරණ, සියලු ව්‍යාකරණ (සමූහ)ය; ඔහු, උන් වහන්සේගේ; නැණකෙළි, ඥානක්‍රීඩාවට; කෙළිමඬල, ක්‍රීඩා මණ්ඩලයක් වැන්න.

189

කි ම ඔ හුය ස වෙන වෙන අප කියනු දැ නි
ඇතිතතුලෙස සව් සතරම දත් බැවි නි
සු ර ගු රුම් සනොකෙරෙයි කෙනතුන් දෙවැ නි
එ ය ති ඳු බ ස ඇඳලකරන උපන් තැ නි

189 ඔහු, ඒ සංඝරාජෝත්තමයාගේ; යස, කීර්තිය; දැනි, මේ කාලයෙහි; අප, අපමතුන්විසින්; වෙන වෙන, වෙන් වෙන් වශයෙන්; කියනු, කථනය කිරීම; කිම, කිමයිද; ඇති තතුලෙස, යථාභූතතත්වාකාරයෙන් [තත්වූ පරිද්දෙන්];

* "විශඹ—බිසව—බිසඹ—වීයඹ" යි පොත්හි නානාවිධයි.

සව්සතරම, සකල ශාස්ත්‍රයන්ම; දත්බැවිනි, ජනනය කළ බැවින්; සුරගුරු මිස, බෘහස්පතිහු හැර (අනිකකු); දෙවැනි කෙනකුන්, (තමහට) විතීයවූවක්හු; නොකෙරෙයි, නොකරන්නේ වෙයි; එයතිඳු, ඒයතීන්ද්‍රයාගේ; බස, භාෂිතය; සඳලකරන, ඡන්දෝලඞ්කාර ශාස්ත්‍රයන්ට; උපන්තැනි, ජන්ම භූමිය වේ.

190 ඈ ස ට පෙනෙන මිස දිව ඉසිවර කෙනෙ කි
බ ස ට ඔහුගෙ ලොව නැත සරිවන රසෙ කි
දෙසැ ට දිටුම විමසා නුවණින් නිසැ කි
ද ස ට පොරණ ඔහු වරදැයි හළ දෙයෙ කි

190 ඈසට, චක්ෂුසට; පෙනෙනමිස, දෘශ්‍යමානවත් මුත්; දිවඉසිවර කෙනෙකි, දිව්‍යර්ෂිවරකෙනෙක; ඔහුගෙ, උන්වහන්සේගේ; බසට, වචනයට; සරිවන, සමානවන්නාවූ; රසෙකි, (මධුර) රසවත් දෙයෙක්; ලොව, ලොකයෙහි; නැත, අවිද්‍යමානය; දෙසැටදිටුම, (ශාශ්වතවාදාදි) වාශෂ්ටි දෘෂ්ටීන්ම; නුවණින්, ඥානයෙන්; විමසා, විමංසනය කොට; නිසැකි, නිඃශඞ්කිතවූයේය; දසටපොරණ, (බ්‍රාහ්ම පාද්ම වෛෂ්ණවාදි) අෂ්ටාදශවිධ පුරාණ ශාස්ත්‍රය; ඔහු, උන්වහන්සේ විසින්; වරදැයි, සාවද්‍යයයි; හළදෙයෙකි, වර්ජනය කරන ලද්දකි.

191 කා ලා සැට සතරකී ඉසිවරන් ගු රු
නො ලා දොසක් සඳලකරින් කැරු සොඳු රු
ග ලා රසෙයි පැවසූ කව්නළු ගැඹු රු
බ ලා පලාපයෙකැයි නොකෙළේය ග රු

191 කලාසැටසතර, (ඉතිහාසාගමාදීන්ද ගීතවාද්‍යාදීන්ද කියනලද) චතුඃෂෂ්ටිකලාසංඛ්‍යාතවිද්‍යාවන්; කී, කථනය කළාවූ; ගුරු, ආචාර්යවූ; ඉසිවරන්, (භරතාදි) ඍෂිවරයන් විසින්; දොසක්, දොෂයක්; නොලා, ප්‍රක්ෂෙප නොකොට; සඳලකරින්, ඡන්දොලඞ්කාරවිධියෙන්; සොඳුරුකැරු, සුන්දරකොට; රසෙයි, (ශෘඞ්ගාරාදි) රසයෙහි; ගලා, නිමග්න කොට; පැවසූ, ප්‍රකාශකරනලද; කව්නළු, කාව්‍යනාටකශාස්ත්‍රය; බලා, අවලොකනය කොට; පලාපයෙකැයි, ප්‍රලාපයෙකැයි කියා; ගරු නොකෙළේය, ගෞරව නොකෙළේය.

192 ම හ ත් අ නු ර පුර ඇදුරන් ඇර පොර ණ
බ ල ත් අ ත ර කවරෙක මෙවිතර දෙර ණ
දි ග ත් ස ත ර විතරණ ඔහුගෙ යස ගු ණ
නා ක ත් ස ත ර අතරක නොතිබිය නැ ණ

192 අනුරපුර, අනුරාධපුර මහාවිහාරයෙහි (විසූ); මහත්, උතුම්වූ; පොරණ ඇදුරන් ඇර, (කාශ්‍යප් මුගලන් ආදි) පුරාතනාචාර්‍ය්‍යයන් මිස; අතර, (අනුරාධපුර ජයවර්ධනපුර රාජධානීන්ගේ) අන්තරයෙහි; හෙවත් මේ අතර කාලයෙහි; බලත්, පරීක්ෂණය කරත්හොත්; දෙරණ, පෘථිවීතලයෙහි; මෙවිතර, මෙසා (ආචාර්‍ය්‍යවරයෙක්), කවරෙක, කතරයෙක්ද; ඔහුගෙ, උන්වහන්සේගේ; යසගුණ, යශොගුණයනම; දිගත් සතරවිතරණ, දිගන්තචතුෂ්ටය ප්‍රමාණකොට ඇත්තේය; නැණ (උන්වහන්සේගේ) ඥානය; නකත්සතර, ජ්‍යොතිශ්ශාස්ත්‍රය සම්බන්ධවූ; අතරක, අන්තරයෙක්හි; නොතිබිය, නොනැවැත්විය; නිමාව දක්වා පැවැත්විය යුතේයි

193 වි සි තු රු ගහගණිතින් නොකිවත් සතට
පි වි තු රු ඔහු තෙපලම මූල්වෙයි වැඩ ට
කි වි ගු රු වර පැවසූ නිති සතර ට
ත ම ගු රු බව දැන්විය දූන් නරලොව ට

193 විසිතුරු, විචිත්‍රවූ; ගහගණිතින්, ග්‍රහගණිතයෙන්; නොකිවත්, නොකියනලද්දේ නමුත්; සතට, සත්වයන්හට; ඔහු, උන්වහන්සේගේ; පිවිතුරු, පවිත්‍රවූ; තෙපලම, භාෂිතයම; වැඩට, වෘද්ධිය පිණිස; මූල්වෙයි, කාරණ වෙයි; කිවිගුරුවර, ශුක්‍රය බෘහස්පතිය යන සෘෂිවරයන් විසින්; පැවසූ, ප්‍රකාශිතවූ; නිති සතරට, නීතිශාස්ත්‍රයට; දූන්, වර්තමානයෙහි; තමගුරුබව; තමන්වහන්සේගේ ආචාර්‍ය්‍යභාවය; නරලොවට, මනුෂ්‍යලොකයහට; දූන්විය, ඥාපනය කෙළේය.

194 ඇ සු ව ලබයි සුර ඇදුරන්ගෙනුත් තු ති
මෙලොව කෙනෙක් ඒවරදැයි නොකියහෙති
ඇ ති ව දිවැස් කීඹස් මෙන් පිළිනති ති
මෙලොව අදිකරණ ඔහු ඇතිනොකැයි යෙති

194 ඇසූව, *(උන්වහන්සේගේ වචනයන්)* ශ්‍රවණය කළ හොත්; සුර ඇදුරන්ගෙයුත්, *(ඒ ශ්‍රවණයකළාවූ)* සුරචාය්‍යී යන්ගෙන්ද; තුති, ස්තුතිය; ලබයි, ප්‍රතිලාභ කෙරෙයි; මෙලොව කෙණෙක්, මේ ලෝකයෙහි (පණ්ඩිතජන) කෙනෙක්; ඒ, එය; වරදැයි, විරොධයයි හෙවත් සාවද්‍යයයි; නොකියහෙති, කථනය කළ නොහෙත්; දිවැස් ඇතිව, දිව්‍ය චක්ෂුස ඇතිව; කී, කථිතවූ; බස් මෙන්, භාෂිතයන් මෙන්; පිළිගනිති, ප්‍රතිග්‍රහණය කෙරෙත්; මෙලොව, මේලොක යෙහි; අදිසරණ, අධිකරණවිනිශ්චය; ඔහු ඇතිනෙකැයි; උන්වහන්සේ විද්‍යමානවනහාක්යයි; යෙති, (තජ්ඥයෝ) කථනය කෙරෙත්.

195

ගෙලසට සුතන් හිත අහිතන් දකින* උදු
රජ ගුරු තැන් ලැබ පුද තැන් තෙර නමුදු
පෙරමහතැන් නොමදුටු තැන් කර පුරුදු
හැමවිදු තැන් දැන හැම තැන් විය පසිදු

195 හිත අහිතන්, *(තමන්කෙරෙහි)* හිතවූවන් හා අහිතවූවන්; සුතන් ලෙස, පුත්‍රයන් ලෙසින්; උදු, ඍජුව; දකින, [ප්‍රියචක්ෂුසින්] දර්ශනය කරන්නාවූ *(උන්වහන්සේ)*; රජගුරුතැන්, රාජගුරුස්ථානයද; තෙරනමුදු, *(මහාස්වාමි පදලබ්ධ)* ස්ථවිරනාමයද යන; පුදතැන්, පූජ්‍යවූ තන තුරු; ලැබ, ලබාවැ; පෙරමහතැන්, පුරාතන මහාත්මයන් විසින්; නොමදුටුතැන්, දර්ශනය නොකළාවූම (ගම්භීර) ස්ථාන යන්, පුරුදුකර, පරිචය කොට; හැමවිදුතැන්, සකල (චතුර්දිශ) විද්‍යාස්ථානයන්; දැන, ඥානය කොට; හැමතැන්, සකලස්ථානයන්හි; පසිදු විය, ප්‍රසිද්ධවූසේක්ය.

196 විරුදු නාමුදු කියවූ තැන යන දෙවෙනි
මෙබ දුය තිදු උතුමෙක් විය සත පිනි
එ සීදු මෙ සිදු නොකියා බණ දෙසනුයෙනි
මෙ සිදු මිහිදු මාහිමියන් පැමිණි වැනි

---

* "රකින"

196 දෙවෙනි, (තවත්ව) විත්‍යාවූයෙක්; නැත ශත, අවිද්‍යමානයයි උවණමානවූ; විරුද්‍ධනමුද්‍ර, (ගද්‍යපද්‍යමයරාජ ස්තුති සඩබන්ධ) විරුදනාමයවූද්‍ර; කියාවූ, (කවින් ලවා) කථනය කරවූ; ගෙවත් කවීන් විසින් වර්‍ණිතවූ; මෙබඳු, ඊතාදෘශවූ; යතිඳු උත්තමෙක්, යතීන්‍ද්‍රොත්තමයෙක්; සතපිනිනි, සත්‍වයන්ගේ පුණ්‍යය හෙතුකොටගෙන; විය, (ප්‍රාදුර්භූත) වූයේය; එයිදු මෙසිදු, (භූධාරුඪවූ) එපද මෙපද; නොකියා, කථනය නොකොට; බණ දෙසනුයෙනි, (පෙළ අටුවාකී ආපරිද්දෙන්ම) ධර්‍මදෙශනය හෙතුකොටගෙන; මෙසිඳු, මේ[ යතීන්‍ද්‍ර]තෙමේද; මිහිඳුවාහිමියන්, මහෙන්‍ද්‍රමහාස්වාමීන්; පැමිණිවැනි, [යළිත්] සම්ප්‍රාප්තවූවාක්මෙනි; නොහොත්-පැමිණි, (ලඞ්කාවීපප්‍රසාදය පිණිස) ප්‍රාප්තවූ; මිහිඳුමාහිමියන් වැනි, මහෙන්‍ද්‍රමහාස්වාමීන් වැන්නේය.

197

ප ත් සතත හු මෙත් සිතැ ත හු කි ත් කොත හු
දෙ ත් සම ත හු ල ත් සැ ප ත හු ය ත් සි ත හු
ග ත් සම ත හු ස ත් සි රි ත හු සෙ ත් ප ත හු
න ත් සතත හු මු ත් කෙවත හු වනත් ඔ හු

197 සතතහු, අනවරතයෙන්; පත්, ප්‍රාප්තවූ හෝ උපන්නී තවූ; මෙත්සිතැතහු, මෛත්‍රීසහගත චිත්තඇති; කිත්කොතහු, කීර්‍තියම කෙතුකොට ඇති; ලත්සැපතහු, ප්‍රතිලබ්ධවූ සම්පත්තිය; දෙත්, දානය කිරීමෙහි; සමතහු, සමර්ථවූ; සත්සිතහු, ශොභනවූ චිත්ත ඇති; ගත්, ශ්‍රද්ධාවිෂයෙහි (ශාස්ත්‍රධර්‍මයන්හි); සමතහු, සමර්ථවූ; සත්සිරිතහු, සාධුචරිත ඇති; සෙත්පතහු, ශාන්තියට මාර්ගයක්වැනිවූ; ඔහු, උන් වහන්සේ; වනත්, වර්‍ණනා කරත්හොත්; නත්සතතහු මුත්, අනන්තයා හා චතුර්මුඛයා මිස; කෙ, කතර (කවිජන) කෙනෙක්; වතහු, සමර්ථ (වෙත්)ද?

198 අණසක පතල නිති—කෙළසුවහසක් සක්වළ

රුවන් පන්තියෙහි* ගුණකළ වෙසෙස්කොට
රුවන් සූතුරු පිරුවා සියදහස් වි ට

නොහැර කීකරු කැරැ—හැමසුරවරන් තමහට

ස ත ත ලොවට සෙතදෙන ජී යතිරදු ට
නැ ව ත නැමද මෙලෙසින් සැලකරව සි ට

ම හ ත් තෙදැති පුල්වන් සුරිඳු මුල්කො ට
දි මු ත් සමන් බොක්සල් සුරිඳු නෙත්කො ට
ස ව ත් සුරිඳු විබිසණ ඇසුරන් හ ට
පි රි ත් කියා පින්දී සිත සතුටුකො ට

198 නිති, නිරන්තරයෙන්; කෙළසුවහසක්සක්වළ, කොටිශතසහස්‍රචක්‍රවාලයන්හි; අණසක, ආඥාචක්‍රය; පතළ, ව්‍යාප්තවූ; රුවන්පන්තියෙහි, පචත්‍රිංශත්පරිමිත රත්නභාව යන්හි; ගුණ, ප්‍රණීතබුද්ධගුණය; වෙසෙස්කොට, විශේෂ කොට; කළ, (ප්‍රකාශ) කළාවූ; රුවන්සූතුරු, රත්නසූත්‍රය; † සියදහස්විට, ශතසහස්‍රවාරයෙක්හි; පිරුවා, පරිවර්තනය කොට; හෙවත් සජ්ඣායනය කොට; නොහැර, (එක්දෙවිය කුදු) වර්ජිතනොකොට; හැමසුරවරන්, සියලු සුරේන්ද්‍රයන්; තමහට, තමන්වහන්සේට; කීකරු කැරැ, විධෙය කොට; හෙවත් සුවචකොටගෙන; සතත, නිරන්තරයෙන්; ලොවට, ලොකයාහට; සෙතදෙන, ශාන්තිදානය කරන්නාවූ; ජීයතිරදුට, යථොක්ත යතිරාජයන්වහන්සේට; නැමද, නමස්කාරකොට; නැවත, අනන්තරවැ; සිට, (පාර්ශ්ව යෙක්හි) ස්ථිතවැ; මෙලෙසින්, මේ වක්‍ෂ්‍යමාණපරිද්දෙන්; සැලකරව, ආරොචනය කරව.

---

* "පන්තියෙහි"

† මෙහි රත්නසූත්‍ර 6 වෙනි ගාථාවෙහි 12 ක්ද, 9 වැන්නෙහි 3 ක්ද, 10 වැන්නෙහි 3 ක්ද, 13 වැන්නෙහි 9 ක්ද සෙස්සෙහි එකක් එකක්ද බැගින් පන්තිස්වැදෑරුම් රත්නභාවය සලකනලදැයි දතයුතු.

මහත්තෙදුති, මහාතේජසිවූ; උපුල්වන්සුරිඳු, උත්පල වර්ණසුරේන්ද්‍රයා; මුල්කොට, ප්‍රධානකොට; දිමුත්, දීප්තිමත්වූ; සමන්බොක්සල්සුරිඳුන්, සමන්තකූටාධිපති සුමනසුරේන්ද්‍ර යන්; එක්කොට එකීකෘත කොට; සචිත්සුරිඳු, ෂණ්මුඛ සුරේන්ද්‍රය; විබිසණු, විභීෂණසුරේන්ද්‍රය යනාදිවූ; සුරන්හට, දෙව්රදුන්ට; පිරිත් කියා, පරිත්‍රාණදේශනාකොට; පින්දී, පුණ්‍යදානය කොට; සිත, චිත්තය; සතුටුකොට, සන්තුෂ්ටකොට-

199 පවර සිරිසඟබෝ—සිරිපැරකුම් නිරිඳු වෙත

දිගුණුකර තුදුණු සිත යොදමින් දිවැ ස
පමුණුවමින් සුබ සිරි සෙත ඇම දව ස

සතුරු වියවුල් හැම—අතුරුදන් කර උවදුරු

ප හ න් සිතින් මුනිඳුට පුදකර නිබ ද
දෙ ප න් සියක් අවුරුදු රජ ඉසුරු වි ද

ප ව ති න මෙන් සලසා මේ සිරිලක ට
හැ ම තැ න අණ පවතිනුකොට එක රඟ ට
ඇ ම දෙ න* සිට රකිනා ලෙස නියම කො ට
අ ය දි න ලෙස සැලකර ඒ යතිරදු ට

139 පවර, ප්‍රවරවූ; සිරිසඟබෝ සිරිපැරකුම්, ශ්‍රීසංඝ-බොධි ශ්‍රීපරාක්‍රමනම්වූ; නිරිඳුවෙත, නරේන්ද්‍රයාකෙරෙහි; තුදුණුසිත, කරුණාචිත්තය; දිගුණුකර, ද්විගුණකොට; දිවැස, දිව්‍යචක්ෂුස, යොදමින්, යොමුකෙරෙමින්; ඇමදවස, සකල දිනයන්හි; සුබ, ශොභනවූ; සිරිසෙත, ශ්‍රීසෞභාග්‍ය; පමුණු වමින්, ප්‍රාපිතකෙරෙමින්; සතුරු, ශත්‍රූන්ගෙන් (වන් නාවූ); හැමවියවුල්, සකලව්‍යාකූලයන්ද; උවදුරු, (අවශෙෂ) උපද්‍රවයන්ද; අතුරුදන්කර, අන්තර්ධානකොට; පහන්සිතින්, ප්‍රසන්නචිත්තයෙන්; නිබද, නිරන්තරයෙන්; මුනිඳුට, මුනීන්ද්‍ර යාහට; පුදකර, පූජනයකෙරෙමින්; දෙපන්සියක් අවුරුදු, වර්ෂසහස්‍රයක් මුළුල්ලෙහි; රජඉසුරු, රාජෛශ්වර්ය්‍යය; විද,

* "ඇමදින"

විජෘතය කෙරෙමින්; පවතිනමෙන්, (අනුෂ්‍රී) ප්‍රවර්තනය කරනසේ: සලසා, සම්පාදිතකොට; හැමතැන, (ලක්දිව) සකලස්ථානයෙහි; එකරගව, එකාකාරයෙන්; අණ, (ඒ නරෙන්ද්‍රයාගේ) ආඥාව; පවතිනුකොට, ප්‍රවර්තනය වන්නක් කොට; ඇමදෙන, සියලු සුරෙන්ද්‍රයන්; සිට, (සමීපස්ථව) සිටි මින්; රකිනා ලෙස, සංරක්ෂණය කරනසේ; නියමකොට, අව ධාරිතකොට; අයදිනලෙස, ආයාචනාකරනපරිද්දෙන්; ඒ යතිරදුව, ඒ (වනරතනාභිධාන) සංඝරාජයන්වහන්සේට; සැලකර, ආරාධනය කර.

200 මෙ යු තු හසුන් ගොස් දක්වමින ඇති  ර ග
    දි මු තු යසස් පෙන්වා ලොව තරග  ර ග
    එ මු තු කලඹවන් හසමිතුර මන  ර ග
    ප ව තු යෙහෙන් සියනෑ සියොතුන් ස ම ග

200 මුතුකලඹවන්, මුක්තාකලාපයක් බඳුවූ; හසමිතුර, මිත්‍රවූ හංසරාජය; ගොස්, (වණරතනමහාස්වාමින් වෙත) ගමනයකොට; යුතු, යොග්‍යවූ; මෙහසුන්, මේ සන්දෙශය; ඇතිරග, තත්වූපරිද්දෙන්; දක්වමින, ප්‍රකාශකෙරෙමින්; ලොව, ලොකයෙහි; තරගරග, (ස්වර්ණදී) තරඞ්ගාකාරවූ: දිමුතු, දීප්තිමත්වූ; යසස්, කීර්තිය; පෙන්වා, දර්ශනය කරවා; සියනෑ, ස්වකීයඥාතිවූ; සියොතුන්, සමග, පක්ෂීන් හා සමග්‍රවූ; මනරග, මනොඥකූලපරිද්දෙන්; යෙහෙන්, සුවසේ; පවතු, ප්‍රවෘත්ත වෙහිවා.

201 සි නි දු ගැඹරපදරුත් සමග පදර  ස
    සු සැ දු ලකළ කිවිලකරෙක්කොට සක  ස
    ප සි දු වනරත්න යතිඳුට දෙවන ලෙ  ස
    මෙ බ දු නමින් සැලසී තිසරසන්දෙ  ස

201 සිනිදු, ස්නිග්ධවූ හෙවත් සුශ්ලිෂ්ටවූ; ගැඹර පදරුත් සමග, ගම්භිරපදාර්ථයන් හා සමග්‍රවූ; පදරස, පදමාධූර්‍යයෙන්; සුසෑදු, සුසජ්ජවූ; කිවිලකර, කාව්‍යාලඞ්කාරයන් හා; එක් කොට, එකීභූතකොට; සකස. මනාකොට; ලකළ, අලඞ්කෘත

කළාවූ; නමින්, නාමයෙන්; තිසරසන්දෙස, හංසසන්දෙශ නම්වූ; මෙබඳු, මේ උක්තප්‍රකාර (දූතකාව්‍යය); පසිඳු, ප්‍රසිද්ධවූ; වනරතනයතිඳුව, වනරතනසඞ්ඝරාජයන්වහන්සේට; දෙවන ලෙස, ප්‍රදානය කරවනපරිද්දෙන්; සැලසී, ශ්‍රවනාකෙළේයි.

සිරිසුගත් මුනිඳු—පිරිනිවිවසින් දෙදහස්
සාරසිය පන්සාලිස්—වූ බිනර පුණ්‍යපොහොදින

කෑගල සගරජ—වෙහෙර අදිපති මෙසදෙසී
විදුලකරපිරුවත්හිමි—දහම්කිත් සිරිදම්රම්

සිරිලක අවරදිග—අනුදිග දෙදෙසැ යතිපති
මෙසදෙස අරුත්වියකත—යොළෙ දුහුනන් සඳහා.

හංස සන්දෙශ පදාර්ථව්‍යාඛ්‍යානය
**නිමි.**

KOLLUPITIYA PERSS, COLOMBO.